2026 සැප්තැම්බර් මස 01 වන දින පෙරවරු 9.30 ට
මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

සහභාගීත්වය:-

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
26.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
27.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
28.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන්ත සිල්වා මහතා
29.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
30.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
31.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සජිත් දුමින්ද පීරිස් මහතා
32.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
33.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
34.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
35.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
36.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
37.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසීනා බක්කර් මහත්මිය
38.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
39.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
40.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා

41.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
42.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
43.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
44.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
45.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
46.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
47.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය
48.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
49.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
50.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.එල්. තිලිනි නෙත්සරණි මෙනවිය
51.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.09.01 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

2026.08.04 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම පසුගිය සභාවේ සඳහන් කරන්නේ කටුබැද්ද ප්‍රදේශයේ නිවාස ව්‍යාපෘතියක් යනවා බැටිරි වත්තේ එහි එක්සත් ජාතික පක්ෂයේ ජනක කියන සංවිධායකවරයෙක් ඉන්නවා කියලා මේකේ සඳහන් වෙලා තියෙනවා එහෙම සංවිධායකවරයෙක් එම ව්‍යාපෘතියේ නැහැ, මෙහි සඳහන් වෙන්න ඕන ඒ ව්‍යාපෘතිය යන නිසා දන්දෙණිය වත්තේ නිවාස කිහිපයක් ඉරි ගිහිල්ලා හානි වෙලා තියෙනවා කියලා. එය නිවැරදි විය යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.08.04 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව සංශෝධනට යටත්ව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.08.04 මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-</u>

02(1) <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත පුදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/09/01 දිනැති මාසික මහා සභා රැස්වීමට සහභාගී විමට නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා විසින් 2026/08/31 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ අද දින සභා රැස්වීමට සහභාගී නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(2) **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, රජය මඟින් 2026 වර්ෂය සඳහා "පුනරුදයේ පුරවර" තේමාව යටතේ ප්‍රකාශිත පළාත් පාලන සතිය වැඩසටහන මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ ද ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, එහි සමාරම්භක උත්සවය හා ජංගම සේවා වැඩසටහන 2026.09.14 දින කටුබැද්ද ද සොයිසා ක්‍රීඩාංගනයේ පැවැත්වීමට නියමිත බැවින්, ඒ සඳහා සහභාගී වන ලෙස පළාත් පාලන සතියේ වැඩසටහන් සඳහා ඔබගේ දායකත්වය හා සහභාගීත්වට ලබා දෙන ලෙසත් කාරුණිකව දන්වමි.

03. සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

03(01) **මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා**

ගරු නගරාධිපතිතුමනී, කඩලාන දේවස්ථානය ඉදිරිපිට තිබෙනවා අඩි 03ක පාරක් එම පාර පුළුල්කර දෙන ලෙස ඒ පාරේ නිවැසියන් විසින් ඉල්ලා සිටිනවා. එහි යාබඳව තිබෙන්නේ ෆැමිලි මාට් කියලා ෂොප් එකක් ඒ අයගෙත් විරුද්ධත්වයක් නැහැ ඉතින් එක නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් අවදානය යොමු කරලා අවශ්‍ය කරටයුතු සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(02) **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. නැවත මතක් කිරීමක් එගොඩ උයන දකුණ මෝදර බස් සේවාව 142ක තවමත් ස්ථාපිත කරලා නැහැ. ඒ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරනවා. ඉල්ලා සිටිනවා පාසල් සේවයත් ඒ සමඟම ක්‍රියාත්මක කරන්න කියලා.

03(03) **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනී, වෙරළ විවේක උද්‍යානය ඉතාමත් ලස්සනට හදලා තිබුණා. අපි සතුටු වුනා නමුත් දැන් එතන තත්ත්වය දැක්කම හරි කණගාටුයි. මම දන්නේ නැහැ නගර සභාවෙන්ද කියලා මේ ස්ථානය නඩත්තු කරන්නේ, නැතිනම් වෙරළ සංරක්ෂණයෙන්ද, නැතිනම් ක්ලීනින් ශ්‍රී ලංකා කියන එන්වයමන්ට් ඩිපාට්මන්ට් එකෙන්ද කියලා. නමුත් අපි එකෙන් ප්‍රයෝජනය ගන්න ඕන. මෙච්චර වියදමක් කරලා හදලා මෙහෙම වෙන එක ගැන අපිට කණගාටුයි. එතන තියෙන බෙන්ච් තැන තැන ගිහින් දාලා හරිම කැතයි මෙච්චර වියදම් කරපු තැන සම්බන්ධයෙන් ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(04) **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තමයි කාටවත් නැති අවස්ථාවක් මොරටු ආසනයට තියෙනවා. රේල්වේ ස්ටේෂන් 5ක් තියෙනවා. වෙරළ තීරය ගත්තම රේල්වේ ට්‍රැක් දෙපැත්තෙම කුණු විසික්කරලා කුණු කඳු ගණන් තියෙනවා. කොච්චර අවලස්සනද මිනිස්සු කිදෙනෙක් මේ මොරටුව පහුකරගෙන යනවද, මේ මොරටුව ආසනය පිරිසිදුව තබා ගැනීමට ඉක්මනින් පියවර ගන්න විශේෂයෙන් මේ රේල් පාර දිගට විසික් කරන කුණු සම්බන්ධයෙන් ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(05) <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ජූලි මාසයේ පැවතිච්ච මහා සභාවෙදී මම ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ ඉදිරිපත් කරා සුබාසිරි මාවතේ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් ඔවුන්ගේ කාණුව සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස නමුත් ඒ කර්තව්‍ය තවමත් ඉෂ්ඨ වෙලා නැහැ සහ අබන් එලිෆන්ට් ආයතනය ලඟ තියෙන පාර පිලිසකර කරලා දෙන්න කියන ඉල්ලීමටත් ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(06) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, 0713330087 මේ දුරකථන අංකය සභාවෙන් මුදල් ගෙවන ඔබතුමාගේ අංකය නේද. අපි මේ දුරකථන අංකයට කොච්චර කෝල් ගත්තත් ඔබතුමා මේ දුරකථනය අන්සර් කරන්නේ නැහැ. ජනතාවගේ ප්‍රශ්නයක් කතා කරන්න අපි කෝල් ගන්නවා. ඔබතුමා මෙතන ලේකම්වරු තියාගෙන ඉන්නවා එත් වැඩක් නැහැ අපේ මිස්කෝල් එකකට නැවත අපිට කෝල් එකක් ලැබෙන්නේ නැහැ. අපි මොකක් හරි හදිස්සි පණිවිඩයක් කියන්න ඔබතුමාට කතා කරන්නේ ඔබතුමා එකට සාවදානව සවන් දෙන්නේ නැහැ. ඒ ගැන මම කණගාටු වෙනවා. ඔබතුමාට අන්සර් කරන්න බැරි වුනානම් ලේකම්වරයෙක් ලවා හරි කතා කරේ ඇයි කියලා අහන්න හරි ඔබතුමා පක්ෂපාති වුනේ නැහැ. ඔබතුමා වෙන අය ගත්තහම ඔබතුමා අන්සර් කරනවා, කතා කරනවා, වැඩ කරලා දෙනවලු හැබැයි අපිටනම් වැඩක් වෙන්නේ නැහැ. එත් හැමෝම කියන්නේ අපි ඔබතුමාට කඩේ යනවා කියලා. මේ ගැන ඉතාම කණගාටුයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කරපු කාරණාව ඒ ආකාරයෙන් පිළිගන්නේ නැහැ. ඔබට යම් අවස්ථාවක එහෙම වෙන්න ඇති නමුත් පොදුවේ ගත්තහම හැම මන්ත්‍රීවරයාටම ඒ වේලාවේ ගන්න බැරි වුනත් නැවත හරි කතා කරලා ඇති. ඔබතුමාට එවැනි හිත් රිදවීමක් වුනානම් සමාවෙන්න.

03(07) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ මහජන පෙත්සමක් ලැබී තියෙනවා. දන්දෙණියවත්ත 551 බෞද්ධාලෝක මාවත පිලිසකර කර දෙන ලෙස ඉල්ලලා. මම එම ලිපිය සභාගත කරනවා.

03(08) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ පළමුව ස්තුතියක් කරන්න ඕන. මම මේ සභාවට ආවට පස්සේ මම කිවුවා අපේ කොට්ඨාශයේ සියළුම පාරවල් හදලා ඉවරයි. එක පාරක් ඉතිරි වුනා ඒ නිසා ඉල්ලීමක් කරා කර්මාන්ත කමිටුවේදීත් චොට්සන් පීරිස් මාවත හදලා දෙන්න කියලා. අපේ තුසිත් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා එම කාර්ය කරලා තියෙනවා. පාරේ මම දැක්කා ලයින්ස් ගහලා තියෙනවා. අවුරුදු හතරේ තුසිත් මන්ත්‍රීතුමත් මොකක් හරි වැඩකත් කරන්න ඕනනේ. ඒ නිසා වැඩක් කරලා තියෙනවා. අපිත් එක කොට්ඨාශයේ ඉන්නේ ඉතින් වැඩක් කරද්දි අපිවත් දැනුවත් කරානම් හොඳයි කියලා හිතනවා.

03(09) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඩෙංගු වසංගතයත් එක්ක අපිට දුරකථන ඇමතුම් එනවා දුමායනය කරන්න කියලා. මම දැක්කා සීපීඑච්අයි මහත්තයා කමිටුවටත් දාලා තිබුණා දුමායන මැෂින් දෙකක් ගන්න. මම හිතනවා ඒක ඉක්මන් කරානම් හොඳයි කියලා. මොකද එක කැඩිච්ච මැෂින් එකකින් අපිට මුළු මොරටුවම ආවරණය කරන්න බැහැ. එම නිසා මේ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(10) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පසුගිය දිනයන්වල හැම තැනම කුණු තිබුණා. සුදේශ් මන්ත්‍රීතුමා බයිසිකලේ ගිහිල්ලා හැම තැනටම කුණු දාන එවා බලලා දැන් වැඩේ හරියට කෙරීගෙන යනවා. ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. නමුත් අර රාත්‍රී සේවය මොරටුව ටවුන් එකේ එක තවම කෙරුනේ නැහැ. ඔබතුමා ඇ 9ට 10ට හරි මෑන් පවර් සේවකයින් හරි යොදවලා ඇ සුද්ධ කරොත් උදේ පාන්දර 4 ඉඳන් කොච්චියට, බස් වලට එන මිනිස්සුන්ට ගොඩක් හොඳ වෙයි. මොකද උදේට කුණු ගොඩක් බවට පත් වෙනවා මොරටුව ටවුන් එක. මිනිස්සු මුත්‍රා කරනවා තැන තැන. පොලීසිය හරි දැනුවත් කරලා මේ සඳහත් යම් වැඩ පිලිවෙළක් කරන්න කියලා ඉල්ලනවා. එතන පොදු වැසිකිළියක් තියෙනවා එතනට යොමු කරන්න කියලා ඉල්ලනවා. බස් ඩ්‍රයිවර්ලා, කොන්දොස්තරලා මුත්‍රා කරලා බෝතල් විසික් කරන්නෙත් පේමන්ට් එකටමයි. ඉතින් මේ සම්න්ධයෙන් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(11) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපේ මේ වෙනකොට මොරටුව මහා නගර සභාවේ වරිපනම් සහ වෙළඳ බල පත්‍ර ක්‍රියාවලිය ඉතාමත් හොඳින් යන අතරවාරයෙදී මම හිතන්නේ මේකට අතරමැදි හැකර්ස්ලා ටිකක් සම්බන්ධ වෙලා තියෙන බව තමයි පෙනෙන්නට තියෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ ගරු අවධානය යොමු කරනවා මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් කරලා එහෙම කොල්ල කල්ලියක් ඉන්නවනම් එ ගැන සොයා බලා කටයුතු කරන්න කියලා. පසුගිය දිනයක විශේෂඥ වෛද්‍ය සුජීවා මළලසේකර මහත්මියගේ දුරකථනයට කතා කරලා ඔබට වරිපනම් සහ වෙළඳ බලපත්‍ර ගාස්තුවක් තියෙනවා. අපි හෙට වෙනකොට ආදායම් දෙපාර්තමේන්තුවත් සමඟ එනවා ඒ නිසා අදම සල්ලි දාන්න ඊෂි කැෂ් මාර්ගයෙන් කියලා දුරකථන ඇමතුමක් ඇවිත් තිබුනා ඇය කියන විදිහට ඒ ඇමතුම ලැබිලා තිබුණේ 0761388019 කියන දුරකථන අංකයෙන්. පසුව මමත් එකට කතා කරලා බැලුවට පස්සේ ඔහු මට පැහැදිලි පිළිතුරක් ලබා දුන්නේ නැහැ. එම නිසා යම් විදිහකින් මොරටුව නගර සභාව සතු ඒ වෙළඳ බලපත්‍ර වරිපනම් කටයුත්ත හොඳින් යන අතරවාරයේදී යම් විදිහකින් අතරමැදි කොල්ලකල්ලියක් හෝ හැකර්ස්ලා ටිකක් මේ මොරටුව නගර සභාව හැක් කරන්න හදනවනම් එකට අපි ක්‍රියාමාර්ග ගතයුතුයි. මේ සඳහා පරීක්ෂණයක් පවත්වලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(12) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමති අපේ වෙට්ටදාරීතුමා එහෙම නැත්නම් අපේ ඉන්න ආරච්චි මහත්මයා මේ නගර සභාවට තියෙන සෙන්කෝලය ගෙනාවම හරි ආඩම්බරයක්. ඒ ගෞරවය ගේන අතරතුර ඔබතුමාට යොමු කරලා ඔහු හොඳින් වැඩ කරනවා විශිෂ්ට සේවයක යෙදෙනවා. ඔබතුමත් ඒ සේවය පිළිබඳ හොඳ පැහැදීමකින් ඉන්න බව අපි දන්නවා. ඒ පැහැදීමත් එක්කම විවිධ පැතිකඩ ඔස්සේ යම් තීරණයක් ගන්න ඇති කියලා මම විශ්වාස කරනවා සැලසුම් අංශයේ ක්‍රියාකාරිත්වය හොඳින් කරන්න. ඒක එක පැත්තක් අනිත් පැත්තෙන් ගත්තම අපේ ආරච්චි කියලා කියන්නේ මේ සභාවේ ඉන්න පරිපාලකවරුන්ගේ ප්‍රධානියා. කොළඹ නගර සභාවේ ඔහුට වෙනම නිල නිවාසයකුත් තියෙනවා. එම නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා සත්භාවයෙන් මෙහි කාර්යක්ෂමතාවය සමඟ යන්න ඇති ඒ වගේම මම දැක්කා සීඕසී එකට එම්බෝස් සීල් එකත් එතුමාගේ භාරයේ තියෙන්නේ. හරි පැහැදිලි බොහෝම විනිවිදයි. ඒ නිසා පුළුවන් කමක් තියෙනවනම් එතනට සේවය සඳහා යම් සුවිශේෂී පුද්ගලයෙක්ව දාලා එතුමාගේ ගෞරවය රැකෙන විදිහට ඔබතුමා ලඟම අනුයුක්ත කරගත්තොත්

වටිනවා. අනිත් එක බොහෝ දෙනෙක් කියන්න පටන් අරන් තියෙනවා සභාව දවසට සෙන්කෝලේ අරන්යන ආරච්චි අනිත් දවස් වලට සැලසුම් අංශයේ බෝලේ වගේ කැරකෙනවා කියලා. එම නිසා අපේ අරච්චි මහත්මයාගේ ගෞරවය ආරක්ෂා කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සතියෙන් ඒක සිද්ධ වෙනවා.

03(13) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මා කලින් ජීවත් වෙච්ච ස්වභාදහම් මාවත දැන් අබල දුබල වෙලා තියෙනවා. මම ඉන්නකොටනම් පොඩ්ඩක් හැදුවා. අපේ නිවැසියන් කිහිපදෙනෙක් මතක් කරා එගොඩ උයන ස්වභාදහම් මාවතේ ඉදිරි කොටස යන්න අමාරු තත්ත්වයක තියෙනවා කියලා. එය සකස් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද පාරවල් කාපට් කරපු ලොකු වැඩ කොටසක් කරපු අපිට මගේ ඒ පාර ඉතුරු කරලා තිබුණේ මොකද මම මගේ පාර කරොත් හරි නැති නිසා. ඒ නිසා මේ ගැන සලකා බලන්න කියන ඉල්ලීම කරනවා.

03(14) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ අනුරසිරි මන්ත්‍රීතුමාට පහුගිය දවසේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ධුරය ලැබුණා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතුමා අපේ සහෝදරයෙක් එතුමාට මගේ සුභාෂිංශනය පුදකරනවා.

03(15) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මහින්ද පල්ලිආරච්චි මන්ත්‍රීතුමා ඉතාම කාර්යක්ෂම ගුරුවරයෙක් වගේම ඉතාම කර්යක්ෂම මන්ත්‍රීවරයෙක් එතුමා පහුගිය කාලයේ උත්සහ කරා ඔසු සැලක් දාන්න. අපි කවුරුත් උත්සහ කරා. මම හිතන්නේ එතුමාගේ මහන්සියේ ප්‍රතිඵලයක් ලෙස ලබන සැප්තැම්බර් 03 වෙනිදා ආරම්භ වෙනවා. එම නිසා මම මහින්ද පල්ලිආරච්චි මන්ත්‍රීතුමාට ස්තුති කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා.

03(16) <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඊයේ ඇති වෙච්ච ගැටළුව සම්බන්ධයෙන් ඔබතුමා විශේෂ මැදිහත් වීමක් කරා කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන් කල්දේමුල්ල මන්සන්දියේ ත්‍රිරෝද රථ ගාල් කිරීමේදී ඊයේ පොලීසියෙනුත් පැමිණුලා යම් විදිහකින් ආර්ඩී එකෙනුත් පැමිණිලි කරා. එක යම් සාධාරණ මැදැහත් වීමකින් පසුව කරන්නම් කියලා ඔබතුමා යොමු කලා. මම හිතනවා ඒ පදිකයින්ටත් ඒ වගේම ව්‍යාපාරික රන්ලංකා බුක් ෂොප් ආයතනයටත්, ත්‍රිවිල් රථ රියදුරන්ටත් සාධාරණයක් වන ආකාරයට කඩිනමින් ඔබතුමා පොරොන්දු වුන ආකාරයට පාර්ෂව දෙක ගෙනල්ලා මේකට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියලා ආයාවනයක් කරනවා.

03(17) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, එගොඩ උයන පොලීසිය ඉදිරිපිට කාණුව කාණුව පිලිසකර කරලා දෙන්න කියලා මම 2025 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ යෝජනාවක් කරා. දැන් අවුරුද්දක් ගත වෙන්න ඇවිල්ලත් තවම ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා නැහැ. ඇස්තමේන්තු කරලනම් තියෙනවා. මේ ගැන සොයා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, අපි ආර්ඩී එකෙන් ප්‍රධාන පාර කාපට් කරනවනේ එක පටන් අරන් තියෙන්නේ. එක ඉවර වුනාට පස්සේ අපි මේ වැඩේ කරනවා.

03(18) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ කොරලවැල්ල ධීවර සමිතියකින් ඉල්ලීමක් ලැබිලා තියෙනවා. මොරටුව කියන්නේ වඩු කර්මාන්තයට වගේම ධීවර කාර්මාන්තයටත් ප්‍රධාන තැනක් දෙන්න පුළුවන්. ඒ වගේම මෝදර තුඩුවේ ඉදන් අහුලාන වෙරළ තීරය දක්වාම අපේ ධීවර ජනතාව ධීවර කර්මාන්තයේ නියැලෙනවා. කොරළවැල්ල ප්‍රජාග්‍රාමීය ධීවර සමිතිය විසින් ඉල්ලීමක් කරලා තියෙනවා මීට වසර කිහිපයකට පෙර කොරළවැල්ල වෙරළේ අපේ ධීවරයන්ට ධීවර කටයුතු කරන්න ගොඩබිමක් නිර්මාණය වෙලා තිබුණා. හැබැයි වර්ථමානයේ යම් යම් හේතූන් නිසා ඒ ගොඩබිම ඒ ධීවරයන්ට අහිමි වෙලා තියෙනවා. ඉතින් මේ සමිතියෙන් ඉල්ලා සිටින්නේ ගොඩබිමක් නිර්මාණය කරලා දෙන්න කියලා. මේ ගැටළුවට විසඳුම් ලෙස විකල්ප 3ක් ඉදිරිපත් කරලා තියෙනවා. එකක් තමයි හරස්ගල් බැම්මක් ඉදිකරන්න, අනිත් එක තමයි තාවකාලිකව ටී ගල් බැම්මක් ඉදිකරන්න, අනිත් එක කෘතිම ලෙස වැලි පුරවලා ඒ ගොඩබිමක් නිර්මාණය කරන්න. මේ සම්බන්ධයෙන් ගිය අවුරුද්දේ ධීවර සමිතිය විසින් ඔබතුමාටත්, ධීවර අමාත්‍යතුමාටත් මේ පුද්ගලයා මේ ඉල්ලීම කරලා තියෙනවා. නමුත් අද වන තුර යහපත් ප්‍රතිචාරයක් ලැබිලා නැහැ. ඉල්ලීමක් කරනවා මේ ධීවර ජනතාව මේ රැකියාවෙන් තමයි ඔවුන්ගේ පවුල් නඩත්තු කරන්නේ. එම නිසා මේ සම්බන්ධයෙන් අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(19) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආර් ඒ 9805 කසල අඳින ට්‍රැක්ටර් රථය පසුගිය දවස් 45ක් පුරාවට නගර සභා ගාරාජයේ අළුත්වැඩියාවක් සඳහා යොදවලා තිබුණා. දැන් එලියට දීලා තියෙනවා නමුත් කියන්න කණගාටුයි උදේ පාන්දර එන්ජින් රෙපෙයාර් එකක් සඳහා කියලා මම හිතනවා ඒ ට්‍රැක්ටර් රථය ගාරාජයේ තිබුනේ එතරම් කාලයක්. හැමදාම උදේට ඒ රථය ස්ටාර්ට් කරන්නේ තල්ලු කරලා. ඉතින් මේ පාලනය තුල ට්‍රැක්ටර් රථයකට පැවු එකක් දා ගන්නවත්, එන්ජින් එකක් හදා ගන්නවත් බැරි වෙලා තියෙනවා. මේක බලපාන්නේ මොරටුවේ ජනතාවට. ඉතින් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න කියලා.

03(20) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පසුගිය අගෝස්තු මාසයේ 1 වෙනිදා කොරළවැල්ල 3වන පටුමගේ මරණයක් සිදුවෙනවා. එදාම ඒ මරණය සිදු වෙච්ච පවුලේ පුද්ගලයෙක් නගර සභාවට ඇවිල්ලා රුපියල් 6000ක් ගෙවලා අගෝස්තු මාසයේ 3වනදා හවස 5ට ඒ අදාහනාගාර කටයුතු කරන්න කොරළවැල්ල අදාහනාගාරය වෙන්කරනවා. මන් ලඟ ඒ රිසිට් පතේ පිටපතක් තියෙනවා. ඉතින් මේ අගෝස්තු මාසයේ 3වනදා අදාහනාගාරයේ ඒ මරණ කටයුතු කරන්න පැය එකහාමාරක් විතර තියෙද්දි මේ පවුලේ පුද්ගලයෙක් කොරළවැල්ල අදාහනාගාරයට යනවා අදාහනාගාරය සුදානම්ද කියලා බලන්න. හැබැයි කියන්න කණගාටුයි එතුමා යද්දි අදාහනාගාරයේ මැෂින් එක කැඩිලා. අවසානයේ ඒ පවුලේ මිනිස්සුන්ට කරකියා ගන්න දෙයක් නැති වෙනවා. ඉතින් ඔවුන්ට සිදුවෙනවා මේ මරණය එගොඩඋයන ආදාහනාගාරයට රැගෙන යන්න පැය එකහාමාරක් ඇතුළත. ඔවුන්ට බස් රථයක් පවා කුලියට ගන්න සිදුවෙනවා. එදින ඒ මරණය සිදුවෙච්ච පවුලේ සියළුදෙනාට අපේ නාගරික මන්ත්‍රීවරු දෙදෙනෙක් ගිහිල්ලා පොරොන්දු වෙනවා නගර සභාවෙන් ඒ බස් රථයට ගෙවිය යුතු මුදල අයකරලා දෙන්නම් කියලා. හැබැයි අද වෙද්දි ඒ මරණයට මාසයක් වෙනවා.

හැබැයි ඒ පවුලට අදවනතුරු ඒ ගෙවීම කරලා නැහැ. පසුව දින කිහිපයකින් නගර සභාවට මේ මරණය වුන පවුලේ පුද්ගලයෙක් ලිපියක් භාර දෙනවා. මේ ලිපිය ලියලා තියෙන්නෙත් නාගරික මන්ත්‍රීවරයෙක් මම ඒ ලිපිය කියවන්නම්. මහේෂ් නිරෝෂන්, 29/1 3 වන පටුමග, කොරළවැල්ල, මොරටුව. නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මුදල් ලබා ගැනීම සඳහා 2026.08.03 වන දින මගේ ආච්චි අම්මාගේ ආදාහනය සිදු කිරීමට වරහන් ඇතුලේ කොරළවැල්ල ආදාහනාගාරය රිසිට් අංක 7638 යටතේ කොරළවැල්ල ආදාහනාගාරය වෙන්කරවා ගන්නා ලදි. නමුත් දේහය ගෙදරින් පිටත් කිරීමට සුළු මොහොතකට පෙර අදාහනාගාරය අක්‍රිය බව අප හට දැනුම්දෙන ලදී. මේ මන්ත්‍රීවරයා මේ ලියුම ලියන්නේ අදාහනාගාරයෙන් මේ මරණ ගෙදර පවුලේ අයව දැනුවත් කරා කියලා. නමුත් එහෙම නෙමෙයි වෙලා තියෙන්නේ. ඒ පවුල ඔබතුමාලා ගැන තියෙන විශ්වාසය නිසාම නිකමට තමයි අදාහනාගාරය බලන්න ගිහින් තිබුනේ. ඒ වෙලාවේ තමයි ඔවුන්ට දැන ගන්න ලැබුනේ අදාහනාගාරයේ මැෂින් එක අක්‍රිය වෙලා කියලා. නිකමට හරි මේ පුද්ගලයා සොදිසි කරන්න ගියේ නැත්නම් ඒ මරණය අදාහනය කරන්න වෙන්නේ මාලිමාව උඩ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබ පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ වැරදි සීමාවකට යනවා. යම් වරදක් වුන බව ඇත්ත. එවැනි හදිස්සි දේවල් යන්ත්‍ර සූත්‍ර වල වෙන්න පුළුවන්. එතකොට අපි එකට ආදාලව ඊලඟ ක්‍රියාමාර්ගයට ගියා. දැන් ඔබ එය පාවිච්චි කරනවා දේශපාලන විවේචනයක් ගොඩනගන්න. ඒක සාධාරණ නැහැ. ඔබේ පෙත්සම ඇතුලේ ඉතාම පැහැදිලි ඔබ වෙන දේශපාලන විවේචනයක් ගොඩනගන්න උත්සහ කරනවා. එහෙම කරන්න එපා එක ජනතාවගේ ඇත්ත ප්‍රශ්නයක් වයර් ශෝට් එකක් ඇවිල්ලා තමා එක අක්‍රිය වෙලා තියෙන්නේ. ඉතින් එහෙම දේවල් වෙන්න පුළුවන්නේ. ඒ නිසා අපි තීන්දු කරනවා එගොඩඋයන අදාහනාගාරය කිසිදු මුදලක් අය නොකර ඒ කටයුත්ත කරගන්න දෙන්න. මෙහෙම ප්‍රශ්න සාමාන්‍යයෙන් වෙනවා. එක පාවිච්චි කරන්න හදන්න එපා. අඩුපාඩුවක් වෙලා තියෙන බව අපි පිළිගන්නවා එවා කියන්න අපි එවා නිවැරදි කර ගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒක එක ප්‍රශ්නයක් හැබැයි මන්ත්‍රීවරු දෙදෙනෙක් ඒ මිනිස්සුන්ට පොරොන්දු වෙනවා රුපියල් 6000ක මුදල නගර සභාවෙන් අය කරලා දෙනවා කියලා. අනිත් එක තමයි මන්ත්‍රීවරු දෙන්නගේ නම් දාලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සභාවේ කාලය නාස්ති කරන්නේ නැතුව ඔබතුමා ඇවිල්ලා මාව හම්බවෙන්න මොකද්ද කරන්න ඕන කියලා කියන්න අපි ඒ දේ කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ ලිපිය කියවන එක මම නතර කරන්නම් හැබැයි ඔබතුමා මට කියන්න මෙහෙම ලිපියක් මන්ත්‍රීවරයෙක්ට ලියන්න පුළුවන්ද, ඒ වගේම කොමසාරිස්තුමියගෙන් මම අහනවා මෙහෙම ගෙවීමක් කරන්න නගර සභාවට බලයක් තියෙනවද. එහෙම පුළුවන්නම් ඒ ගෙවීම කරන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි ඒ මුදල තමයි අර අදාහනාගාරයට යටත් කරේ. මන්ත්‍රීතුමා ඔබත් මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් වුනාම ඒ අදාල මැදිහත්වීම කරන්න. මෙතන අනවශ්‍ය විදිහට කාලය ගන්නේ නැතුව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉල්ලීමක් කරනවා මෙතනින් එහාටවත් මෙවැනි දේවල් නොවෙන්න වගබලා ගන්න කියලා.

03(21) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ මා හට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තියෙනවා. මා දන්නා තරමින් මේ සභාවේ ඉන්ධන ලබා ගැනීමේදී නගරාධිපතිවරුන්ට, උප නගරාධිපතිවරුන්ට, නිලධාරින්ට, මන්ත්‍රීවරුන්ට ක්‍රමවේදයක් තියෙනවා. මා සතුව තිබෙනවා ලේඛනයක් මම එය සභාගත කරනවා. සී ඒ වී 5110 දරණ වාහනය, මේ එක ලේඛනයක් පමණයක් මා ලඟ තියෙන්නේ මේකේ කණගාටු දායක තත්ත්වය මම කොමසාරිස්තුමියට දැන්වත් කරලා මෙහි ලිපි ගොනුව පරීක්ෂා කරන්න යනකොට ඒ ලිපි ගොනුව නැහැ. ලිපි ගොනුව හොයා ගන්න විදිහක් නැහැ. එක තමයි මේ සභාවේ තත්ත්වය. මම අර්.එන්.බී එකෙන් චෙක් කරා කවුද මේ අයිතිකාරයා කියලා. මේකේ පලවෙනි රෙජිස්ට්‍රේෂන් එක තියෙන්නේ 2017.08.17 වෙනිදා, තියෙන්නේ වන්නකුවත්ත වඩුගේ චමේෂ් සංඛ ප්‍රනාන්දු අයිතිකරු, අංකය නොම්බර 28/2, බෝධිරාජ මාවත, විල්ලෝරාවත්ත, මොරටුව. මම මේ සම්බන්ධව ඔබතුමාගෙන් ඉතාම ඉක්මනින් පරීක්ෂණයක් ඉල්ලනවා. මේ තියෙන්නේ 2021,2022,2023 දක්වා පෙට්‍රල් ලබාගෙන තියෙනවා මේ වාහනයට. ඉන්ධන ලීටර් 25, 50,30,15 ආදී වශයෙන් විශාල ප්‍රමාණයක් ඉන්ධන ලබාගෙන තියෙනවා. මේ වාහනය පුද්ගලික වාහනයක් මේ වාහනය පාවිච්චි කරේ කවුද අදාල රියදුරෙක් අත්සන් කරලා තියෙනවා. දැන් ෆයිල් එක අපිට හොයා ගන්න නැහැ. ඒ නිසා ඔබතුමා මේකට වහාම මැදිහත් වෙලා නීති ක්‍රියාමාර්ග වලටත් යවලා ඉක්මනින් පරීක්ෂණ පවත්වන්න කියලා ඉල්ලනවා. මම දැනගන්න කැමති මේ සභාවේ නගරාධිපතිවරයාට පුළුවන්ද මන්ත්‍රීවරුන්ට පුළුවන්ද තමන්ගේ පුද්ගලික වාහනයට සභාවෙන් තෙල් ගහගන්න. පුළුවන්නම් මට එකට පිලිතුරක් දෙමින් මා ඉල්ලීමක් කරනවා හැකි ඉක්මනින් පරීක්ෂණ පවත්වන්න එකින් එකට අපිට තොරතුරු එනවා මම හැකි ඉක්මනින් අත්සන් කරපු හැටි තනියම සැලසුම් වලට, එවට අදාල නීතිමය පියවර ගන්නවා. මා මෙය සභාගත කරනවා ඉතා ඉක්මනින් අපිට මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වලා අදාල අංශ වලට වාර්තා කරලා මේ පිළිබඳ මොරටුව ජනතාව දැන්වත් කරන්න කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත පුදිනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමිය, මෙය පරීක්ෂණ කටයුතු සඳහා යොමු කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මෙතනදි මේ අයිතමය යටතේ මේවා ඉදිරිපත් කරාම මේවට අවශ්‍ය දේවල් කියන්න බැහැ. හැබැයි අපි ඔබතුමාගෙන් අවසර පතනවා මේක මොකද්ද වුනේ කියලා, මමත් එතකොට විපක්ෂයේ හිටියේ හැබැයි සුදේශ් මන්ත්‍රීතුමා මොකද්ද වුනේ කියලා නොදන්න නිසා තමයි මෙය ඉදිරිපත් කරන්න ඇත්තේ. මෙහි නීත්‍යානුකූලභාවයක් තිබෙනවා. ඔබතුමටත් පුළුවන් එක කරන්න. ඔබතුමා මෙහෙ වාහනය පාවිච්චි කරන්නේ නැතිනම් ඔබතුමාගේ පෞද්ගලික වාහනය පාවිච්චි කරන්න පුළුවන් ඔබතුමාගේ, ඔබතුමාට පුළුවන් සභාවේ තෙල් ටික ගහගන්න. එක ඔබතුමාගේ අයිතිය.

03(22) **<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මන්ත්‍රී වරප්‍රසාද උල්ලංඝනය සම්බන්ධයෙන් කතා කරන්න ඕන. සමන් වීරසිංහ නම් පුද්ගලයෙක් සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් ඉන්නේ මොරටුවේ එයා මගේ ෆෝටෝ ෆේස් බුක් එකේ දානවා. මම මන්ත්‍රීවරයෙක් එයා මට ෆේස් බුක් එකේ ගහනවා. ඒ සම්බන්ධයෙන් මම පැමිණිල්ලක් දලා තියෙනවා. මම ඔබතුමාටත් කියනවා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා.

03(23) **<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, එගොඩඋයන, මෝදර, කටුකුරුන්ද කුණු ගෙනියන්න විදිහක් නැහැ. ලොරිය කැඩිලා කියනවා. දැන් සති 3 තිස්සේ කැඩිලා කියනවා ඇත්තටම කැඩිලා වෙන්න ඇති.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, වාහනය කැඩිලා නමුත් කුණු අදිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, දැන් යන්න එන්න කුණු ගෙනියලා නැහැ. බාස්කට් 3ක් තිබුනොත් එක බාස්කට් එකයිලු ගෙනියන්නේ. ඊට පස්සේ ඇවිල්ලා අහනවලු මේ පණුවෝ ඉන්නේ ඇයි කියලා. පණුවෝ තියෙන්නේ කුණු ගෙනියන්නේ නැති නිසා මන් ලඟ රේකෝඩින් තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ වෙලාවට ඔබට අයිතියක් තිබෙනවා, වගකීමක් තියෙනවා මට කතා කරලා ඉවර වෙලා ඒ කාරණාවට මැදිහත් වෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මැදිහත් වුනාට වැඩක් නැහැනේ වැඩේ වෙන්නේ නැහැනේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ වාහන වල තියෙන ගැටළු නිසා යම් බාදාකාරී තත්ත්වයක් තියෙන බව අපි හැමෝම පිළිගන්නවනේ. හැබැයි ජනතාවගේ පැත්තෙන් ඒ කාරණාව ඉදිරිපත් වුනාම අපි කෙසේ හෝ ඒ කටයුත්ත කරනවා.

03(24) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාට විශේෂ ස්තුතියක් කරන්න තියෙනවා. මා නියෝජනය කරන වාවිස්සර දහම් පාසල එ වගේම ශ්‍රී කවිඳජ විහරස්ථානයේ නායක හිමිපාණන් වහන්සේගේ මැණියන් ගිය සතියේ අභවප්‍රාප්ත වුනා ඒ අවස්ථාවට ඔබතුමත් ඒ වගේම ලීලාරත්න මන්ත්‍රීතුමත් සහභාගි වුනා. දහම් පාසල වෙනුවෙන් ඒ වගේම විහරස්ථානය වෙනුවෙන් ඒ වගේම ස්වාමීන් වහන්සේ වෙනුවෙන් ඔබ සියළු දෙනාට මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා.

03(25) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තවත් ස්තුතියක් කරන්න තියෙනවා. අපි මේ සභාවේ අඩුපාඩු වගේම හොඳ වැඩ අගය කරනවා. ඒ වගේම පසුගිය දවසක අගුලානේ මා විසින් මේ සභාවේදී යෝජනා කරන ලද ලිඳක් පිලිසකර කරලා දුන්නා. ඒ ලිඳ පාවිච්චි කරන සියළුම ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී ඔබතුමාට මාගේ ස්තුතිය සහ මගේ ප්‍රජාවගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුදකර සිටිනවා. මෙතන විශේෂත්වයක් තියෙනවා දැන් ඔබතුමන්ලා හදපු මේ ලිඳ ගාවට කිසිම දවසක මම ගියේ නැහැ කැපිලා පෙනෙන්න, පෙනිලා කැපෙන්න ගියෙත් නැහැ. ඒ ලිදේ වැඩ අවසන් වුනා කියලා ප්‍රකාශ කරේ ඒ ජනතාව. ඒ වගේම තමයි විශේෂ ස්තුතියක් කරන්න ඕන මේ සේවකයින්ට. පොඩ්ඩක් චකිතයක් තියෙනවා හේතුව අපි මේ සභාවේදී සමහර සේවකයින්ව අගය කරාම මම හිතන්නේ අදෘශ්‍යමාන හස්තයක්ද කියලා මම දන්නේ නැහැ ඒ සේවකයින්ව මාරු කරනවා. එ නිසා ඔබතුමාටත් ස්තුති කරන්න බය හිතෙනවා. විශේෂයෙන්ම මේ කාර්යයේදී දිනුෂ මහත්මයා ලොකු කැපකිරීමක් කරා. මේ අවස්ථාවේදී එතුමාටත් ස්තුතිය පුද කරනවා.

03(26) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම මේ සේවකයෝ ගැන කතා කරනකොට කියන්න ඕන මම හිතන්නේ 2026.06.05 වනදා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පවත්වපු තරඟයක් තිබුණා. මේ සෞඛ්‍ය පරීක්ෂකවරු සහ ආදායම් පරීක්ෂකවරු පත්කර ගැනීමේ තරඟ විභාගය ඉතින් මේ අවස්ථාවේදී මම හිතන්නේ මම මතක් කරන්න ඕන මේ ප්‍රතිඵල නිකුත් වුනේ හත්වෙනි මාසයේ නමුත් තවමත් මේ සේවකයින්ට එම තනතුරු ලැබිලා නැහැ. මේ ඉතාම කණගාටුවට කාරණාවක් මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මගේ අඟුලාන කොට්ඨාශයේ සේවකයින් දෙදෙනෙක් මේ අතර ඉන්නවා. විභාගයක් පාස් වුනා කියලා කියන්නේ මේ අය දක්ෂයෝනේ. කණගාටුවට තියෙන කාරණය මේ අය තවමත් කුණු අදිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි මේ සතියේ ඒ වැඩේ කරනවා.

03(27) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, පල්ලිය පාර, මහජන මාවත සමහර තැන් වල අළුතින් කුණු ගොඩවල් හැදිගෙන යනවා. ඒම නිසා බෝඩ් එකක් ගහලා දෙන්න මේවා ඉවත් කරන්න. මේ සඳහා ගරු කොමසාරිස්තුමියගේත් අවදානය යොමු කරනවා.

03(28) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, වාචිස්සර දහම් පාසලට අදාලයි මේක ඔබතුමන්ලාට දිවි හිමියෙන් වැඩ කරපු, නිතරම ඔබතුමන්ලා වෙනුවෙන් පෙනී සිටපු කෙනෙක්ගේ වාචික පැමිණිල්ලක් තියෙනවා. මොරටුවැල්ල කඩකාමර අංක 03, ෆයිල් අංකය 1583 අප්‍රේල් මාසයේ භාරදීලා තියෙනවා නගර සභාවට නව ජල සම්බන්ධතාවයක් ලබා ගැනීමට, දැනට මාස 5ක් වෙනවා. නමුත් ඒ වැඩේ සිදුවෙලා නැහැ විශේෂයෙන් කියන්න ඕන කොමසාරිස්තුමියට මම දෙපාරක් කතා කරා, ඒ වගේම විවිධ තැන වලට මම පස් පාරක් විතර කතා කරා. නමුත් තවමත් මේ වැඩේ වෙලා නැහැ. ඉතින් මේක හොයලා බලන්න. මම දන්නේ නැහැ මේ මිනිස්සුන්ව ඇයි මෙහෙම රස්තියාදු කරන්නේ කියලා. මේ අවස්ථාවේදී එතුමා මා හට එවලා තියෙන සටහනක් මම ඉදිරිපත් කරන්න කැමති, එදා ඒඕ මිස් ඔරිජිනල් ලියුම අත්සන් කරලා, දැන් ෆෝටෝ කොපි එකක් තියෙනවා, හැබැයි සීල් එක ගහලා. මට කියනවා ඒ වගේ තව ලියුමක් ලියලා ගෙනල්ලා දෙන්නලු. අන්තිමට කියනවා මුකුත් කියන්නේ නැතුව මම ආවා මට හිතුනා සාධාරණ රටක් හදන්න ගියාට අර පරණ කුණු එහෙම්ම තියෙනවා කියලා. මෙහෙම මිනිස්සු රස්තියාදු කරන්න එපා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මැදිහත් වෙලා වැඩේ කරලා දෙන්න. මුකුත් විරෝධත්වයක් නැහැ.

03(29) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, 69 ලක්ෂයක් ඡන්දය දීපු ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රූපය මෙතන අඩුයි. ඒ වගේම තමයි රට වැටුන වෙලාවේ රට බන්කොලොත් වෙච්ච වෙලාවේ රට ගොඩගත්ත අපේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඡායා රූපය අඩුයි. මම ඉතාම කරුණාවෙන් හා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මෙය යාවත්කාලීන කරන්න කියලා.

03(30) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, අද සැප්තැම්බර් මාසයේ 1 වනදා විශ්ව පොත් ගුල්ලන්ගේ මාසය. සැප්තැම්බර් මාසය කියන්නේ පොත් කියවන්න ආස කරන පොත් වලට ආදරය කරන දැනුම හොයන ලෝකවාසී හැමෝගෙම දිනය තමයි අද. විශේෂයෙන්ම මගේ ඉල්ලීම තියෙන්නේ අපේ ජනසෙත ප්‍රධාන පුස්තකාලය සම්බන්ධව මා වෙත ලැබුණ වට්ස්ඇප් පණිවිඩ කිහිපයක් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම එම ස්ථානයේ යම් යම් පුරප්පාඩු තියෙනවා කියලා ඔබතුමත් දන්නවා ඇති. පිරිසිදු කිරීම සම්බන්ධයෙන් ගැටළු රාශියක් මතු වෙලා තියෙනවා. මම නිතර දෙවේලේ එම ස්ථානයට යන කෙනෙක් විදිහට සොයා බැලීමක් කරනවා. මොකද මේ සම්බන්ධයෙන් එතන ගැටළු මතු වෙලා තියෙනවා. ඒ වගේම එහා පැත්තේ තියෙනවා අපේ පරිගණක පන්තියක් එක ඉතාම සාර්ථකව දැනට පවත්වා ගෙන යනවා. නමුත් එතනත් යම් යම් පුරප්පාඩු කිහිපයක් තියෙනවා. ඒ සම්බන්ධව දැන ගැනීමට ලැබුණ නිසා, ඒ ගැන පණිවිඩ ලැබෙන නිසා මේ සම්බන්ධව කිසියම් අදහසක් ඉදිරිපත් කරන්න හිතුනා. මොකද සැප්තැම්බර් මාසය ඉතා වැදගත් මාසයක්. පොත් කියවන්න ප්‍රිය කරන හැමදෙනාටම ජනසෙත කියන්නේ අපේ මොරටුවට තියෙන ප්‍රධාන පුස්තකාලය, අපි මේ පුස්තකාලයට මීට වඩා මුදලක් වෙන් කල යුතුයි. ඒ වගේම අපිට පරිගණක කිහිපයක අඩුපාඩුවක් එතන තියෙනවා. මම හිතුවා මේ සම්බන්ධයෙන් කමිටුවට දාන්න කලින් අපේ මහා සභාව දැනුවත් විය යුතුයි. මොකද පොතට පතට ආදරය කරන දැනුම හොයන පිරිස එතනට යනවා. ඒ අයට එතන පිරිසිදු භාවය සම්බන්ධව ගැටළු තියෙනවා, එ වගේම සේවකයින්ගේ ගැටළු තියෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් විශේෂ අවදානයක් යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

03(31) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුමුල්ල 5 වන පටුමග මාස 2ක් 3ක් එක දිගට දාපු යෝජනාවක් සම්බන්ධව ඊයේ දිනයේ යම්කිසි සොයා බැලීමක් කරා, ඒ ගැන පසු විපරමක් කරා. ඒ ගැන සතුටු වෙනවා, ස්තුතිවන්ත වෙනවා පසු විපරමෙන් පසුව එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරලා එම ජනතාව අපහසුවට පත්වෙන එම කාණු පද්ධතිය සංස්කරණය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(32) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, අදට ඔබතුමාලාගේ ආණ්ඩුව පැමිණිලා වසර 2ක් වෙනවා. ඒ නිසා මම හිතනවා මේ කරුණ කිවයුතුයි කියලා. ඔබතුමාලාගේ සමාජ මාධ්‍ය වල යනවා වසර 2යි කියලා. බලයට ඇවිත් වසර දෙකක් වෙනවා. අපි මේ වසර 2ක ගැන පසු විපරමක් කරොත් එදා මොරටුව නගරය වසර 2කට පෙර තිබුණ තත්ත්වයයි දැන් තියෙන තත්ත්වයයි පාරට බැස්සම ජනතාවටත් අපිටත් තේරෙනවා. මම කියන කරුණ මේකයි ඔබතුමන්ලාට නගර සභාව තියෙනවා, ආණ්ඩුව තියෙනවා, අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තියෙන සංවර්ධන කමිටුවේ මොරටුව නගරයට අදාල ඩිවලොප්මන්ට් ටැක්ටස් ගැන කතා කරනවා. මේ සෑම සියළු දෙයක්ම වෙලා දැන් අවුරුදු 2ක් ගිහිල්ලා. අද වෙනකොට මොරටුව නගරයට ඔබලා විසින් ගෙනල්ලා තියෙන සංවර්ධන ව්‍යාපෘති මොනවද කියලා අපි අහන්න කැමති. මම ඉල්ලීමක් කරනවා අයවැය එනවා නොවැම්බර් මාසයේ බජටරි ප්‍රොපෝසල් කතා කරලා තියෙනවා හැබැයි ඒ සම්බන්ධයෙන් ඔබතුමා මොරටුව නගරය සංවර්ධනය කරන්න මේ තියෙන තත්ත්වයෙන්, විශාල ප්‍රශ්න ගණනාවක් තියෙනවා දකුණු කාලපයේ. අපි මේ සභාවට ආපු මුල් කාලයේම කතා කරා කාණු ගලන ප්‍රශ්නය, ගංවතුර ප්‍රශ්නය, එතකොට මධ්‍යම වෙළඳපොළ, බස් නැවතුම් පොළ, මොරටුවේ අධිකරණ සංකීර්ණය මේ සම්බන්ධයෙන් මොරටුව නීතිඥ සංගමය විශාල ප්‍රොපොසල් ගණනාවක් ගෙනල්ලා අධිකරණ අමාත්‍යාංශයට ගිහිල්ලා සාකච්චා කරලා තියෙනවා. අපි එක අර යහපාලන ආණ්ඩුව කාලේ

මොරටුව සංවර්ධනය සම්බන්ධයෙන් විශාල වූ ප්‍රොපොසල් ගණනාවක් ඉදිරිපත් කරා. ඔබතුමන්ලාගේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමාටත් එවා ලබා දුන්නා. මගේ ප්‍රශ්නය දැන් මේ අවුරුදු දෙක ඇතුලත මේ නගරය සංවර්ධන වෙනුවෙන් එවැනි මුදලක් වෙන් කිරීම සඳහා කටයුතු කරලා තියෙනවද? ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කරලා තියෙනවද? ඒ සම්බන්ධයෙන් මේ සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබ න්‍යාය පත්‍රානුකූලව මේ පෙත්සම් පැමිණිලි ආයාචනා කියන අයිතමය තේරුම් අරගෙන කතා කළ යුතුයි. ඉතාම සංශිප්තවය කරුණු ඉදිරිපත් කරන්න. ඔබ දැන් කරුණු ගණනාවක් කියනවා. විශාල අඩුපාඩු රාශියක් කියනවා එවා සත්‍යක් එවා අපේ පාලන කාලයේ ඇති වුණ එවා නෙමෙයි. දිර්ඝකාලයක් තිස්සේ මෙවැනි අඩුපාඩුකම් ගණනාවක් එක්ක පැවතුනා. අපිට ලස්සන මොරටුවක් නිර්මාණය කරන්න සෑහෙන්න ඕනෑ කමක් තියෙනවා, නමුත් අපේ හැකියාවන් තියෙන්නේ අපේ ඕනෑකම් වලට පිටුපසින් අපි ටිකෙන් ටික ඒ වෙත ලංවෙමින් තියෙනවා. ඔබ අපිට උදව් කරනවා හොඳ අදහස් ඉදිරිපත් කරනවා. සහයෝගය ලබා දෙනවා ඒ පිළිබඳ අපි ඔබට ගෞරව කරනවා. හැබැයි න්‍යාය පත්‍රානුකූලව මේ කාරණා ඉදිරිපත් කරනකොට ඉතාම නිශ්චිත කරුණක්, අපිට පාලාත් පාලන පැත්තේ කරුණක් ආණ්ඩුව පැත්තේ එවා නෙමෙයි. එවා ඉදිරිපත් කරන්න එකට ඉඩ තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, මගේ ඉල්ලීම මොරටුව නගරය සහ නගර සභාව සම්බන්ධයෙන් තමයි. ඔබතුමා විසින් ඔබතුමන්ලාගේ රජය හරහා මොනවද කරලා තියෙන ඉල්ලීම් සහ මුදල් වෙන් කිරීම් කරලා තියෙනවද කියලා මේ සභාව දැනුවත් කරන්න කියන ඉල්ලීම තමයි කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ලිහිණි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු කාරනාව අපිට අදාළයි. හේතුව තමුන්නාන්සේ මේ සභාවට පත්වුන අලුතම මන්ත්‍රීවරු ඔක්කොම කැඳෙවුවා ශ්‍රී පාලි උත්සව ශාලාවට. කැඳවලා සංවර්ධන සැලැස්මක් ගැන කතා කරා. අපි ඒ සැලැස්ම අහන් හිටියා. එදා එතන තිබුණේ එරාන් වික්‍රමරත්න මැතිතුමාගෙම සැලැස්ම ඒ සභාව ගැන කතා කරන්න මේ සභාවට අයිතිය තියෙනවා. එක තමයි එතුමිය ප්‍රශ්න කරේ. ඒ නිසා මේක බැහැර කරන්න බැහැ. අපිව ගෙනාවේ තමුන්නාන්සේ අපේ නායකා විදිහට වගකීමක් ඇතිව. ඒ නිසා එතුමියට ඒ ගැන කතා කරන්න අයිතිය තියෙනවා කියලා මතක් කරන්න කැමති.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එතුමිය එක කිවුවේ නැහැ. එක තැනක එතුමිය කිවුවා තණකොළ වැවිලා තියෙනවා කියලා ලොකුවට ඒත් කිසිම තැනක එහෙම නැහැ. කරපු ටික කියමු නොකරපු ටිකකුත් තියෙනවා ඒ ටික කරනවා.

03(33) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ කණ්ඩායම නියෝජනය කරන අනුරසිරි මන්ත්‍රීතුමා අවුරුදු 80කට පමණ දේශපාලන උරුමකම් කියන එක්සත් ජාතික පක්ෂයේ මොරටුවේ සංවිධාන කටයුතු කරන්න එතුමාට ලබා දීලා තියෙනවා. අපි මේ අවස්ථාවේ එතුමාට සුබ පතනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ඉතාම වටින පක්ෂයක්, හොඳ නායකයෝ හිටපු පක්ෂයක් ඒ වගේම රටට හානි

කරපු පක්ෂයක්. අපි ප්‍රාර්ථනා කරනවා අනුරසිරි මන්ත්‍රීතුමාට ඉදිරියට යන්නට මොරටුවේ ජනතාවගේ ආශීර්වාදය පතනවා.

03(34) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, අපි දන්නවා මේ වෙලාවේ ජගත් පනාගොඩ අපේ සමාජ මාධ්‍යකරුවා ඔහු මොරටුවේ පුද්ගලයෙක්. ඔහු ඉල්ලීමක් කරා මේ සභාව මාධ්‍යකරණය කරන්නට දෙන්න කියලා. නමුත් ඒ අවස්ථාව තවම ඔහුට ලැබිලා නැහැ. ඔහුට මේ අවස්ථාව දෙන්න පුළුවන් හැකියාවක් තියෙනවද නැද්ද කියන එක ඔහුට ලිඛිතව හෝ දැනුම් දෙන්න. නැතිනම් අපි ඔහුට කරන අසාධාරණයක් වෙනවා. ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව ඔහුට දැන ගැනීමේ අයිතියක් තියෙනවා. ඒ නිසා ඔහුට මේ අවස්ථාව දෙන්න පුළුවන්නම් ඒ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලන ගමන් නැතිනම් එයට හේතුව ඔහුට දැනුම් දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

03(35) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, රාවතාවත්ත රෝමානු කතෝලික විදුහල ඉදිරිපිට මම හිතන්නේ ඔබතුමත් දැනුවත් ඇති, ඒ පාසලට ඉදිරිපසින්ම නේවාසික පුද්ගලයෙක් ගේට්ටුවක් දානවා කියලා ගැටලුවක් මතුවෙනවා තියනවා.කෙලින්ම ගේට්ටුවක් දැම්මම අනතුරු සිදුවෙන්න පුලුවන් ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(36) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,සොයිසාපුර ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කරනවා අපි ගිහිල්ලා බැලුවා.අපි අගය කරනවා.හැබැයි ගැටලුවක් මම දැක්කා.පොළවට අල්ලලා තියන මැටි ටයිල් එක කඩනවා.ඒ ටයිල් පොඩ්ඩක්වත් ඩැමේජ් වෙලා නැහැ.ඒක පෞරාණික තත්ත්වයෙන් නිර්මාණය කරන්න තිබුනා.ඒවා ශක්තිමත්ව තියනවා. ඒක පෞරාණික තත්ත්වයෙන් නිර්මාණය කරන්න තිබුනා.ටීඕ මහත්මිය කලාවක් වශයෙන් දකින්නෙ නැතුව ඇති.පරණ ටයිල් කැඩුවේ නැත්නම් සභාවට මුදල් ඉතුරු කරගන්න තිබුනා.ඒකත් මේ වෙලාවෙ සඳහන් කරනවා.

03(37) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මොරටුවේ සමූපකාර ෂෙඩ් එකේ සභාපතිතුමාගේ සංශෝධනයක් සිද්ද වෙලා තියනවා දූෂණ ප්‍රශ්න කියලා.සමූපකාරයේ රුපියල් දෙදාහක තෙල් ගහනවානම් රුපියල් දෙසියපනහක් ඉල්ලනවා.ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03 (38) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,දෙදහස් තුන දෙදහස් හතර වර්ෂවල මහජන නියෝජිතයන් වශයෙන් හිටපු අයට මේ වෙනකොට ඇවිල්ලා තියනවා අධිභාරය.අධිභාරය සම්බන්දයෙන් සමහරු ගෙවීම් කරලා තියනවා.සමහරු පක්ෂ වලට එම මුදල් යොමු කරලා තියනවා.සමහරු පුද්ගලිකව අරගෙන තියනවා.සමහරු ගෙවීම් කරා කියලා කියනවා.නමුත් මොරටුවේ ප්‍රජාව දන්නෙ නැහැ අධිභාරයට ලක්වෙලා ඉන්න මන්ත්‍රීවරු කවුද කියලා.හිතන්නෙ අපිත් ඉන්නවා කියලා.විනිවිදභාවයක් ඇති කරන්න මුදල් ගත්ත මන්ත්‍රීවරු කවුද කියලා, ගෙවීම් කරලා තියෙන්නේ කවුද කියලා.අධිභාරයට ලක්වෙලා තියෙන මන්ත්‍රීවරු හා නිලධාරීන් කවුද කියලා සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීවරුනි, සාකච්ජාවක් ඉල්ලලා තියෙන්නේ තාම අපිට ලැබුනේ නැහැ.ඊට පෙර අපි කල්පනා කරනවා නැවත ඒ අය කැඳවලා සාකච්ජාවක් අරගෙන ඒ අයගෙ උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග වලට යන්න.

03 (39)මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, දෙරණ මාධ්‍යවේදී දර්ශන මහතා ලිපියක් ඉදිරිපත් කරලා තියනවා. සභාව ආවරණය කරන්න අවස්ථාව ලබාදෙන්න කියලා. ලිපිය සභාගත කරනවා. පුලුවන්නම් ඒ අවස්ථාව ලබාදෙන්න.

03 (40)මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ වාචිකව කෙටි දැනුම්දීමක් කරන්න තියනවා. රාවතාවත්ත ආදාහනාගාරයේ ආදාහනය කරන මැෂින් දෙකෙන් එකක් කැඩිලා තියනවා. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා දැනුම් දෙනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීවරුනි, ආදාහනය කරන්න මැෂින් එක හැදුවා.අනවශ්‍ය විදියට ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා තමයි පොඩි පිපිරීමක් වෙලා තියෙන්නෙ.මේ වෙනකොට අලුත්වැඩියා කරමින් තියෙන්නේ.

03 (41)මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශණ කුමාර ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමා කැඩී තිබුන බෝක්කුවක් සාදා දුන්න නිසා ජනතාව සුභාශිංසන පල කරා.

03 (42)මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු

ගරු නගරාධිපතිතුමනි,ආයාචනා හා පෙත්සම් යටතේ වාචිකව පෙත්සමක් ඉදිරිපත් කරනවා.පහළ ඉදිබැද්ද පාරේ ජීම් එක ලග තියෙන වෙල කැඩිලා තිබුනා.ඒ පාර හැදුවා.ආයෙත් කැඩිලා.ඒ පාරෙ වාහනයක් යනකොට පාරෙ මිනිසුන්ට පයින් යන්න බැහැ ලොකු වලක් තියනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

පී.ආර්.ඩී එකට කිව්වා.වැඩේ ඉක්මන් කරලා දෙන්නම් කිව්වා.

04. ප්‍රශ්න -

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 04 (1) යටතේ මහා නගර සභා මන්ත්‍රී,ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ඉදිරිපත් කරනවා.

04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු,

01. මොරටුව මහා නගර සභාව සතුව නිල නිවාස කීයක් තිබේද?

මොරටුව මහා නගර සභාව සතුව නිල නිවාස ගණන - 21 කි

I. ඉහත නිල නිවාස ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ පවතීද? - නැත.

II. එසේ ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ නොපවතින නිල නිවාස ඇත්නම් ඒ කොපමණද? ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ නිල නිවාස ගණන - 03 කි.

III. ඉහත II හි සඳහන් නිල නිවාස මොනවද? පදංචිවීමට නුසුදුසුවීමට හේතු මොනවද?

*ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමේ නිල නිවාස නම් -

කොරළවැල්ල,විද්‍යාල මාවතේ අංක 4/2

කොරළවැල්ල, විද්‍යාල මාවතේ අංක 4/6

මුරවත්ත නිවාස අංක 01 (සායන ගොඩනැගිල්ල)

*පදිංචිවීමට නුසුදුසු බවට හේතුව - අබලන්ව ඇති බැවින් අලුත්වැඩියාවට යොමුකර ඇත.

02. මොරටුව මහා නගර සභාවේ නිල නිවාස ඉල්ලුම් කල හැකි නිර්ණායකයන් මොනවද?

නිල නිවාස ඉල්ලුම් කල හැකි නිර්ණායක - ආයතන සංග්‍රයේ XIX වැනි පරිච්ඡේදයේ 4:1 නිර්ණායක අදාල වේ.

I. මොරටුව මහා නගර සභාවේ දැනට ලබාදී ඇති සියලුම නිල නිවාස ලබාදී ඇත්තේ ඉහත නිර්ණායකයන්ට අනුකූලවද?
දැනට නිල නිවාස ලබාදී ඇත්තේ ඉහත නිර්ණායකයන් අනුව නිල නිවාස කමිටු තීරණ මගිනි.

II. ඉහත නිර්ණායකයන්ට අනුකූල නොවන පරිදි නිල නිවාස ලබාදී තිබේද? එසේ ලබාදී ඇත්නම් කුමන සුවිශේෂී හේතුවක් මතද? ඒ කුමන අය සඳහාද? ඔවුන්ගේ නම් සහ තනතුරු මොනවද?
නිර්ණායකයන්ට අනුකූල නොවන පරිදි නිල නිවාස ලබාදී නොමැත.

03. මොරටුව මහා නගර සභාව මඟින් 2026/07/01 වන දින වන විට නිල නිවාස ලබාදී ඇති දැනට පදිංචි වී සිටින අයවල්න්ගේ නම් සහ තනතුරු සහ ඔවුන් දැනට සේවය කරනු ලබන දෙපාර්තමේන්තු මොනවද?

2026/07/01 වන දිනට නිල නිවාස ලබා දී ඇති අයවලුන්ගේ තොරතුරු -

අනු අංකය	නිල නිවාසය	ලබා දී ඇති නිලධරයාගේ නම	තනතුර
1	පිරිස් මාවත,අංක 10	තාවකාලිකව දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ලබා දී ඇත.	
2	පිරිස් මාවත, අංක 12	ඒ.පී.ධර්මසේන මයා	මහජන සෞඛ්‍ය පරීක්ෂක
3	පිරිස් මාවත, අංක 14	නිල නිවස හිස්ව පවතී. (නාගරික කොමසාරිස් නිල නිවස)	
4	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/1	එම්.ඩබ්.දිනූෂ චතුරංග මයා	තාක්ෂණ නිලධාරී

5	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/2	අලුත්වැඩියා කටයුතු	
6	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/3	වානක ලක්මාල් හේවගේ මයා	සංවර්ධන නිලධාරි
7	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/4	ඉඳුරංග රන්සිරි ප්‍රනාන්දු මයා	රියදුරු
8	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/5	කේ.වී.බී.සුරාජ් තරංග මයා, එස්.එච්.ආර්.ලක්ෂාන් මයා, ඩබ්.එම්.එම්.චතුරංග මයා	මහජන සෞඛ්‍ය පරීක්ෂක
9	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 4/6	අලුත්වැඩියා කටයුතු	
10	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 2(1 කොටස)	එම්.බී.ජගත් නිහාල් ප්‍රනාන්දු මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
11	කොරළවැල්ල, විද්‍යාල මාවත, අංක 2(2 කොටස)	මනෝජ් චමින්ද මහලියන මයා	මෝටර් යාන්ත්‍රික
12	රාවතාවත්ත, 577/1	පී.එම්.වමීර ප්‍රියංකර මයා	රියදුරු
13	මෝදර, ජයගත්පුර, අංක 01	බී.බී.සුජිත් කුසුම්සිරි ප්‍රනාන්දු මයා	වඩු කාර්මික ශිල්පී
14	මෝදර, ජයගත්පුර, අංක 02	එච්.ඩී.හෂානි ගයන්ති ප්‍රනාන්දු මිය	සෞඛ්‍ය කම්කරු
15	මුරවත්ත, නිවාස අංක 01	අළුත්වැඩියා කටයුතු	
16	මුරවත්ත, නිවාස අංක 02	එස්.වානක මධුරංග ප්‍රනාන්දු මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු
17	මෝදර ධීවර ජය මාවත	ඩබ්.සුරංග චාමින්ද සොයිසා මයා	පුස්තකාල සහායක
18	කටුබැද්ද ළමා ක්‍රීඩාංගනය අසල නිවස	එච්.ජී.ටී.එස්.පී.විජේසිංහ මයා	ආයුර්වේද වෛද්‍ය නිලධාරි
19	කටුබැද්ද, බෝධිය අසල	පී.ඩී.සුදත් පද්මලාල් මයා	ප්‍රජා ශාලා භාරකරු
20	ලංකා ලයිට් පාර, (සිංහ සමාජය අසල) කොරළවැල්ල, මොරටුව	වූලනී චන්ද්‍රකාන්ති මිය	පරිපාලන නිලධාරි (යා.ඉංජිනේරු)
21	17/1/1, ක්ලෝවියස් මාවත, 1 පටුමග, මොරටුවැල්ල, මොරටුව	ඩබ්.චින්තක මෙන්ඩිස් මයා	වැඩ ක්ෂේත්‍ර කම්කරු

පදිංචි නිල නිවාස	16	නාගරික කොමසාරිස් නිල නිවස
අලුත්වැඩියා කළ යුතු නිල නිවාස	3	
තාවකාලිකව ලබා දී ඇති නිල නිවාස	1	
වසා ඇති නිල නිවාස	1	
මුළු නිල නිවාස	**21**	

04. මොරටුව මහා නගර සභාව සතුව ඇති වෙනත් කාර්යයන් සඳහා යොදාගනු ලැබූ ස්ථාන වර්ථමානයේ නිල නිවාස බවට පත්කර තිබේද?
වෙනත් කාර්යයන් සඳහා යොදාගනු ලබන ස්ථාන වර්තමානයේ නිළ නිවාස බවට පත් කර නැත.

I. ඉහත අංක 04 හි සඳහන් පරිදි එසේ නිල නිවාස බවට පත්කර ඇති ස්ථාන මොනවද?
ඉහත අංක 03 හි පිළිතුර අදාල වේ.

II. එම ස්ථාන මේ වන විට නිල නිවාස ලෙස භාවිතය සඳහා ලබාදී තිබේද?
ඉහත අංක 03 හි පිළිතුර අදාල වේ.

III. එසේ ලබාදී ඇත්නම් එම ලබාදී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන දෙපාර්තමේන්තු මොනවද?
ඉහත අංක 03 හි පිළිතුර අදාල වේ.

05. මොරටුව මහා නගර සභාවේ තනි පුද්ගලයන් සඳහා භාවිතා කරනු ලබන නිල නිවාස තිබේද?
තනි පුද්ගලයන් සඳහා භාවිතා කරන නිල නිවාස තිබේ.

I. ඉහත පරිදි තනි පුද්ගල නිල නිවාස තිබේනම් ඒවා ලබා දී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවද?
තනි පුද්ගලයන් සඳහා භාවිතා වන නිළ නිවස - කොරළවැල්ල, විද්‍යාල මාවතේ අංක 4/5 වේ.

II. එම තනි පුද්ගල නිවාස ලබා දී ඇත්නම් එසේ ලබා දී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවද?
ඉහත සඳහන් තනි පුද්ගල නිල නිවාසයෙහි
කේ.වී.බී.සුරාජ් තරංග මයා, එස්.එච්.ආර්.ලක්ෂාන් මයා, ඩබ්.එම්.එම්.චතුරංග මයා යන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පදිංචි වී සිටී.

06. මොරටුව මහා නගර සභාව මඟින් ලබා දී ඇති නිල නිවාස සඳහා මාසික ගාස්තුවක් අයකරනු ලබන්නේද?
නිල නිවාස සඳහා මාසික ගාස්තු අය කරනු ලැබේ.

I. එසේ ගාස්තුවක් අයකරනු ලබන්නේ නම් එම ගාස්තු තීරණය කරනු ලබන්නේ කෙසේද?
ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තියේ හි නිර්ණායක හා රා.ප.ව. 04/2016 හි ඊට අදාල සංශෝධන අනුව තීරණය කරනු ලබයි.

II. ලබාදී ඇති සියලුම නිල නිවාස සඳහා මේ වනවිට මාසිකව අයකරනු ලබන ගාස්තුව පදිංචිකරුවන් විසින් ගෙවනු ලබන්නේද?
ගාස්තුව පදිංචිකරුවන් විසින් ගෙවනු ලබයි.

III. මොරටුව මහා නගර සභාවේ කුමන හෝ ස්ථානයක් නිල නිවාසයක් ලෙස භාවිතා කරමින් මාසිකව සභාව වෙත ගෙවිය යුතු ගාස්තුව නොගෙවන අය සිටීද? එසේ නොගෙවීමට හේතු මොනවද? එසේ නොගෙවන්නේනම් එම අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවාද?
ගාස්තුව වැටුපෙන් අය වන බැවින් නොගෙවන අය නොමැත.

07. මොරටුව මහා නගර සභාව මඟින් ලබාදී ඇති නිල නිවාසයක තනියම වාසය කරන බව සභාව දැනුවත් කර තිබියදී එම නිල නිවාසය වෙත වෙනත් අය අවේලාවේ ගෙන්වා ගැනීඹට සභාවෙන් අවසර තිබේද?
නැත

08. මොරටුව මහා නගර සභාව මඟින් ලබාදී ඇති නිල නිවාස සඳහා ගමන් කිරීමට සභාවේ වාහන සංචිතයේ වාහන භාවිතා කිරීමට හැකියාවක් පවතීද?

රජයේ නිල ප්‍රවාහන හා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් හිමි නිළධාරින්ට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාහන සංචිතයේ ප්‍රවාහන පහසුකම් ලබා දිය හැකිය.

I. එසේ හැකියාවක් පවතීනම් ඒ කුමන තනතුරු දරණ අයවලුන්ටද?
විධායක හා මාණ්ඩලික නිලධාරින්ට

II. නිල නිවාස සඳහා යෑමට දැනට වාහන භාවිතා කරනු ලබන අයවලුන් මොරටුව මහා නගර සභාවේ සිටීද? එසේ නම් එම අයගේ නම්, තනතරු සහ සේවා ස්ථාන මොනවාද?
ආර්.සී.චන්ද්‍රකාන්ති මිය - පරිපාලන නිලධාරි (යාන්ත්‍රික ඉංජිනේරු)

05. <u>යෝජනා -</u>

05(01) මහා නගර සභා මන්ත්‍රී, බී.සජිත් දුමින්ද පීරිස් මහතා විසින් කල් දී ඇති යෝජනාව,

1909 පරිපාලන වාර්ථාවට අනුව එංගලන්ත මහා රැජිනගේ නියමය පරිදි මිලදිගෙන අත්පත් කරගනිමින් අවස්ථානුකූලව විවිධ ආයතන වලට එහි නඩත්තුව හා භූක්තිය පැවරෙමින්, අවසාන වශයෙන් මොරටුව මහා නගර සභාව සතු වත්කමක් බවට පත්වෙමින් මොරටුව මහා නගර සභාව අඛණ්ඩව වසර ගනනාවක් භූක්තිවිදි "ලුනාව තනායම ඉඩම"

මොරටුව තුල ජීවත්වන අඩු ආදායම්ලාභී ජනතාව සඳහා ජනාවාස සංවර්ධන අරමුණු කරගනිමින් "නිවාස ව්‍යාපෘතියක්" ගොඩනැංවුවද එහි අරමුණු වලින් බැහැරව " මුදල් අයකිරීම් මත " අලෙවිකර ඇති අතර, මොරටුව මහනගර සභාවට ගෙවිමට එකඟ වූ මිලියන 102 මුදල වසර ගනනාවක සිට ජනාධිපතිවරුන් කිහිපදෙනෙක්, පාලනතන්ත්‍ර කිහිපයක්, ආණ්ඩු පාලන කිහිපයක් තුල ජනාවාස සංවර්ධනයට හා නිවාස සංවර්ධනයට අදාළ අධිකාරින් විසින් පැහැර හැර,

I. මොරටුව ජනතාවගේ හා ඔවුන්ගේ පරමාධිපත්‍යයේ නියෝජිතයා වන මොරටුව මහා නගර සභාවේ විශ්වාසය කඩ කිරීම තුලින් අසාධාරණයක් සිදුකර තිබේ.

II. මොරටුවේ අඩු ආදායම් ලාභීන්ට නිවාස නොලැබුණද ලුනාව තානායමට අදාල "නිවාස ව්‍යාපෘතිය වන Sea view Residence" හී නිවාස මිලට ගත් ජනතාවට අවශ්‍ය වරිපනම් හිමිකම් නොපවරාගැනීමේ සහතික ඇතුළු මොරටුව මහා නගර සභාවෙන් ලබා ගැනීමට නොහැකි අයිතිය සේම.

මොරටුව මහා නගර සභාව විසින් එය නිකුත්කිරීමේ පක්ෂ විපක්ෂ මහජන නියෝජිතයින් මහා නගර සභා ආඥා පනත යටතේ සාමුහිකව වගකිව යුතු වගකීම් යටතේ අදාල ආයතන පොරොන්දු වූ මිලියන 102 මුදල මොරටුව මහා නගර සභාවට ලබා නොගෙන නිකුත් කලහොත් " දූෂණය" හා ලබැඳියාවන් අතර ගැටුම් යන වරදවල් සඳහා ප්‍රානවිමේ නොහැකියාවක් නොමැත්තේය.

එබැවින් නිවාස සංවර්ධන අධිකාරිය ජනාවාස සංවර්ධන අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන නිසා මොරටුව ජනතාවට හා ජනතා නියෝජිතයින් සිටින මොරටුව මහා නගර සභාවටත්, වර්ථමාන ලුනාව Sea view Residence නිවාස සංකීර්ණයේ නිවාස මිලදිගෙන සිටින නිවැසියන්ටද

සාධාරණය යුක්තිය ඉටුකරමින් මොරටුව මහා නගර සභාව වසර ගණනාවක් භුක්ති විඳි භූක්තිය අහිමි වීම නිසා වන පාඩුව පියවීමට ලබාදීමට එකඟ වූ මිලියන 102 මුදල මොරටුව මහා නගර සභාවට ලබාගැනීමට පාර්ලිමේන්තු පාලන කටයුතු ලේකම්තුමන්ට (ඔම්බුඩ්ස්මන්/දුක්ගන්නාරාල) මැදිහත්කරුවෙක් වී වර්ෂ ගණනාවක් පවතින දුක්ගැනවිල්ල කළමනාකරණය කරමින් මැදිහත් වන ලෙස සමස්ථ මොරටු ජනතාව වෙනුවෙන් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් සහා සම්මුතියෙන් ඉල්ලා මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, යු. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා විසින් යෝජනාව ස්ථීර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන් අපි නගර සභාව පැත්තෙනුත් සී.වී.රෙසිඩන්ට් ආයතනය පැත්තෙනුත් ගත්තාම සමස්ථ සාධාරණයක් ඉෂ්ඨ විය යුතු වෙනවා.මීට පෙරත් අපි කථා කරා පරිපාලන වාර්තාවට අනුව විශේෂයෙන් එංගලන්තයේ රැජින කාලයේ ඉදලා මොරටුවේ මහා නගර සභාවේ දේපල භුක්තියක් විදියට ඇවිල්ලා තියනවා.පලාත් මාර්ග කමිටුවටත්, දිස්ත්‍රික්ක මාර්ග කමිටුවටත්, සනීපාරක්ෂක මණ්ඩලයටත්,ලෝකල් බෝඩ් එකටත් නගර සභාවටත් හා මහා නගර සභාවටත් වශයෙන්.විශේෂයෙන්ම භුක්තියත් එක්ක උරුමයත් ලැබුනා වගේම.ඉන් පස්සෙ හිමිකම් නිරවුල් කිරීමේ අධ්‍යක්ෂකවරයාගෙන් භුක්තිය සම්බන්ධයෙන් දෙවනි පන්තියේ ඔප්පුවකුත් ලැබුනා.මේ වන විට පාර්ශව දෙකක් විශේෂයෙන් නගර සභාව පැත්තෙන් අපි අපේ මිලියන එකසිය දෙකක අපිට පොරොන්දු වෙච්ච මුදල,අපිට භුක්තිය නිසා අහිමි වෙච්ච මුදල එක්දහස් නවසිය නවයෙ ඉදලා නගර සභාවට පත්වුනාට පස්සෙ ඒ කාල පරිච්ඡේදය තුල අපිට අහිමි වුනාද අලාභයක් වුනාද ඒ වෙනුවෙන් තමයි ඒ මුදල ගෙවන්නට අපි ඉදිරිපත් වුනේ.විශේෂයෙන් මගේ බලාපොරොත්තුව බවට පත්වුනේ.මේ ආයතන සියල්ලක්ම වෙනුවෙන් අපිට සාධාරණය කරන්න ආයතනයක් තියනවා මොරටුව මහා නගර සභාව වර්ග කිලෝමීටර විසිතුනයි දශම හතරක ප්‍රථම පුරවැසියා විදියට ඔතන ආසනයේ ඉන්න කොට ඔබගේ නියෝජිතයෝ විදියට අපි හැමදෙනා ඉන්නකොට අපේ යුතුකමක් සහ වගකීමක් තියනවා පලාත් පාලන ආයතනය තුල ඉන්න හැමටම යුක්තිය ඉෂ්ඨ කරනවා වගේම අපේ තියන අරමුදල් අපි ආරක්ෂා කර ගැනීම.දෙපාර්ශයටම සාධාරණයක් ඉදිරිපත් කරලා මේක පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ පාලන ලේකම්තුමා,එතුමාට ලොකු බලයක් තියනවා මේ ආයතන කැඳවලා මේක විමර්ශනයක් කරන්න.දුක්ගැනවිල්ල කළමනාකරණය කරලා විශේෂයෙන් මෙතුමන්ලාගෙ පැත්තෙන් ගත්තාම සී.වී.රෙසිඩන්ට් ආයතනයේ අපිට ලබාදෙනන් පුලුවන් අපේ මේ කටයුත්තත් එක්ක අපිට මුදලුත් ලැබෙනවා.ඒ වගේම එතුමන්ලාගෙ ප්‍රාර්ථනාත් ඉෂ්ඨ වෙනවා.මේක යෝජනාවක් විදියට සම්මත කරන අතර, සී.විවි.රෙසිජන්ට් ආයතනයේ නිවාස වාසීන්ගෙන් ඉල්ලිමක් යොමු කරන්න ඕනා.සෝඨාහය රාජපක්ෂ ජනාධිපතිතුමා එතුමාගේ බලතල පාවිච්චි කරලා ඒක ලබාදීලා තියනවා.එවකට හිටපු නගරාධිපති,සමන්ලාල් මැතිතුමාත් ඒකට විරුද්ධව යම් සටනක් කලා.එතුමාගේ පැත්තෙනුත් මම ඉල්ලීමක් කරනවා.එතුමටත් පුලුවන් නම් යෝජනාව සම්මත කරලා පාර්ලිමේන්තු කටයුතු පාලන ලේකම්තුමාට යැවුවම පස්සේ එතුමාගේ පැත්තෙනුත් යම් ඉල්ලීමක් ආවට පස්සේ සියලු කාරනා සම්පූර්ණ වෙනවා.මේක හරියටම මහජන නියෝජිත ආයතනයක්.ඒ පරමාධිපත්‍ය බලය අපිට යොමු කරලා තියෙන්නේ.පරමාධිපත්‍ය බලය වෙනුවෙන් තමයි නගරාධිපතිතුමනි පාර්ලිමේන්තු පාලන කටයුතු මන්ත්‍රීතුමාට යොමු වෙන්නෙ.මහජනතාවගෙ සල්ලි.එතකොට අපිට නොසලකා හරින්න බැහැ එක පැත්තකින්.අනෙක් පැත්තෙන් මෙතුමන්ලාගේ බලාපොරොත්තු අනෙක් පැත්තෙන් ඉෂ්ඨ නොකර ඉන්නත් බැහැ.මේ සියල්ලක්ම එකම තැනකින් සිද්ද වෙන එකම වහලක් යටතී සිද්ද වෙන තැනක් විදියට පාලන කටයුතු ලේකම්තුමාව දකිනවා. විසදුම් ගැටුම්

තියනවා.මේක මහජනතාවගෙ ආයතනයක්.යෝජනාව අපි දැම්මට පස්සෙ සියලු පාර්ෂව ගෙනල්ලා කටයුතු කරන්න එතුමාට හැකියාව තියනවා.ඒ නිසා මම යෝජනාව ඉදිරිපත් කරන ගමන් යම් විදියකින් මේ පැත්තෙන් ප්‍රශ්න මතුවුනොත් පිළිතුරු කථාවෙදි මගේ උත්තර ටික දෙන්න කැමැත්තෙන් මම නවතිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සජිත් දුමින්ද මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාව සම්බන්ධයෙන් එතුමාගේ සද්භාවය සම්බන්ධයෙන් මගේ කිසිදු ගැටලුවක් නැහැ.නමුත් මම දිගින් දිගට කාලයක් තිස්සේ මේ සභාවේ සී.වී.රෙසිඩන්ට් නිවාස සංකීර්ණයේ නිවාසවාසීන් මුණදෙන අතිෂය දුෂ්කර කටයුතු ගැන මම අවධානය යොමු කරලා තියනවා ඕනෑවටත් වැඩිය.නිවාස සංකීර්ණයේ ඉතිහාසය, හදපු අරමුණු,ඉන්පස්සෙ ඒක වෙනස් වෙච්ච ආකාරය මේ සියලු දේ සම්බන්ධයෙන් මම සභාවට ඕනෑවටත් වඩා දැනුවත්වීම් කරලා තියනවා.ඒක නිසා මම ඒ සම්බන්ධයෙන් කාලය නාස්ති කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ නගරාධිපතිතුමා.මෙතන ගැටලුව තියෙන්නෙ නිවාස සංකීර්ණයක් හදලා තියනවා.මොරටුව ඉඩම කියනවා මොරටුව නගර සභාව.හැබැයි ඒ ඉඩමට යම්කිසි වන්දි මුදලක් ඉල්ලලා තිබුනා එවකට නගරාධිපතිතුමා.ඒ වන්දි මුදල ඉඩමට දෙන්න ඔප්පුවක් තියනවාද නැද්ද කියන එක නොසලකා එවකට හිටපු විමල් වීරවංශ නිවාස ඇමතිතුමා මිලියන එකසිය දෙකක මුදලක් ලබාදීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ගන්න වුනා.නිවාස සංකීර්ණය හදනකොට මහ භාණ්ඩාගාරයෙන් නිවාස සංකීර්ණය ගොඩනැගීමට අවශ්‍ය මුදල විතරයි වෙන්කලේ .ඉඩමට මුදලක් වෙන්කරන්න ඒ මොහොතේ මහා භාණ්ඩාගාරයට මුදල් තිබුනේ නැහැ.අලුතින් මේ ඉල්ලීම ආවට පස්සෙ එවකට මමත් මහා නගර සභාව නියෝජනය කල නිසා ඉල්ලීම අපේ පැත්තෙන් ආවට පස්සෙ එතුමා යම්කිසි විදියකින් සංවේදී වෙලා ඒ ඉඩමට යම් කිසි වන්දියක් මොරටුව මහා නගර සභාවට ගෙවන්න.ඒකෙදි බැලුවෙ නැහැ ඔප්පුවක් තියනවාද කියලා.හැබැයි කැබිනට් පත්‍රිකාවක් දැම්මා.ඊට පස්සෙ කලින් සඳහන් කරාවගේ දෙදහස් පහලවෙන් පස්සෙ අමාත්‍යාංශයයි ආණ්ඩුවක් නැතිවුනා.ඊට පස්සෙ ඒක ඉස්සරහට ගියේ නැහැ නගරාධිපතිතුමා.මේක නොකියා මම අලුතින් කාරනාවක් කියන්න බලාපොරොත්තු වුනේ නිවාස සංකීර්ණය හදලා ඉවරවෙලා දෙදහස් විස්ස විසිඑක කාලයෙ නිවාස ලබාදෙන්න පත්තරවල දැන්වීම් දානවා.ඒ දැන්වීම් වල තියනවා නිවසයක වටිනාකමින් සියයට විසිපහක් ගෙවලා නිවසක් වෙන්කරන්න පුලුවන්.ඉතුරු සියයට විසිපහ ගෙවලා නිවසේ යතුර අරගෙන පදිංචි වෙන්න පුලුවන්.ඉතුරු සියයට පනහ ගෙවන්න බැංකු ණයක් ලබාගැනීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මැදිහත් වෙනවා. අන්න ඒ දැන්වීම අනුව මොරටුවේ ජනතාව ගොඩාක් අය නිවාස ගන්න ආවට නිවාස පොඩි නිසා ඒවා ප්‍රතික්ෂේප කරා.වර්ග අඩි හාරසිය පනහයි.පොඩි කාමර දෙකයි සාලයයි තියෙන පොඩි ගෙයක්.ඊට පස්සෙ මේක විකුණා ගැනිමේ ගැටලුවක් තිබුනා.මම මේ කතා කරන්නේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් නෙමෙයි.ඊට පස්සෙ නිවාස අධිකාරිය එවකට හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතට පත්වෙනවා.ඊට පසු නිවාස සංවර්ධන අධිකාරිය මතුකරපු කාරනයක් තිබුනා.ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගෙ කාලයේ අහුලාන නිවාස සංකීර්ණයේ ගෙවල් එකසිය තිස්පහක් විතර දීලා ඉතුරු කරලා තිබුනා.ඒක ඉතුරු කලේ තට්ටයා පාලමේ ඉදලා ලුනාව වෙරළ තීරයේ අයට නමුත් ඒ අය පෙළඹුනේ නැහැ.සල්ලි අය නොකර වෙනත් පාර්ශවයන්ට ගෙවල් දීලා තිබුනා.කළාකරුවන්ට,ක්‍රීඩකයන්ට.රජයේ මුදල් වලින් හදපු ගෙයක් යම් කිසි තක්සේරුවක් කරලා යම් කිසි සහන මුදලක් අයකරගන්න ඕනා ඒ පනතේ හැටියට.නමුත් ඒක නොකර නිකන් දුන්නා.අන්න ඒ කාරනාව පාවිච්චි කරලා ඒක ලොකු බිල්ලෙක් බවට පත්කරලා තමයි මහින්ද රාජපක්ෂ මහතාගේ කාලයේ කිව්වෙ ආණ්ඩුව වෙනස් වුනොත්

ඇමතිවරුමේ ගෙවල් නිකන් දෙයි කියලා මේක විකුණුම් පදනමකට දෙන්න කියලා.අන්න ඒ අනුව තමයි යාපනයේ කිලිනොච්චියේ,මඩකලපුවේ සල්ලි තියෙන අය සමහරු එක්කෙනා ගෙවල් දෙකතුන ගත්තා. ඒ අය අරගෙන සමහරු කුලියට දීලා තියෙනවා.ගරු නගරාධිපතිතුමනි,මම මතුකරන්නෙ දැන් යථාර්ථය ඒ ගෙවල් වල මිනිස්සු ඉන්නවා ආණ්ඩුවේ ආයතනයකට සල්ලි දීලා ගෙවල් අරගෙන අද ඒ නිවාස වාසීන්ට කිසිදු හිමිකමක් වරිපනම්,නොපවරා ගැනීමේ සහතික ඇතුලු අදාල හිමිකම් නොමැති වීම නිසා බැංකු ණයක් ලබාගැනීමට ජනතාවට බැරිවුනා.මේ කඹ ඇදීම නිසා නගර සභාව හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මිලියන එකසිය දෙකක් නෙමෙයි ගරු නගරාධිපතිතුමනි,එක්දහස් දෙසියක් ගත්තත් මම අත උස්සනවා මොරටුව නගර සභාව වෙනුවෙන්.ඒ ගැන කිසිම තර්කයක් නැහැ.හැබැයි දැන් ප්‍රාණ ඇපකරුවොා බවට පත්වෙලා ඉන්නෙ ජනතාව.අවුරුදු හතරක් තිස්සෙ තමන්ට බැංකු ණයක් ගන්න බැරුව,වාරිකයක් ගෙවා ගන්න බැරුව හිටපු ජනතාව අද වෙනකොට අමතර පොලියක්.මම ගත්තොත් මම ලක්ෂ හතහමාරක් ගෙවන්න ඕනා මගේ මූලික මුදලට අමතරව.ඒක වුනේ නගර සභාව විසින් වරිපනම් හා අනෙකුත් ලේඛන නොදීම නිසා අපිට බැංකු ණයක් ගැනීමේ පහසුව නැති වෙච්ච නිසා.නාගරික සංවර්ධන අධිකාරියේ වගකීම වෙනම තියනවා.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි,මේ ප්‍රශ්නෙදි සජිත් දුමින්ද ඇමතිතුමා වගේ ඉන්න මන්ත්‍රීතුමා මේ දාපු යෝජනාවේ සද්භාවය සම්බන්ධයෙන් මගේ කිසිම ගැටලුවක් නැහැ.හැබැයි මේ කාරනා ප්‍රමාද වෙන්න වෙන්න නිවාස වාසීන්ට වෙන අසාධාරණයක්.ඔවුන්ට වරිපනම් අංකයක් ගන්න බැරි වෙන්නෙ අවාසනාවට.මම පසුගිය මුදල් කමිටුවට ආවා.තක්සේරු නිලධාරීතුමිය හොඳ කරුණක් ප්‍රකාශ කරා.මුදල් කමිටුවේ එක තැනක වරිපනම් පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගුනා.ඒක අනවසරයි කියලා.ඒ වෙලාවෙ ඔබතුමා චින්තා මහත්මියගෙන් අහනවා ඒ අනවසර ඉඩම ඉදිකිරීමට ඔයා කොහොමද වරිපනම් තක්සේරුව කලේ.චින්තා මහත්මිය හරි අපූරු සහ ඉතා වැදගත් ප්‍රකාශයක් කරා.එතුමිය කිව්වා වරිපනම් දෙන්න අනවසරද කියලා බලපාන්නෙ නැහැ.අනවසර ඉදිකිරීම් වලටත් වරිපනම් දෙනවා කියලා.එතකොට මම නැගිටලා ඇහුවා සී.වී.රෙසිඩන්ට් නිවාස සංකීර්ණයේ අපි අනවසර තරම්වත් නැද්ද කියලා.ජනතාවට වෙන අසාධාරණයට කවුද සාධාරණයක් ඉටු කරන්නෙ.

<u>ගරු නගරාධිපතිතුමා - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,සැප්තැම්බර් මාසයෙ ඇතුලෙ මේ ප්‍රශ්නය විසඳනවා.ජනාධිපතිතුමා,කැබිනට් එක කියද්දි අපි ස්ථාවරයේ හිටියා මොකද අපිට විරුද්ධව ඔඩිට් ක්වරි එකක් තිබුනා.මේ වෙනකොට ඒක අයින් කරගෙන තියනවා.මොරටුවට විශාල පාඩුවක් වුන බව අපි කවුරුත් පිළිගන්නවා.අපි ඒක කිසි ලෙසකින් අත්හරින්නෙ නැහැ.ජනතාව තවදුරටත් ප්‍රාණ ඇපය තියාගෙන ඉන්න සූදානමකුත් නැහැ.ඒකත් අපි කරන බලවත් වරදක් විදියට තමයි දැන් මේ තියෙන්නේ.ඒ නිසා ජනතාව නිදහස් කරනවා. නීත්‍යානුකූල ඉඩම සනාථ කරන්න ඔප්පු තිරප්පු නැති නිසා දෙන්න බැහැ කියලනෙ කියන්නෙ.හැබැයි අපිට ඔප්පු කරන්න පුලුවන්නෙ ගෙවල් වික්කා කියලා.මේක මහ භාණ්ඩාගාරය පැත්තෙන් අපේ බජට් එකට ආදායමක් විදියට පෙන්නනවා.අපි දිගටම මේ මුදල ලබාගැනීම වෙනුවෙන් අපිට කල හැකියි.සජිත් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත්ම හොඳ එකක්.අපි විටින් විට මෙවැනි සභාව විසින් අනුමත කරගන්නා යෝජනා ඇතුලෙ දිගටම උත්සාහ කරමින් මේ මුදල නැතත් නිවාස පන්සියයක ව්‍යාපෘතියක්වත් එකග කරගනිමින් තමයි මම ඉන්නෙ ස්ථාවරයේ.යථාර්තය තියෙන්නෙ මේ නිවාස පද්ධතියේ මිනිස්සු ඉතාම අසීරු තත්ත්වයකට පත්වෙලා තියෙන්නේ.තමන් ණයට ගෙවල් ගත්තා.ණය ගෙවාගන්න විදියක් නැහැ.අපි ඒ මිනිසුන්ට අවශ්‍ය කරන සහතික ටික දෙන්නෙ නැහැ.ජනතාව නිදහස් කරොත් තමයි ඒ ගොල්ලන්ගෙන් මහ භාණ්ඩාගාරයට යැවිය යුතු ලොකු මුදලකුත් තියනවා.ඒ මුදල් ටික යන්නෙ.ඒ

නිසා මේ පටලැවිල්ල ලිහාගන්න වෙනවා.යම් ඉවසීමක් දරා ගැනීමක් අපිට කරගන්න වෙනවා.එය කරන්න මම සූදානම්.එය ඉතාම කඩිනමින් නිදහස් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,බොහොම ස්තුතියි මම විශ්වාස කරනවා ඔබතුමාව.මට මෙතන මහ විශාල ගැටුමක් නැහැ.සජිත් මන්ත්‍රීතුමා මතු කරපු කාරනයට.ඔබතුමා සඳහන් කරපු කාරනා එක්ක මම එතනින් එහාට කතා කරන්න යන්නෙ නැහැ.හැබැයි එක කරුණක් කියන්නම් මුදල් ගැනීම සම්බන්ධයෙන්.එයාලගෙ මතු කරන කාරනාවක් තමයි.එයාලට ඔප්පුව දීලා තියනවා.ඒ නිසා සනාථ කරන්න ඔප්පුවක් නැති නිසා අපිට මුදල් දෙන්න බැහැ. ගරු නගරාධිපතිතුමනි,විමල් වීරවංශ සහෝදරයා නතර කරපු තැනින් පටන් ගන්න.සල්ලි දෙනන් නම් කැබිනට් පත්‍රිකාවක් දාන්න ඕනා.වරිපනම් නවත්තන්නවත් ඕනා නැහැ.කැබිනට් පත්‍රිකාවක් ගරු විමල් රත්නායක ඇමතිතුමාට මිලියන එකසිය දෙක හෝ ඊට සමාන අගයකින් යුත් ව්‍යාපෘතියක් මොරටුවට ලබාදෙන්න කියලා කැබිනට් පත්‍රිකාවක් දාන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ සම්බන්ධයෙන් ඔබතුමා කියපු කතාවත් එක්ක සහ සුරේෂ් මන්ත්‍රීතුමා කියපු කතාවත් එක්ක පොඩි වචනයක් කියන්න ඕනා.ලක්ෂ එක්දහස් දෙසිය නෙමෙයි ගාන දැන් මීට වඩා වැඩියි.ඒ මුදල සභාවට ලැබීමට අපි ෆයිට් කරන්නෙ.මේක මොරටු ජනතාවට හිමි මුදලක්.අපිට පොඩි හරි කුහකත්වයක් තියනවානම් මේක ලැබුනොත් එහෙම ඔබතුමන්ලාගේ පාලනයට තමයි ලැබෙන්නෙ.ඒ තුලින් ඔබතුමන්ලා ප්‍රමෝට් වෙනවා කියලා එහෙම එකක් නෙමෙයි අපිට තියෙන්නෙ.මොරටුව ජනතාවට වෙන්න යන අසාධාරණය ගැන අපි කියන්නෙ ඔබතුමාට මෙක දෙන්න ඕනා.හැබැයි අසාධාරණය කරන්නෙ අපි නෙමෙයිනෙ.ඒ මිනිසුන්ට ණය ගෙවාගන්න බැරිවුනේ මොරටුව මහා නගර සභාව නිසා නෙමෙයිනෙ.මේක අදාල ආයතනය තමයි සල්ලි ගත්තෙ.බිලියන දාහතකට වඩා වැඩි මුදලක් අරගෙන තියනවා.අපි ඉල්ලුවෙ බිලියන එක්දහස් දෙසියයි.ලැබිච්ච මුදලෙන් සුළු මුදලක් තමයි අපි ඉඩමේ වටිනාකමට ඉල්ලලා තියෙන්නෙ.මේක මහා භාණ්ඩාගාරය හරි කවුරුහරි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නෙ අපි ගාව තොරතුරු තියනවා.මේ ඉඩම නගර සභාවට අයිතිය තියන්න කියලා තොරතුරු අපි ගාව තියනවා.අපිට ඔබතුමාට ඒක දෙන්න පුලුවන්.ඒක සභාවෙත් ඇති.ඒ නිසා අපි කියන්නෙ අපි නඩුවකට හරි ගිහිල්ලා අපි දෙගොල්ලො එකඟතාවයකට ඇවිල්ලා වරිපනම් උසාවිය හරහා නිදහස් කරමු.වරිපනම් නිදහස් කරාට පස්සෙ අපි කාත් එක්කද මේක බෙරගන්නෙ.අපිට කිසිම දෙයක් නැනෙ.ඔක්කොම සම්පූර්ණයෙන්ම ගිහිල්ලා ඉවරයි.ඊට පස්සෙ මොනවා දැම්මත් වැඩක් නැහැ.ඒ නිසා ඔබතුමාට ස්තුති වන්ත වෙනවා.ඔබතුමා දැඩි ස්ථාවරයක ඉදලා තියනවා සෑම සාකච්ඡාවකදිම සභාව පැත්තෙ.මේ වෙලාවෙත් අපි කියන්නෙ පැහැදිලිවම මේ මුදල අපේ සභාවට ගන්නනම් අපිට තියන අවසාන අවස්ථාව මේක.මේ අවස්ථාවට කොහොමහරි නඩුවක් හරි දාලා නීතිමය පියවර හරි අරගෙන මේක කරන්න උත්සාහ කරන්න කියන ඉල්ලීම තමයි මොරටුව ජනතාව වෙනුවෙන් කරන්න තියෙන්නෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සජිත් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපිත් ආණ්ඩු පක්ෂයෙ ඉන්නකොට කතා කරා කොහොමහරි කරලා සභාවට අයිති මුදල අයකරගන්න ඕනා කියලා.ගොඩාක් වෙලාවට හිටපු නගරාධිපතිතුමාත් මාත් තැන් තැන් වල රැස්වීම් වලට ගිහිල්ලා සාකච්ඡා කරලා කොහොම හරි ෆයිට් කරලා මේක අපේ සභාවට ගන්න තමයි අපි ට්‍රයි කලේ.නමුත් ඒක ගිලිහිලා ගියා.දැන්

ඔබගේ පාලන කාලේ ඔබ ලොකු උත්සාහයක ඉන්නෙ.කොහොම හරි අපි ඒක කරමු.අපි හිතුවෙ ඒකෙන් සල්ලි අරගෙන රංගන මධ්‍යස්ථානයක් දාන්න.ඇමතිවරු එක්ක ගිවිසුම් වලට ආවා.අපි කිව්වෙම අපේ සල්ලි අපිට දෙන්න.ඒ සල්ලි වලින් රංග ශාලාව හදන්න ඕනා කියලා.ඔබතුමා හොඳ තැනක ඉන්නවා.අප ඔබතුමා සමග එකතැන හිටගන්නවා නගරාධිපතිතුමා මේක අපේ සභාවට අයිති විය යුතුයි කියලා.ඔබතුමා ගන්න ඕනම තීරණයකට අපි එකඟ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.චන්දන පී.චිත්‍රානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සීවිච් රෙසිඩන්ට් නිවාස සංකීර්ණය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් නිවාස ව්‍යාපෘතියේ පදිංචිකරුවන් මොරටුවේ පුරවැසියන් වෙලා ඉවරයි.ජනතාවගේ අයිතිවාසිකම ආරක්ෂා කරදීමේ වගකීම අපිට තියනවා.මේ දේපලේ අයිතිවාසිකම මොරටුව මහා නගර සභාව හා බැඳෙන්නේ එක්දහස් නමසිය දහයෙ වගේ කාලයෙ ඉඳලා.ඒ කාලෙ ඉඳලා ආපු අයිතිවාසකම අපේ පූර්වගාමී ආයතනවලට පැවරිලා ඊට පස්සෙ මේ තානායමේ ඉඩම මොරටුව මහා නගර සභාව මේ දේපල සම්බන්ධයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සමග යම් ගිවිසුමකට එලඹී ඇති බව තමයි මම දන්නා තරමින් මගේ දැනීම. මා ඒ ගිවිසුම දැකලා නැහැ.ඒ සම්බන්ධ ගිවිසුමක් තියනාවාද කියන එක මේ සභාව දැනුවත් වෙන්න ඕනා.කෙසේ නමුත් මේ දේපල නිශ්චිතව අපි භුක්ති විඳපු දේපලක්.එසේ භුක්ති විඳපු අවස්ථාවදි තමයි මේක රජයේ ප්‍රකාශයක් හැටියට ජනාධිපතිවරයා හරහා නාගරික සංවර්ධන අධිකාරිය ලබාගන්නේ.ඒ අවස්ථාවේ දෙපාර්ශවය අතර තිබුන එකගතාවය තමයි මිලියන එකසිය දෙකක් ලබාදීම.ඒ අනුව නිවාස ව්‍යාපෘතියේ ඩනතාව පදිංචි වෙලා තියනවා.ඒ අය මොරටුවේ පුරවැසියන් වෙලා තියනවා.ඒ පිරිසගේ අයිතිවාසිකම් අහිමි කිරිමට කිසිසේත්ම අවශ්‍යතාවයක් නැහැ.ඒ ස්ථාවරයේ ඔබතුමත් ඉන්නවා.නමුත් අපිට අයවිය යුතු එකසිය දෙක අපි කෙසේ හෝ අයකරගන්න ඕනා.විශේෂයෙන්ම පලාත් සභා ඇමතිවරයා හරහා මම හිතන්නේ මහා මාර්ග සංවර්ධන අමාත්‍යවරයා හරහා තමයි කැබිනට් සංදේශයක් ඉදිරිපත් වෙලා තියෙන්නේ.සංදේශ ප්‍රකාරව දැන් වරිපනම් අංක ලබාදීම සඳහා නිර්දේශයක් නිකුත් වෙලා තියනවා.ඒ අතරම කෙසේ හෝ කැබිනට් සංදේශයක් හරහා හෝ සුදේෂ් ඉන්දික මන්ත්‍රීතුමා පෙන්වා දෙන්න උත්සාහ කරා මේ කාරනය.මේ අයවිය යුතු මිලියන දෙක මේ සභාවට ලබාගෙන මොරටුව ජනතාවට අය විය යුතු මුදල අයකරගන්න විශාල උත්සාහයක යෙදෙනවා.මේ උත්සාහය සියලු දෙනා එකතු වෙලා යථාර්තයක් කරගැනීම සඳහා මම හිතන්නේ ඒ සම්බන්ධයෙන් තවත් අවශ්‍ය යම් සහයෝගයක් අවශය වන විශේෂඥ දැනුමක් තියෙන අය එකතු කරලා කමිටුවක් පත්කරලා මේ කරුණ සාර්ථක කරගැනීම සඳහා කටයුතු කිරීමට ඔබතුමාට හැකිවෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,කවුරුත් තේරුම්ගත යුතුයි.අපි ඉන්නත් පුලුවන් නැතිවෙන්නත් පුලුවන්.මගේ තියෙන නීතිය අබවෝධය ලොකු එකක් නොවෙන්න පුලුවන්.මට හිතෙනවා ජනාධිපතිවරයෙක් පවරා ගැනීමක් කරාට පස්සේ ජනාධිපතිවරයාගේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහලින්ම පිහිටලා තියෙන්නේ.ජනාධිපතිවරයෙක් අදාල පවරාගැනීම කරාට පස්සේ එතනින් පහල අභියෝගයක් කරන්න ඉඩක් නැහැ කියන තැන තමයි මම ඉන්නෙ.දැන් අපි කල්පනා කල යුතුයි සභාවක් ලෙස අපිට තියනවා වගකීමක් මේක අපි අත්දැකීමක් කරගෙන මේ සභාව සතු විශාල දේපල ප්‍රමාණයක් තියනවා ඒ වගේ නිශ්චිත ඔප්පු තිරප්පු හදලා අවසන් කරලා නැති.මේ සභාවේ හැම මන්ත්‍රීවරයාටම තියෙන ලොකුම වගකීම තමයි සභාව සතු ඉතුරුම් මහා නගර සභාව සතු දේපල ලෙස නම් වෙලා තිබුනට අපි භාවිතා කරාට මේවාට නිශ්චිත කරපු ඔප්පු තිරප්පු අයිතිය ගත්තොත් සෑහෙන,අපි පහුගිය කාලෙ ගත්තොත් චුල්ලරත්න මහතාගේ පිටවීම අපට කරන ලද විශාල ඩැමේජ් එකක්.මේ අවස්ථාව කරගමු ඉතාම ඉක්මණින් ඒ තියෙන දේපල ටික සභාවේ

නිශ්චිත දේපල බවට තහවුරු කරන ලියකියවිලි ටික හදාගන්න.ඒ කාරනාව වෙනම ගත්තොතින් අපි ඒ ජනතාව නිදහස් කරමින් එහෙත් අපිට ලැබිය යුතු මුදල ලබාගැනීම සඳහා අපිට අනවර්ත සටනක් කරන්නම වෙයි.ඒක අත්නොහැර ඒ කටයුත්ත කරමු.රාජ්‍ය ආයතන තව රාජ්‍ය ආයතනයකට විරුද්ධව නඩු කියාගන්න එපා කියලා නීතිපති කියනවා.අපේ කැමැත්ත නෙමෙයි රජයේ අදාල නීති ක්‍රියාවලියේ තහවරු වෙලා තියෙන්නෙ.අපට සමහර ඒවලදි අකමැත්තෙන් වුනත් එකඟ වෙන්න වෙනවා.අපි කවුරුත් කැමතියි මොරටුවේම පදිංචි වෙච්ච ජනතාව තව දුරටත් ප්‍රාණ ඇපය තියාගෙන මේ ගණුදෙනුව කරන එක සාධාරණ නැහැ.ඒ ජනතාව නිදහසු කරලා මේ ගණුදෙනුව අතනොහැර.සජිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව මේ වෙලාවෙ වැදගත් වෙන්නෙ එතනට. එය පමණක් නෙමෙයි තව දුරටත් විවිධ ක්‍රම ඇතුලෙ මේ මුදල ලබාගැනීම හෝ මේ මුදලෙ වටිනාකමට අදාල නිවාස ව්‍යාපෘතියක් මොරටුවට ඉල්ලා ගැනීම තමයි මා අදහස් කරමින් ඉන්නෙ.මට ඉඩම් හොයලා දෙන්න කිව්වා.මම කිව්වා ඉඩම් හොයලා දෙන්නම් අපිට නිවාස ව්‍යාපෘතියක් දෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඔබතුමා කිව්ව ප්‍රශ්නෙදි ප්‍රාදේශීය ලේකම්තුමා පහුගිය කාලෙ නගර සභාව සතු දීර්ඝ කාලයක් පාවිච්චි කරපු ඉඩම් කීපයක් අත්පත් කරගන්න කටයුතු කරා.කවදාවත් මෙහෙම වෙලා තිබුනෙ නැහැ කිසිම ප්‍රාදේශීය ලේකම් වරයෙක් යටතේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,ඔබේ ප්‍රකාශය නිවැරදි නැහැ.අපේ කිසිම ඉඩමක් ප්‍රාදේශීය ලේකම් පවරාගෙන නැහැ.භාවිතයයි පවරාගැනීමයි කියන්නේ දෙකක්.මොකක් හරි ක්‍රමයකින් තහවරු කරගන්න ඕනා ආයතනය සතු දේපලක් ලෙස.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම කලින් සඳහන් කරා.අපිට නිශ්චිත ඉඩම් නිලධාරියාගේ අවශ්‍යතාවය තියනවා.ඒ ඉඩම් නිලධාරියා හරහා අපි ඉඩම් හදුනාගෙන අපේ අයිතිය තහවුරු කරගෙ එහෙම නැත්නම් පැවරුම් ඔප්පුව මත හරි නිත්‍යානුකූල අයිතිය රැකගෙන අපිට දීර්ඝ කාලීනව පැවතගෙන එන ඒවා කාටවත් අත්පත්කර ගැනීමට නොදී ඉදිරියට අරගෙන යන්න.මේ ප්‍රශ්නෙදි මෙම ආයතනය මේ ගෙවල් ටික සම්පූර්ණයෙන්ම විකුණලා තියනවා.ගෙවල් තුන්සිය පනස්ගානක ප්‍රමාණයක්.මේක ලක්ෂ පනහ ගානෙ විකුණුවත් කෝටි එකසිය හැත්තගානක් එනවා.අපි ඉල්ලන්නෙ කෝටි දහයක වගේ මුදලක් ඉල්ලන්නෙ.මේක සාධාරණ තත්ත්වයක් තියෙන්නෙ. ඔබතුමාට ඕනනම් විපක්ෂයේ මන්ත්‍රීවරුන් අවශ්‍ය තැන්වලට ගිහිල්ලා සහයෝගය ලබාදෙන්න ඉදිරිපත් වෙන්නම්.කොහොමහරි මේ මුදල ලබාගමු.සජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ එතනින් බැරි වුනත් නීතිමය පැත්තට ගිහිල්ලා උසාවිය හරහා ජනතාවට අසාධාරණ නොවන විදියට වරිපනම් ලබාදීමට කටයුතු කිරීමේදී අපි බැදීමක් තියනවා.නැත්නම් ආයතනය අපෙන් ගිලිහුනාට පස්සේ මේ මුදල අපෙන් කොහෙත් ගන්න වෙන්නෙ නැහැ.යෝජනාව එතනයි ක්‍රියාත්මක වෙන්න ඕනා කියන තැන අපිත් ඉන්නවා කියලා මේ අවස්ථාවේ මතක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කිව්වා හරි. ජනාධිපතිවරයෙක් පවරාගත්තට පස්සෙ ජනාධිපතිතුමාගේ පැවරීම තුල විශේෂයෙන් දහතුන්වන සංශෝධනයේ ඉඩම් සම්බන්ධ බලතල ආණ්ඩුකාරවරයා හරහා අවසාන වශයෙන් ජනාධිපතිවරයාට එනවා.ඒ නිසා ඒකට අභියෝග කරන්න බැහැ.හැබැයි අපි අභියෝග කරන්නෙ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේක පවරා ගැනීම සම්බන්ධයෙන් නෙමෙයි.නගරාධිපතිතුමනි,අපි කරන්නෙ අපේ භුක්තිය

සම්බන්ධයෙන්.එක්දහස් නමයිය නමයේ පරිපාලන වාර්තාවට අනුව ඊට පස්සෙ අඛණ්ඩව අවුරුදු අසුවක් නගර සභාවක් විදියට අපි භුක්ති විඳපු මේ ඉඩම විශේෂයෙන් දෙවැනි ඔප්පුවක් විදියට හිමිකම් නිරවුල් කිරීමේ අධ්‍යක්ෂකවරයා නිකුත් කරනවා.නිකුත් කරාට පස්සෙ ඔප්පුව නැවත වතාවක් ඔප්පුව අවලංගු කරන්නෙ වෙන හේතුවක් නිසා නෙමෙයි නගරාධිපතිතුමනි,මේ ඉඩම රැජින විසින් අත්පත් කරගත්තට පස්සෙ ඒ රාජ්‍ය විසින් පවරගත්ත කොටස ජනාධිපතිවරයා අත්පත් කරගන්නවා. ඒනිසා තමයි දෙවැනි පන්තියේ ඔප්පුව අවලංගු කරන්නේ.නමත් අපිට පලමුවන පන්තියේ ඔප්පුවක් ලැබිය යුතු අවස්ථාවක් ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන් අපේ ඔප්පුව පවරද්දි ප්‍රධාන ක්‍රම හතරක් තියනවා.පරම අයිතිය ලබාදෙනවා,එහෙම නැත්නම් භුක්තිය ලබාදෙනවා.පැවරුම් ලිපියකින් ලබාදනවා.අපට භුක්තිය ලබාදිලා තිබුනෙ.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි,දෙවැනි පන්තියේ හිමිකමක් තිබුන අපිට පළමුවන පන්තියේ හිමිකමක් ලබාගැනීමට නොහැකි වුනේ මේ කාරනාව නිසා.සේනක මන්ත්‍රීතුමා මතු කරපු විදියට මේ වෙනකොට කෝට් එකසිය හැත්තපහකට ආසන්න මුදලක් ඔවුන් ලබාගෙන තියනවා.අපි ඉල්ලන්නෙ කෝටි දොලහයි.අවුරුදු අසුව තුල අපි භුක්ති විඳලා වෙන වැඩකට පාවිච්චි කරානම් ඒ තියෙන අවස්ථික පිරිවැය නිසා අපිට ලැබෙන්න ඕන මුදල තමයි අපි කියන්නෙ.මේකෙදි අපි කියන පාර්ලිමේන්තු පාලන කටයුතු ලේකම්වරයාට මැදිහත් වෙන්න වෙන්නෙ ජනාධිපතිවරයාගේ කාරනාව නිසා නෙමෙයි විශේෂයෙන් අපේ ඔප්පු අපිට කියන හිමිකම දුගී දුප්පත් පැල්පත් වාසීන්ට ජනාවාස කියන සංවර්ධන අරමුණු වෙනුවෙන් ඉඩම් නිර්මාණයට ගෙවල් නිර්මාණය කලේ.සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා මතුකරපු විදියට යම් විදියකින් ඉල්ලීමක් කරලා තියනවා.අපි ඉල්ලන්නේ පාලන ලේකම්තුමා හරහා කෝටි එකසිය හැත්තපහකින් නගර සභාවට ලැබිය යුතු කැප කිරීමේ ආවස්ථික පිරිවැයේ කෝටි දොලහ විතරයි.ඒකට හොද මැදිහත් කිරීමක් ජනතාව පැත්තෙන් අපි ඉල්ලීම ඉදිරිපත් කරනවා.ඒත් එක්කම සීවී රෙසිඩන්ට් ආයතනයේ ඉන්න ජනතාවටත් ලොකු අකරතැබ්බයක්.එහෙම නැත්නම් ඔබතුමා කිව්වා වගේ නිදොස් කොට නිදහස් කරනන් ඕනා.ප්‍රාණ ඇපකරුවකු බවට පත්වෙලා තියනවා අවුරුදු හතරක්.ප්‍රාණ ඇපයෙන් නිදහස් වෙන්නත් සීවී රෙසිඩන්ට් ආයතනයෙන් නිදහස් වෙන්න ඕනා.මේ අපේ යෝජනාවට සමගාමීව පාලන කටයුතු ලේකම් ඔම්බුට්ස්මන්ට්ට ලිපියක් යවන්න කියලා ඔවුන්ගෙ ඉල්ලීම පැත්තෙන්.මම ඉස්සෙල්ලා කිව්වෙ හිටපු නගරාධිපති ඇතුලු සියලුම දෙනාගේ වගකීමක් එතුමාලගෙත් ඉල්ලීමක් තියනවා ඉල්ලීම් ලිපිත් එක්ක.මේ යෝජනාව සාර්ථක කරගන්න දක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ගොඩදෙනෙක් ඉන්නවා.මේක පෙත්සම් කාරක සභාවටත් යොමු කරන්න බලාපොරොත්තුවක් තියනවා මගේ ඉල්ලීමක් විදියට සභාවක් විදියට කරාට පස්සේ ඒ ඒ මන්ත්‍රීවරු කතා කරාට පස්සෙ පෙත්සම් කාරක සභාව හරහා එන යෝජනාවන් ඔම්බුට්සමන්ට් යනවා.අනෙක් පැත්තෙන් මේ යෝජනාවන් ටික ආවට පස්සෙ මේ මහජනතාවගෙ ඉල්ලීමක්.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි,කෝටි එකසිය හැත්තපහක ජනාවාස සංවර්ධන අධිකාරියේ තිබෙන ගිණුමෙන් මේකට නොදෙන්න හේතුවක් නැහැ.ඒ වගේම ඔබතුමන්ලාගේ අමාත්‍යතුමන් හරහා කැබිනට් ප්‍රකාශයක් එනකොට එකසිය හැත්තපහකට සල්ලි තියෙන මේ කෝටි ගානෙන් කෝටි දොලහක් මේ අහින්සක නගර සභාවට දෙන්න පුලුවන් කමක් නැහැ.ඒ නිසා අවුරුදු හතරක් ප්‍රාණ ඇපයේ හිටපු ප්‍රාණ ඇපකරුවන් නිදහස් කරලා මොරටුව නගර සභාවේ යුක්තිය ඉෂ්ඨ කිරීමට ලබන පලවෙනිදාට අපට හැකියාවක් ලැබෙයි.ඒකට සියලු දෙනා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කැපකිරීම මොරටුව ජනතාව වෙනුවෙන් ඔබෙත් අපෙත් කැප කිරීම කරමු මොරටුව ජනතාව වෙනුවෙන්.ස්තූතියි.

අංක 05(01) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05(02) මහා නගර සභා මන්ත්‍රී, බී.සජිත් දුමින්ද පීරිස් මහතා විසින් කල් දී ඇති යෝජනාව,

මොරටුව මහා නගර සීමාව තුල එහි අභිමානය පෙන්නුම් කරන මොරටුව නගර මධ්‍යයේ තිබෙන "ඓතිහාසික ඔරලෝසු කණුව" මේ වන විට වේලාව නැවතී දුර්වර්ණ වී අබලන් තත්ත්වයකට පත්ව ඇත. නැවතත් එහි ඓතිහාසිකත්වයට පණදී වේලාව වැඩ කරන විරාජමාන ඔරලෝසු කණුවක් බවට පත් කිරීමට හා නඩත්තු කිරීමට පිරිවැය දරණ ලෙසත්, නඩත්තු කටයුතු සිදුකරන ලෙසත් ඔරලෝසු කණුව ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රමයටම ගොඩනඟන ලද ඔරලෝසු කණුව ඉදිරිපිට පිහිටා ඇති කොමර්ෂල් ක්‍රෙඩිට් ආයතනයට පවතින නීතික්‍රම වේද හා ගිවිසුම් රේගුලාසි යටතේ මොරටුව මහා නගර සභාවේ අධිකලනය යටත් ගිවිසුමකට එලඹීමට කටයුතු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,ඔරලෝසුව අකර්මන්‍ය නැහැ.වයින් කරාම තමයි දවස් හතක් වෙලාව යන්නෙ.වයින් කරන සේවක මහතා විශ්‍රාම ගියා.ඔහුව ගෙන්වාගෙන තව සේවක මහතෙකුට පුරුදු කරා.ගැටලුවක් තියනවා.ඇතුලෙ යකඩ සැලකිය යුතු ප්‍රමාණයකින් දිරාපත් වෙලා තියෙන්නෙ.කොන්ක්‍රීට් කඩා වැටීමකුත් තියනවා.ඒ නිසා මොරටුව විශ්ව විද්‍යාලයට දැනුම්දීමක් කරලා තියනවා තත්ත්ව වාර්තාවක් අරගෙන දෙන්න.ඒ පිළිබඳව සහතිකයක් අරගෙන වැඩේ ආරම්භ කරමු.

මහා නගර සභා මන්ත්‍රී,ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා විසින් යෝජනාව ස්ථීර කරන ලදී.

අංක 05(02) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (02) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(03) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව,

අඟුලාන පොදු සුසාන භූමිය පිටුපස ඇති අලංකාර වෙරළ තීරය ළමා උද්‍යානයක් හා සමාන්‍ය ජනතාවට විවේක සුව විඳීමට සකස්කර දිය යුතු යැයි ද එසේම එම ළමා උද්‍යානයේ ක්‍රීඩා උපකරණ සවිකිරීමෙන් එවා භාවිතාවේදී යම් කිසි මුදලක් අය කොට එය මෙම උද්‍යානයේ නඩත්තු කටයුතු සඳහා යෙදවිය යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, ඩී.සමන්ත සිල්වා මහතා විසින් යෝජනාව ස්ථීර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා.</u>

ගරු මන්ත්‍රීවරුනි,අඟුලානෙ ආදාහනාගාරයේ මැෂින් එක පටන් ගන්නවා.අපි ඒකත් එක්කම එතන තියෙන තීරයේ ජනතාව අනවශ්‍ය දේවල් ගොඩාක් දාලා තියෙන්නෙ.ලඟදීම දිනයක් යොදාගෙන ඒ ටික සුද්ධ පවිත්‍ර කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඒ පැත්තට ඔබතුමාගේ අවධානය යොමු කිරීම හොඳ දෙයක්.වෙරළ තීරය වගේම සුසාන භූමිය ඇතුලත ජරා ජීර්ණය වෙලා තියෙන්නෙ.ලේකම්තුමා කිව්වා වතුර ලයින් එකක් දීලා තියෙනවා කියලා.අපේ වතුර ලයින් එකෙන් මේ වෙනකොටත් හොරෙන් වතුර

ගන්නවා.මීටරයේ පොටෝ එකක් ගහගෙන ආවා.සභාවේ දෙයන් නිසා අපි රැකගත යුතුයි.මගේ යෝජනාවල් සියල්ලම වගේ දැක්කා.මගේ එක යෝජනාවක්වත් ඔබතුමන්ලා මැදිහත් වෙලා ඉෂ්ඨ කරලා දුන්නෙ නැහැ.අඩුම ගානේ පාලම ලග දෙපැත්තෙ අත්වැටවල් නැහැ.ලක්ෂ දෙකහමාරක තුනක මුදලක් යන්නෙ.ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ඒකවත් කරලා දෙන්නෙ නැහැ.මුදලුත් අනුමත වුනා.ඒ පැත්තට ඔබතුමගේ අවධානය යොමු කිරීම ජනතාව වෙනුවෙන් ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.

අංක 05(03) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා.</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05 (03) දරණ යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත කමිටුවට යොමු කරනවා.

06. <u>2026 අගෝස්තු මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම.</u>

06(1) 2026.08.07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(02), 02(03), 02(04), 02(06) සහ 03 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සජිත් දුමින්ද පීරිස් මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	යු. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසිනා බක්කර් මහත්මිය
9.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනෙවිය
20.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන්ත සිල්වා මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.07 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය)

06(2) 2026.08.07 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 02(02) සම්බන්ධව කොරළවැල්ල දිමුතු පෙර පාසලේ අබලන් ගොඩනැඟිල්ල අළුත්වැඩියාව යන කරුණට අදාළ පළමු අදියර වන, ප්‍රජා ශාලාව පෙර පාසල ලෙස සංවර්ධනයට අදාල ඇස්තමේන්තුව සඳහා මිල ගණන් කැඳවීමට කටයුතු කිරීමට මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි මේ කමිටුව ඇවිල්ලා මහජන උපයෝගිතා කමිටුව මේ කමිටුවට පුලුවන්ද මිල ගණන් කැඳවීමක් කරන්න. ඔබතුමා මුදල් කමිටු සභාපතිතුමා නිසයි මම අහන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මෙය කර්මාන්ත කමිටුවට යොමු කරන්න ඕන. කර්මාන්ත කමිටුවෙන් ඇස්තමේන්තුව හදලා මුදල් කමිටුවට එවන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේක එහෙම තමයි කළේ. අපි මේ කමිටුවේ මිළ ගණන් කැඳවන්න කියලා දැම්මේ නැහැ. මේකේ නිර්දේශය අපි දුන්නේ මේක කාලයක් තිස්සේ පරක්කු වෙවී යන එකක්. ඒ නිසා එයාලා ඒ ඇස්තමේන්තුව ලොකු ගාණක් හදලා තියෙනවා. අපි ඉල්ලීම් කළේ කඩිනමින් ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුවට යොමු කරලා මුදල් කමිටුවට යවන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එහෙනම් ඒක සංශෝධනය කරන්න. කරුණු අංක 02(03) උක්ත කරුණ සලකා බැලූ කමිටුවට, සොයිසාපුර ක්‍රීඩාංගනයේ ඇති ඇවිදින මංතීරුව සඳහා නව විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව වාර්තා වූ අතර එහි ප්‍රගතිය මීළඟ කමිටුවට වාර්තා කිරීමට නිර්දේශ කරන ලදි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මුදල් කමිටුව තමයි වගකීම් දරන්නේ. ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තීන්දු ගන්න බැහැ මහජන උපයෝගීතා කමිටුවට. මේක ඉදිරි කටයුතු සඳහා යොමු කරන්න ඕන මුදල් කමිටුවට. මේවා නෛතික ලියවිලි මේවා. එතුමිය නොදන්න නිසා වෙන්න ඇති මේක දාන්නේ. නමුත් අපේ නිලධාරීන් දන්නවානේ. මන්ත්‍රීවරු නොදන්නවා වුණත් නිලධාරීන් දන්නවා මේක කරන්න ඕන ඒවෙලාවේ කියන්න ඕන මේක සභාපතිතුමියට.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ සටහන මෙහෙම තිබුණාට මේ කටයුත්ත සිද්ධ වෙන්නේ අර නීත්‍යානුකූල ක්‍රමවේදය ඇතුලේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතමා කියන එක පිළිගන්නවා. හැබැයි මේක ලිඛිතව සඳහන් වෙන්නේ. අපිට කියන්න බැහැ මේක මෙහෙම තිබුණාට අරහමයි වෙන්නේ කියලා. එහෙම තමයි වෙන්නේ හැබැයි මේක මෙහෙම තියෙන්න බැහැ. මේක පොඩි දෙයක්නේ තියෙන්නේ. මේක සංශෝධනය කරලා ඊළඟට ආපහු මෙහෙම නිර්දේශ ආපහු දාන්න එපා කියන්න. මේක මේ නිලධාරීන්ගේ වරද, මන්ත්‍රීවරුන්ගේ වරදක් නෙවෙයි. නිලධාරීන් දැනගන්න ඕන නිර්දේශය කියනකොට ඒවෙලේ කියන්න. මේක නිලධාරීන්ගේ වරද මොකද මන්ත්‍රීවරු කියන්නේ සියල්ල දත් අය නෙවෙයිනේ.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ නිර්දේශයේ ඉතාමත් පැහැදිලිව කියනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුවට, සොයිසාපුර ක්‍රීඩාංගනයේ ඇති ඇවිදින මංතීරුව සඳහා නව විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව, දැන් කමිටුවේ ඒක දැනගත්තා ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතිනවා. ඒක කරන්නේ මුදල් කමිටුව.

මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, මේ කටයුත්තට අදාළව විදුලි අධිකාරීතුමා තමයි එදා කමිටුවේ දී අපිට උත්තර දෙන්නේ. එතකොට එතුමා කියනවා ප්‍රසම්පාදන කටයුතු යනවා මිල ගණන් කැඳවීම් කරලා තියෙනවා. අපි ඉතින් ඉල්ලන්නේ ඊළඟ කමිටුවට වාර්තාවක් දෙන්න කියලා නැතුව කමිටුව විසින් ප්‍රසම්පාදන කටයුතු කරන්න කියලා නිර්දේශයක් මේකේ නැහැ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන එක හරි ප්‍රසම්පාදන තීන්දුව නැහැ. මේකයි මේක ඔබතුමා හිතන විදියට ඔබතුමාට හිතාගන්න පුලුවන්. මට හිතෙන විදියට තමයි මම කිවුවේ. එතකොට මේ කරුණ අංග සම්පූර්ණ වෙන්න නිර්දේශ හරියට ලිවුවානම් එහෙම අපි දෙගොල්ලන්ටම පැහැදිලිනේ ලියලා තියෙන එක. දැන් මේක භාගයක් ලියලා, භාගයක් අපිට හිතාගන්න කියලා. මේ වාක්‍ය නිවැරදි කරන්න කියලා කියන්නේ. මේ කාගෙවත් වරදක් පෙන්නනවා නෙවෙයි.

ගරු නගරාධිපතිතුමනි, 02(04) කරුණ තෙලවල පෙර පාසල සම්බන්ධයෙන්. ඒකේ සාකච්ඡාවක් කැඳවලා තියෙනවා. අපි ඉල්ලීමක් කරනවා ඒ සාකච්ඡාවට අපිවත් සම්බන්ධ කරවන්න කියලා. මේකේ තව ප්‍රශ්ණයක් තියෙනවා නගරාධිපතිතුමනි පොත් බෙදා දීම සම්බන්ධයෙන්. සැප්තැම්බර් 30 දක්වා දිර්ඝ කරලා තියෙනවා ඒක හොඳයි. මේකේ තියෙනවා කමිටුවට වාර්තා වූ බැවින් පාසල් මගින් නිර්දේශ කරගත නොහැකි අවස්ථා වලදී අදාළ ශිෂ්‍යයා පදිංචි කොට්ඨාශය භාර ග්‍රාම නිලධාරි වෙතින් නිර්දේශ කරවාගත් අයදුම්පත්, වලංගු අයදුම්පත් සේ සලකා පොත් කට්ටල නිකුත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවටත් නිර්දේශ කරන ලදි. ගරු නගරාධිපතිතුමනි, මේ මෙතැන ඉන්නේ මොරටුව මිනිස්සුන්ගේ ඡන්දයෙන් ආපු මන්ත්‍රීවරු. එතකොට මන්ත්‍රීවරයා පොත් දෙන්න ග්‍රාම නිලධාරී සහතිකය ඕනෑලු. ඒ නිසා මම කියන්නේ මන්ත්‍රීවරුන්ව හැල්ලුවට ලක් කරන්නේ නැතුව මේකේ සහතික කිරීමේ වගකීම මන්ත්‍රීවරයාට දෙන්න. ඒ වගකීම මන්ත්‍රීවරයා ගන්නවානේ. දැන් මේ මන්ත්‍රීවරයා ලිඛිතව දෙන එකේ වගකීමමෙතෙක් කල් වුණෙත් එහෙමනේ. මොනවාහරි ප්‍රශ්ණයක් ආවොත් ගමේ ඉන්න මන්ත්‍රීවරයා වගකියනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා මේ මන්ත්‍රීවරයා දෙන පොත් ටිකට නගර සභාවෙන් දෙන පොත් ටිකට, දැන් අපේ ජනසෙත පුස්තකාලෙට ඇතුල් වෙන්න මන්ත්‍රීවරයා නිර්දේශ කරන්න ඕන. ඒ කියන්නේ මන්ත්‍රීවරයාගේ ගෞරවයා රැකලා තියෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මන්ත්‍රීතුමාගේ ගෞරවය පොඩ්ඩක් ආරක්ෂා කරලා මේකේ වගකීම මන්ත්‍රීතුමාට දෙන්න. මන්ත්‍රීතුමාට අත්සන් කරන්න බලය දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැන් මේ 02(05) කරුණ 2025.05.12 තමයි මේක ඉදිරිපත් වෙන්නේ. ඒ ඉදිරිපත් වෙච්ච කාරණාවට අනුව තමයි මේ ක්‍රියාවලිය සිද්ධ වෙමින් යන්නේ. එතකොට අපිට දිගින් දිගටම මේ නිර්දේශ වෙනස් වුණේ නැහැ වෙනස් වුණ එකම දේ තමයි මේ පොත් බෙදාදීමේ කාලය කල් දාපු එක. දැන් මන්ත්‍රීවරයාගේ ගෞරවය මතක් වෙන්නේ පොත්

බෙදා දීලා ලොකු කාලයකට පස්සේ. මේ අවස්ථාවේ ඔබ කියන එක හරි. නමුත් ඒක පළමු මොහොතේම වෙනස් කිරීමට තිබුණ එකක්.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, නගරාධිපතිතුමා අත්සන් කරන එක අපිට ප්‍රශ්ණයක් නැහැ. මොකද පාසලේ ඉන්න ළමයා තමන්ගේ පාසලේ කියලා විදුහල්පතිතුමත් තීරණය කරනවා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම ඒක පිලිගන්නවා. හැබැයි මේ වෙනකොට මේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් තමන්ට හිමි පොත් කට්ටල සෑහෙන ප්‍රමාණයක් බෙදුවා. අපි ආයේ මේක හෙට දවසේ කරනවානම් ඔබ කියන තැනට එමු. මන්ත්‍රීවරයා තමයි විශ්වාසවන්තම කෙනා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, අනෙක් එක මේක සැප්තැම්බර් 30 වෙනකන් දීර්ඝ කරලා, දැන් 07 වෙනිදා ඉස්කෝල පටන් ගන්නවා. ඊට පස්සේ අත්සන් කරගන්න පුලුවන්. එහෙනම් මේ ග්‍රාමසේවක අත්සන් කරන්න කියන එක අයින් කරන්න. ග්‍රාමසේවකට යටත් කරන්නෙපා මන්ත්‍රීවරයාව.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේවා අපි කාගෙවත් පුද්ගලික මුදල් නෙවෙයිනේ. මේ රජයේ මුදල්. මේ මහජනතාවගේ මුදල්. එතකොට ඒ මුදල් අපි ඉතාමත් සත්භාවයෙන් තමයි දරුවන්ට මේ පොත්පත් ටික බෙදා දීමට කටයුතු කරන්නේ. එතකොට රජයේ මුදල් අනිවාර්යෙන්ම ඔඩිට් වෙනවා. එතකොට අපි ඒකට වගකියන්න ඕන. අපි බැදිලා ඉන්නවා මහජන නියෝජිතයෝ ඒකට වගකියන්න. එතකොට ඒ වගකීම අපි පමණක් නෙවෙයි ගන්න ඕන රජයේ නිලධාරියෙක් හරහා ගන්න ඕන. එක්කෝ පාසලේ ගුරුවරයා, පන්තිභාර ගුරුවරයා, නැතිනම් විදුහල්පතිවරයා එහෙමත් බැරිනම් ග්‍රාමසේවක මහත්මයා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන එක හරි. ඔබතුමා මුලින් කියපු දේම තමයි මමත් කියන්නේ. මේ දක්වා ආවේ පාසලේ විදුහල්පතිතුමා අත්සන් කරන්න කියලානේ. දැන් සැප්තැම්බර් 07 ඉස්කෝල පටන් ගන්නවා 30 වෙනිදා වෙනකන් කල් තියෙනවා. ඉතින් අපි නගරාධිපතිතුමාටම කියලා අත්සන් කරගන්න කියමු.

මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

ගරු නගරාධිපතිතුමනි, මේක වෙච්ච හේතුව කියන්නම්, දැන් මේ පොත් ගොඩක් කට්ටිය පාසල් වලින් අත්සන් නොකරපු අයට තමයි මේ ප්‍රශ්ණය මතුවුණේ. ඒ කියන්නේ අත්සන් නොකරනවා නෙවෙයි. මේකට විදුහල්පතිගේ සීල් එක ගහන්න ඕන. එතකොට ගොඩක් මේ පුංචි ළමයි විදුහල්පති ළඟට යාමේ මැලිකමක් දක්වනවා. ඒ නිසාම විශාල නම් ලිස්ට් එකක් ඒ කියන්නේ අපි බෙදලා තියෙන ඇප්ලිකේෂන් නැවත අපිට ඇවිල්ලා තිබුණේ නැහැ. ඒ පහසුව තමයි විදුහල්පතිගේ අත්සන නැත්නම් ඕක ග්‍රාම නිලධාරී ළඟට යන්න කියලා ඉල්ලීම කළේ ඔය කියක පදනම. නැතිනම් මන්ත්‍රීවරයාට පොත් ටික දෙන්න ගැටලුවක් නැහැ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම සුජිත් මන්ත්‍රීතුමා කියන දේත් නිවැරදි පැත්තක් තියෙනවා. දැන් මේ ලැබෙන ප්‍රමාණයත් එක්ක ගරු නගරාධිපතිතුමා බෙදන්න පුලුවන් ප්‍රමාණය අවමයි මන්ත්‍රීවරයාට ලැබෙන ප්‍රමාණය. එතකොට දැන් ඕක ග්‍රාමසේවක ළඟට ගියාම එතැනින් ප්‍රචාරය

වෙනවා ඔයාට හම්බවුණේ නැද්ද, මෙයාට හම්බුණේ නැද්ද ඒ ගැටලු වලටත් මුහුණ දෙන්න සිද්ධ වෙනවා. සුජීත් මන්ත්‍රීතුමා කියන කරුණට අනුව 07 වෙනිදා ඉස්කෝලේ පටන් ගන්නවානම් අපි ඒ නිර්දේශයට අනුව කටයුතු කරමු. මොකද නැතිනම් අපිට මේක බෙදා දෙන්න ගියාමත් ගැටලු. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මේ ගැටලුව ඇති වෙන්න ඇති. ගමේ ගොඩක් ළමයි පිරිසක් ඉන්නවා ඉතින් අපිට මේක දෙන්න වෙන්නේ සීමා සහිත විදියට බලලා. ඒ නිසා ඒ නිර්දේශයට අනුව කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්, මේක කමිටුවේ සාකච්ඡා වුණා මම හිතන්නේ ඔබතුමත් ඒ අවස්ථාවේ කමිටුවේ හිටියා. එතකොට දැන් මේ ඉතිරිවෙලා තියෙන ප්‍රමාණය කමිටුවේ මන්ත්‍රීවරු ඔක්කෝන්ගේම සාකච්ඡාවේදී ආවේ මේ ඉතිරිවෙලා තියෙන ප්‍රමාණය දරුවන් කැමති නැහැ විදුහල්පති ළඟට හෝ ගුරුවරයා ළඟට ගිහිල්ලා තමන්ට දෙයක් ගන්න මේකට සහතිකයක් ඉල්ලන්න. අන්න ඒ ප්‍රමාණයක් තමයි මේ බහුතරයක් ඉතිරිවෙලා තියෙන ෆෝම් ටික. එහෙම අවස්ථාවක මේ නිර්දේශයේ තියෙනවා එහෙම බැරි අවස්ථාවක් තියෙනවානම් සමහරක් වෙලාවට අම්මාට ගිහිල්ලා ග්‍රාමසේවකගෙන් මේකට සීල් එකක් ගහගෙන එන්න පුලුවන්. එවැනි අවස්ථාවක එහෙමහරි කරලා දුන්නොත් ඒක වලංගුයි කියන එකයි මෙතැන තියෙන්නේ. නැත්නම් මන්ත්‍රීවරයාව ග්‍රාමසේවකට යටත් කිරීමක් හෝ මන්ත්‍රීවරයාගේ බලතල ග්‍රාමසේවකට පැවරීම වගේ දෙයක් මෙතනින් උත්සහා කරලා නැහැ. දරුවෙක් අකමැතිනම් ඒ දරුවාට ලැබෙන්නත් සුදුසුයි නමුත් දරුවා කැමති නැහැ තමන්ගේ ආත්ම ගෞරවය හානි කරගෙන ගිහිල්ලා ඉස්කෝලේ ඉස්සරහා විදුහල්පති ඉස්සරහා හිටගෙන මේක සීල් කරගන්න. එවැනි දරුවෙකුට අම්මාට අරගෙන ගිහිල්ලා ග්‍රාමසේවකගෙන් හරි ගෙනාවොත් මේක දෙන්නම් ඒක වලංගු අයදුම්පතක් විදියට සලකනවා කියන කාරණය විතරයි මෙතැන තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතන ඉන්නවා ප්‍රධාන වශයෙන්ම ජ්‍යෝෂ්ඨ ගුරුවරු දෙන්නෙක්ම ඉන්නවා විශ්‍රාම ගිහිල්ලා. ළමයෙකුට බැරිනම් තමන්ගේ ගුරුවරයාට, විදුහල්පතිට කියලා ෆෝම් එකක් අත්සන් කරගන්න ඔළුව ඉදිමිච්ච ළමයෙක් ඉන්නවානම් එයාට පොත් ටික දෙන්න ඕන නැහැ. එයා ළමයෙක් නෙවෙයි. මම කියන එකට එකඟ වෙනවා ඇති ගුරුවරු දෙදෙනෙක් ඉන්නවා මෙතන. අනෙක් එක ගරු නගරාධිපතිතුමා මේ ෆෝම් එකේ ග්‍රාමසේවක කියලා කෑල්ලක් නැහැ. එතකොට ග්‍රාමසේවක ළඟට ගියාට ඕක අත්සන් කරන්නේ නැහැ. මොකද ග්‍රාමසේවක කියන එක තියෙන්න ඕන අත්සන් කරන්නනම්. අලුත් ෆෝම් එකක් ගහන්න බැහැ සභාවේ අනුමත වෙන්නේ නැතුව. මගේ 52න් මේ වෙද්දි 42ක් දීලා ඉවරයි. ඉතින් ඒ අත්සන් ගහලා දුන්නේ විදුහල්පතිගේ සීල් එක ගහලා දුන්නේ. ගරු නගරාධිපතිමනී, 02(06) කරුණ මේකේ තියෙනවා යාන්ත්‍රික ඉංජිනේරු අංශය මගින් අත්වැට ආධාරකයක් සකසා ඇති අතර වැහි ආවරණය සඳහා ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරමි. මේ වගේ ඉස්සෙල්ලා එකත් වෙන්න ඕන කියන එක තමයි මම කිවුවේ.

ගරු නගරාධිපතිතුමනි, ලකී සෙවණපුර ප්‍රජාශාලාව සම්බන්ධයෙන්. ප්‍රජාශාලාවේ මේ වෙනකොට ඔබතුමා ගිහිල්ලා බැලුවයි කියලත් ආරංචියි. විශාල වශයෙන් හොරකම් කරලා තියෙනවා අපේ දේපළ. දැන් ලකී සෙවණපුර ප්‍රජාශාලාව කියලා කියන්නේ මේ මෑතකදී හැදුවේ. මහා ලොකු කාලයක් නැහැ ඒක අළුත්වැඩියා කරලා හරි හදලා හරි මහා ලොකු කාලයක් නැහැ මට මතක විදියට. දැන් මේකෙදී අදාළ ප්‍රදේශයේ මාතෘ සායනය ගිහිල්ලා තියෙනවා මෝදරට. ඒකේ තිබුණ

පෙර පාසල අයින් කරලා තියෙනවා. ඒ නිසා මේක ඒ මාතෘ සායනය මෝදරට ගෙනයාම තුළ ඒ පැත්තේ ඉන්න මිනිස්සු ලොකු අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. ත්‍රීවිල් වලට සල්ලි ගෙවන්න ඕන විශාල මුදලක් යනවා ඒ මිනිස්සුන්ට විශාල කාලයක් යනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා මේ ගොඩනැඟිල්ල තවදුරටත් බිත්ති ටිකත් ගලවාගෙන යන්න ඉස්සෙල්ලා මේ ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කරලා යලි ආරම්භ කරන්න ක්ලීනික් එකයි පෙර පාසලයි. මේක ඔබතුමන්ලාගේ පැත්තේ තියෙන තැනක්නේ. ඒ නිසා මේක තවදුරටත් කුඩඩන්ගේ රජදහනක් වෙන්න දෙන්න එපා. මේක දැන් කුඩඩන්ගේ රජදහනක් වෙලා තියෙන්නේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමාගේ අවධානය යොමු කරලා මේකට එක්කෝ සිකියුරිටි කෙනෙක් හරි දාලා තියෙන ටික හරි ආරක්ෂා කරලා නැතිනම් පොලිසියේ ඇන්ට්‍රියක් හරි දාලා ආරක්ෂා කරලා මෙතන ස්ථාපනය කරන්න මේ මාතෘ සායනයයි පෙර පාසලයි කියන ඉල්ලීම කරනවා මොකද හේතුව ඒ ජනතාව ලොකු අපහසුතාවයකට පත්වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 05 මොරටුව මහා නගර සභාව මගින් පාලනය වන පෙර පාසල් වල දරුවන්ට, දැනට පවතින අනාරක්ෂිත තත්වයන් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට යෝජනා කර සිටිනවා. ඒ සම්බන්ධයෙන් නිර්දේශය වෙන්නේ මෙම සභාව මඟින් පාලනය වන පෙර පාසල් වල පවතින අනාරක්ෂිත තත්වයන් සම්බන්ධයෙන් වාර්තාවක් පෙර පාසල් ගුරුවරියන්ගෙන් ලබා ගැනීමට කටයුතු කිරීමට නිර්දේශ කරන ලදි. මම හිතනවා පෙර පාසල් ගුරුවරියන්ගේ මේ නිර්දේශ ලබා ගැනීම එතරම්ම සුදුසු නැහැ කියන එක. එතනට අපේ සංවර්ධන නිලධාරියෙක් හරි ටෙක්නිකල් ඔෆිසර් කෙනෙක්ව හරි අනියුක්ත කරලා ඒ වාර්තාව ලබා ගන්නවානම් වඩාත් සුදුසුයි කියලා මොකද මේ ගුරුවරියන් සියලුදෙනාටම ඒ අවබෝධය සහ ඒ නිර්ණායකයන් ගැන අවබෝධයක් තියෙනවාද කියන එක මම දන්නේ නැහැ.

ගරු නගරාධිපතිතුමනි, 02(02) පෙර පාඩුවල පවතින අඩුපාඩු හා සම්බන්ධව. ඒ නිර්දේශය ගැන මම කියන්නම් කොරළවැල්ල දිමුතු පෙර පාසලේ අබලන් ගොඩනැඟිල්ල අළුත්වැඩියාව යන කරුණට අදාළ පළමු අදියර වන, ප්‍රජා ශාලාව පෙර පාසල ලෙස සංවර්ධනයට අදාල ඇස්තමේන්තුව සඳහා මිල ගණන් කැඳවීමට කටයුතු කිරීමටත්, අගෝස්තු 14 දින වන විට බේබි කොමඩ් 2 ක් සවිකර නිම කිරීමටත්, ඉතිරි බේබි කොමඩ් 2 සවි කිරීමට නොහැකි වීම ගැන සඳහන් කරලා නිර්දේශයක් කරන්න කියලා තියෙනවා. නමුත් මම මේක සඳහන් කරන්න කැමතියි හරිම කණගාටුයි මේ යෝජනාව ඉදිරිපත් වෙන්නේ 2025 ජූනි මාසේ. එතකොට මම දන්නේ නැහැ අපිට අඩුතරමේ බේබි කොමඩ් එකක්වත් සවිකර ගන්න බැරිද කියලා අවුරුද්දක් ගිහිල්ලා. මෙච්චර කල් ඇදෙන්නේ මොකද? එක්කෝ මම හිතන්නේ පරිපාලනයේ වැරුද්දක් එක්කෝ පාලනයේ වැරුද්දක්. බේබි කොමඩ් දෙකක් හයිකර ගන්න බැහැනේ අපිට අවුරුද්දක් ගිහිල්ලත්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ දීර්ඝ කාලයක් මේ තීන්දු අරගෙන කමිටු වල ඔබේ නියෝජිතයොත් මේ කමිටුවේ ඉන්නවා. ඒ තීන්දුව අරගෙන බේබි කොමඩ් ගෙනෙල්ලා ඒ බේබි කොමඩ් ඇල්ලීමේ පමාවක් සිද්ධ වුණානම් ඒ ටික මහන්සි වෙනමින් අල්ලමින් දැන් සැලකිය යුතු ප්‍රමාණයක් ඇල්ලුවා මේක අලුතින්ම හදන්න දාලා තියෙන්නේ දැන් ඇස්තමේන්තුත් දාලා ටෙන්ඩර් දීලා. මේ මොකක්වත් අවබෝධයක් නැතුව ඔබ මේ සභාවට කියන්න හදනවා බේබි කොමඩ් එකක්වත් අල්ලගන්න බැහැයි කියලා. කරනවා ඒවායේ යම්යම් පමාවීම් තියෙනවා.

කර්මාන්ත අංශයේ වැඩ කරන රටාව පිළිබඳව මම සතුටක නෙවෙයි ඉන්නේ. හැබැයි මේ කටයුත්තේ සැලකිය යුතු මට්ටමකට වෙමින් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අවබෝධයක් නැතුව මම කතා කරන්නේ නැහැ. මේකේ එහෙනම් දින වකවානු වෙනස් කරන්න ඕන. අලුතින් ඒවා ටික ඉවරයි දැන් මේ අලුතින් ගෙනාව යෝජනාවට තමයි මේ බේබි කොමඩ් ටික කියලා කිවුවානම් අන්න එහෙම කිවුවානම් මම වැරදියි. නමුත් මේකේ දින වකවානුව බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මමත් කතා කළා බේබි කොමඩ් ගැන මාස 03ක් තිස්සේ මේ සභාවේ. දැන් කතා කරලා වැඩක් නැති නිසා වාඩිවෙලා ඉන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට මේක කඩාකප්පල් කරන්න අවශ්‍යතාවයක් නැහැ. මන්ත්‍රීතුමිය මේ කතා කරන්නේ කොහොමහරි මේක ඉක්මනට කරගන්න. මාස ගාණක් තිස්සේ මේ බේබි කොමඩ් කරුණ යනවා. ඉතින් ඔබතුමා කර්මාන්තයෙන් මේක කෙරෙන්නේ නැතිනම් ඔබතුමා නගරාධිපතිවරයා හැටියට ඇක්ෂන් එකක් ගන්න ඒකට.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(05) කරුණේ දී අපේ සුජිත් මන්ත්‍රීමාත් මතුකළා කාරණාවක් එතුමා කිවුව දේත් යම් පැත්තකින් සත්‍යක් තියෙන්න පුලුවන්. හැබැයි නගරාධිපතිතුමනි, සමහර පාසල් වල ගත්තාම මම කොළඹට යන තාත්තා නැතිවෙලා ඒ දරුවෝ දෙන්නා ලොකු පාසල් වලට යන්නේ හැබැයි ඒ දරුවන්ට ඒ කොන්වන්ට් එකේ ඉන්න සිස්ටර් ළඟට ගිහිල්ලා අත්සන් කරගන්න බැහැ මොකද අර තිබුණ තත්ත්වයත් එක්ක. දැන් තාත්තා නැතිවෙලා ඉන්නේ. හැබැයි ඒගොල්ලන්ට පොත් ටික අවශ්‍යයි. හරි අමාරු මට්ටමක ඉන්නේ. අපි හිතමු ආනන්දේ නැතිනම් සෙන් බ්‍රිජට් කියලා ගිහිල්ලා අත්සන් කරගන්න බැහැ. වේල්ස් කුමර එකෙත් එහෙමයි තත්ත්වය. ඒනිසා නගරාධිපතිතුමනි, විකල්පයක් විදියට මම හිතන්නේ මෙතුමා කියන කතාවේ යම් ඇත්තක් තියෙන්න පුලුවන්. ඒත් එක්ක විදුහල්පතිතුමාට බැරිනම් හදිස්සියේවත් ඒක අර විදියෙන් අත්සන් කරන එක ග්‍රාමසේවකට මොකද මෙතුමා ළඟත් 30ක් විතර තියෙනවා. මගේ ළඟත් යම් ප්‍රමාණයක් තියෙනවා. ඒක වෙලා තියෙන්නේ ඉස්කෝල වල ඉන්න තමන්ගේ ප්‍රශ්ණය කියාගන්න බැරි පිරිසට යම් සාධාරණයක් ඉෂ්ඨවෙන එක මම හිතන්නේ ඒක වෙන්න ඕන. දෙවෙනි එක තමයි මන්ත්‍රීවරයාට ඕක අත්සන් කරන්න දුන්නොත් එහෙම ලබාදියාවන් අතර ගැටුමක් ඇතිවෙලා අන්තිමේ දී දූෂණය කියන එකට පොත් ටික දීලා යන්නත් පුලුවන්. මම කියන්නේ අරවගේ අවස්ථාව තියෙන ඒ ප්‍රධාන ඉස්කෝලවලට යන්න බැරි දරුවෝ ගොඩක් ඉන්නවා. ඒ නිසා පරිපාලනයයි දේශපාලනයයි අතර ගැටුමක් නෙවේ. මගේ පැත්තෙන් මගේ අවස්ථාව ඒකටත් අවස්ථාවක් දුන්නොත් ඒ ළමයින්ටත් අවස්ථාවක් ලැබෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සාමාන්‍යයෙන් ලොකු ඉස්කෝල වල ඔය ප්‍රශ්ණය තියෙනවා කියලා, ලොකු ඉස්කෝලවල ශෙක්ෂන් හෙඩ්ලා ඉන්නවා විදුහල්පතිවරයා වෙනුවට ඒගොල්ලෝ සීල් පාවිච්චි කරනවා. ඉතින් විදුහල්පතිවරයා ගාවට යන්න ඕන නැහැ ඒ ඉස්කෝලේ. දැන් අපේ පුතා යන්නේ ආනන්දෙට අපේ පුතාලා කවදාවත් විදුහල්පතිවරයා ළඟට යන්නේ නැහැ සීල් එකක්

ගහගන්න. සෙක්ෂන් හෙඩ්ට බලය දීලා තියෙනවා විදුහල්පතිවරයා ඒ සීල් එක ගහලා ඒ අත්සන දාන්න. එහෙම අත්සනක් ගහගෙන ආවත් පිලිගන්නවානේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙතන තියෙනවා 1058ක් ඇප්ලිකේෂන් ඇවිල්ලා නැහැ. මගේ 30ක් තියෙනවා. මොකද මම එක කොට්ඨාසයකට දුන්නේ නැහැ, මම දුන්නේ හැමෝටම. මම ප්‍රායෝගිකව මුහුණු දීපු දේ මම කියන්නේ නගරාධිපතිතුමනි ඒ නිසා ඒ දරුවන්ගෙන් විමසුවාම ඒ දරුවෝ කියනවා ඇප්ලිකේෂන් එක නැතිවුණා. හැබැයි හොයලා බලනකොට දරුවා ප්‍රින්සිපල් ළඟට යන්න අකමැතියි ඒ සීල් එක ගහගන්න. පන්තිභාර ගුරුතුමිය අත්සන් කරලා තියෙනවා හැබැයි ගොඩක් ඒවා තියෙනවා සීල් එක නැහැ. මම ඒකයි තාරක මහත්තයාගෙන් ඇහුවේ සීල් එක ගහන්නම ඕන ද කියලා, සීල් එක ගහන්නම ඕනලු. එතකොට ඒ තත්ත්වය අනුව මේ පොත් ටික දෙන්න බැහැ. මෙහිදී මගේ පුද්ගලික අදහස ග්‍රාම නිලධාරී හෝ මොකක්හරි ඒ කියන්නේ දරුවාට යන්න පහසු, ඒ කියන්නේ එහෙම බැරි අය එහෙම යන්න මැලි වෙන අයට යම් කිසි විදියකට එක්කෝ ග්‍රාම නිලධාරීගේ සහතිකය තියෙන්න ඕන කියන එකයි මගේ අදහස.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔබතේ දරුවන්ට ෆෝම් එක දෙන්නේ, ඒ දරුවාට ඔබ ෆෝම් එක දෙනකොට ඒක පුරවගෙන ඒක ඔබ ළඟට අරගෙන එන්න කියලා කියලා දිනයක් දෙන්න. ඒ දිනයට ඒ ෆෝම් ටික හම්බුණාම ඒ ටික අරගෙන විදුහල්පතිවරයා ළඟට යන්න. මන්ත්‍රීවරයා එන්නේ විදුහල්පතිවරයා බොහෝම කැමැත්තෙන් සීල් එක ගහලා ඔබට දෙනවා. එහෙම විදුහල්පතිට බැහැ කිවුවොත් මට එන්න කියන්න. ඒ නිසා මේකට කාලය ගන්නෙපා මම මේක 30 වෙනිදාට ඉවර කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝම් ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 04 විශේෂයෙන් අද දවසේ මොරටුව ජෝෂය පුරවැසියන්ගේ සංගමයට අද වෙනකොට කඩ කාමරයක් ලැබිලා තියෙනවා. ඒක මොරටුව තරුණාභිවෘද්ධිදායක සංගමය මම හිතන්නේ රාජ්‍ය පුණ්‍ය ආයතනයක් බවට පත්වාගෙන ගිය ස්ථානයක මමත් මොරටුව තරුණාභිවෘද්ධිදායක සංගමයේ සාමාජිකාවක්. ඇත්තටම වසර 15ක කාලයක් ඒ සංගමය දැවැන්ත කාර්යය භාර්යයක් ඉටු කළා මොරටුව දරුවන්ට පාසල් දරුවන්ට. දන්නා තරමින් අද ඇවිල්ලා ඉන්නවා ජෝෂ්ය පුරවැසියන්ගේ සංගමයේ ගරු සභාපතිතුමා සහ නිලධාරී මණ්ඩලයේ කිහිපදෙනෙක් ඉතින් මම ඇත්තටම එතුමන්ලාට සුභ පතනවා විශේෂයෙන්ම ඔබතුමාටත් ස්තූතිවන්ත වෙනවා අද දවසේ මම හිතන්නේ ජෝෂ්ය පුරවැසියන් වෙනුවෙන් අපිට මම හිතන්නේ මුදල් නොගෙන භාවිතා කරපු ආයතනයක් විදියට පවත්වාගෙන ගිය තරුණාභිවෘද්ධිදායක සංගමය මම හිතන්නේ එතැන ගරු සභාපතිතුමා විල්ලෝරාවත්ත ප්‍රදේශයේ එතුමා පහුගිය වසර කිහිපය තුල ජීවතක්ෂයට පත්වුණා. එතුමා විසින් පවත්වාගෙන ගිය එම ව්‍යාපාරය ඒ කියන්නේ ඒක ජනතාවාදී ව්‍යාපාරයක්. පාසල් දරුවන් වෙනුවෙන් කථික තරඟ පැවැත්වුවා රචනා තරඟ පැවැත්වුවා. හැම වර්ෂයකම ත්‍යාග බෙදා දුන්නා විවිධ උත්සව සැමරුවා මම සතුටු වෙනවා ඇත්තටම අද දවසේ එතුමන්ලා දෙපල ඇවිල්ලා ඉන්නවා අද දවසේ එතුමන්ලාට සුභ පතනවා. එතුමන්ලාට මම හිතන්නේ ජනවාරි මාසේ ඉදලා එතුමන්ලා උත්සහා කළා යම් ස්ථානයක් ලබා ගන්න. ඒ සම්බන්ධයෙන් නැවතත් ස්තූතිවන්ත වෙනවා විශේෂයෙන්ම වැඩිහිටියන්ට සලකන්න අපිට ලැබුණ අවස්ථාව මොකද ඒ අය සතුටු කරන්න මොරටුවේ මම හිතන්නේ ජෝෂ්ය පුරවැසියන් වෙනුවෙන් යම් කිසි දෙයක් මොරටුව මහා නගර සභාවට කරන්න සිදුවීම සම්බන්ධව.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඇත්තටම ඔබතුමියට ස්තූතිවන්ත වෙනවා මෙවැනි කාර්යයක් කරන්න කිසිදු පසුබටවීමක් නැතුව කළයුතු කාර්යයක් නමුත් මේ තියෙන සමහරක් නීතිරීති විසින් ඇති කරන බාධාවන් ටිකක් වේදනා බරයි. අපිට කොච්චර අවශ්‍ය වුණත් කොච්චර ඉක්මන්ට දෙන්න ඕන වුණත් අර නීතිරීති ඇතුලේ ඇත්තටම නිලධාරීන් ආරක්ෂා විය යුතුයිනේ. ඔවුන්ගේ පැත්තෙන් ඉදිරිපත් කරන සමහර කරුණු කාරණා වලට සාකච්ඡා කරලා එකඟ වෙමින් ඒ නිසා පුංචි කාලයක් ගියා. අද සභාව අනුමත කරපුවාම අපිට බාධාවක් නැහැ එතුමන්ලාට ඒ කටයුතු කරගෙන යන්න ඒක දෙන්න පුලුවන්.

මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා

ගරු නගරාධිපතිතුමනි, අංක 02(10) කරුණ සම්බන්ධයෙන් ලිපියක් ලැබිලා තියෙනවා ඒකට පිලිතුරු ලිපියක් ලැබුණාද දන්නේ නැහැ. මෝදර තුඩුවේ සිට රාවතාවත්ත දක්වා පාසල් දරුවන්ට බස් එකකක් ඉල්ලලා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔව් මේ සම්බන්ධව කතා කළා. ඔවුන් එකඟතාවයක් තිබුණා රාත්‍රී සේවය සඳහා බස් එකක් දාන්න. අපි දැන් කිවුවා අපේ යෝජනාව තියෙන්නේ පාසල් දරුවොන්ට බස් සේවය ගැන මේ සම්බන්ධයෙන් ඒගොල්ලන්ගේ පැත්තෙන් යහපත් ප්‍රතිචාරයක් හම්බවෙයි කියලා මම විශ්වාස කරනවා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා

20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(5), 02(6), 02(7), 02(10), 02(11), 02(12), 02(13), 03, 06, 07 හා 08 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිලිණි නෙත්සරණි මෙනෙවිය
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 වන දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.07 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.07 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ **ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

06(3) 2026.08.10 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 03 නීති නිලධාරි විසින් 2026.08.07 දිනැතිව ඉදිරිපත් කරන ලද පහත කරුණ සලකා බැලීම. මොරටුව දිසා අධිකරණ MRT/DC/MR/0001/26 අංක දරණ නඩුව සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥ සහය ලබා ගැනීම තමයි මාතෘකාව තියෙන්නේ. මොරටුව මහා නගර සභාව එහි ගරු නගරාධිපති හා නාගරික කොමසාරිස් විත්තිකරුවන් කරමින් එම්. ඕ. ජී. ඊ. ප්‍රනාන්දු යන අය විසින් මොරටුව දිසා අධිකරණයෙහි නඩු අංක MRT/DC/MR/0001/26 දරණ නඩුව පවරා ඇත. එම නඩුව සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥ රුවන්ත කුරේ මහතාගේ සහය ලබා ගැනීම සඳහා මාගේ 2026.07.21 දිනැති නිර්දේශය අනුව, ගරු නගරාධිපතිතුමා විසින් සභා ආවරණ අනුමැතියට යටත්ව අනුමත කරන ලද අතර, ඒ අනුව එම නඩුව සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥ රුවන්ත කුරේ මහතා තෝරාපත් කර ගන්නා ලදි. ඒ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා ආයතන කමිටුවට යොමු කිරීමට කාරුණිකව ඉදිරිපත් කරමි. මේකේ දාලා තියෙන්නේ ඇමුණුම් අංක 04 කියලා. ගරු නගරාධිපතිතුමා මේ නඩුව සම්බන්ධයෙන් පළවෙනිම දේ තමයි අපි අහන්නේ මේ නඩුව තියෙන්නේ දිසා අධිකරණයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ රුවන්ත කුරේ මහත්තයා කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙක්. අපි අහන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකුව දිසා අධිකරණයට ගේන්න තියෙන සුවිශේෂීත්වය මොකද්ද මේ නඩුවේ දැන් සාමාන්‍යයෙන් වෙන නඩු වලට ගත්තොත් එහෙම ඒ නඩු වලට ඉදිරිපත් කරලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ නීතීඥ ගුණසිරි හේවගේ මහත්තයාව. හැබැයි ගුණසිරි හේවගේ මහත්තයාව ඉදිරිපත් කරන්නේ නැතුව එහෙම නැතිනම් මොරටුවේ ඉන්න නීතිඥ මහත්මයෙක්ව ඉදිරිපත් කරන්නේ නැතුව මේ නඩුවට තියෙන සුවිශේෂත්වය මොකද්ද ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙක් ගේන්න. දැන් සාමාන්‍ය නඩුවකට ගුණසිරි හේවගේ මහත්තයා ගන්නේ ලක්ෂ 4යි නැත්නම් 5යි. හැබැයි මේ නඩුවට අඩු තරමේ ලක්ෂ 10කට වඩා ගෙවන්න වෙනවා තවම ගාන දාලා නැහැ. ඒ නිසා අපි උපකල්පනය කරනවා එතුමන්ගේ ගණන් බලනකොට මේකට ලක්ෂ 10කට වැඩිය ගෙවන්න වෙයි. එතකොට අපි අහන්නේ ඇයි මෙහෙම ගෙන්නන්නේ. අනෙක් එක ඇයි මේ නඩුවක් වැටුණේ. මේ නඩුව වැටෙන්නේ ගරු නගරාධිපතිතුමා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් එදා සාකච්ඡාවක් කළා ඒ සාකච්ඡාවේදී අපි බොහෝම හොඳ තැනකට මේ සාකච්ඡාව අරගෙන ආවා. හැබැයි නාගරික කොමසාරිස්තුමිය ඒ සාකච්ඡාව සම්පූර්ණයෙන්ම අවුල් කළා. එතුමියගේ තීන්දු නිසා තමයි මේ නඩුව මේ ආකාරයෙන් වැටිලා තියෙන්නේ. අවසානයේ ඔබතුමාටත් මේකට ඇතුලත් වෙන්න වෙලා තියෙනවා. ඔබතුමා මේකට සම්බන්ධයක් නැති වුණත් නගරාධිපතිවරයා හැටියට ඔබතුමාටත් මේකට ඇතුලත් වෙන්න වෙලා තියෙනවා නිල නගරාධිපතිවරයා නිසා. කොහොම වුණත් ගරු නගරාධිපතිතුමා මේකේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් තියෙනවා මේ සිද්ධිය සම්බන්ධයෙන් ඒ නඩු තීන්දුවට අනුව නගර

සභාව ක්‍රියාත්මක වෙලා නැහැ. මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවට අනුව නගර සභාව ක්‍රියාත්මක වුණානම් මේ ප්‍රශ්ණය නැහැ, එහෙනම් මෙහෙම නඩුවක් වැටෙන්නේ නැහැ. නඩු වාර්තාව අරගෙන බැලුවොත් එහෙම මේ නඩු වලට වියදම් කරන්නෙ මහජන මුදල්. අපි දැක්කා හිටපු නගරාධිපතිවරයාට දොස් කිවුවා අපි විපක්ෂයේ ඉදගෙන මේ ඔළුවේ කැක්කුමටත් නඩු දානවා. නඩු වලට වියදම් කරනවා නගර සභාවේ සල්ලි කියලා. ඔබතුමත් ඒ විවේචනය තුළ විවේචනය කළා. හැබැයි අද වෙනකොට ඔබතුමාම අරගෙන බලන්න නඩු වාර්තා ටික ඒ නඩු වලට විශාල වියදමක් මහා පරිමාන වියදමක් තවමත් දරනවා. මේ කාගේ සල්ලිද? මේ මහජනතාවගේ බදු මුදල්. ශ්‍රේෂ්ඨාධිකරණයේ එච්සීඑප්ආර්/278/2021 තීන්දුව අනුව අපේ නගර සභාව ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා තමයි අපිට මේ නඩුවක් වැටුණේ. කොහොම වුණත් මෙතනදී විශේෂත්වයක් තියෙනවා ගරු නගරාධිපතිතුමා නගර සභාවම කියනවා එක වෙලාවක එතුමාට ඇවිල්ලා ඔප්පුව සඳහා සල්ලි බදින්න කියලා ඉතින් එතුමා සල්ලි බදිනවා. ඊට පස්සේ මම දැක්කා ගිය මුදල් කමිටුවට දාලා තියෙනවා ඒ සල්ලි නැවත වරක් නිදහස් කරන්න කියලා නාගරික කොමසාරිස්වරිය. අපි අහන්නේ එහෙම කොහොමද කරන්නේ? ඇවිල්ලා සල්ලි බදින්න කියනකොට සල්ලි බදින්න ඕන, ආපහු ගන්න කියනකොට ගන්න ඕන, මිනිස්සු එහෙම සූදානම් ද? මිනිස්සු එහෙම සූදානම් නැහැ. එතන ලොකු අවදානමක් තියෙනවා එතුමාගේ මුදල් බදිනවානම් එතුමාගේ මුදල් අපි නැවත වරක් දෙනවානම් අපි මෙතෙක් කල් නගර සභාව දීලා තියෙනවා හැම ඔප්පුවකටම අයකරපු මුදල් දෙන්න වෙනවා. එහෙම නැතිනම් ලොකු ප්‍රශ්ණයක් වෙනවා. එහෙම වුණොත් විශාල ප්‍රමාණයක් අටසිය නැතිනම් නවසිය ගාණක් ඉන්නවා අපි මුදල් අරගෙන ඔප්පු දීලා. එහෙනම් ඒ හැමෝටම අපිට ඒ මුදල් දීලා නිදහස් කරන්න වෙනවා. නගර සභාව බන්කොලොත් වෙනවා එහෙම වුණොත් එහෙම. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, එක එක්කෙනාගේ උද්ධච්ච තිරණ ක්‍රියාත්මක කරන්න දෙන්න එපා. අවසානයේ දේශපාඥයෝ හැටියට ඔබතුමා තමයි අමාරුවේ වැටෙන්නේ. ඒ නිසා අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මේ ඉඩම පවරන්න ඔක්කෝම කරලා සාධන පත්‍රයක් නිකුත් කරන්න කියලා එවලා තිබුණා. නීතිඥ සන්ධ්‍යා නෝනිස් මහත්මිය සාධන පත්‍රය එවලා තිබුණා. මේ සාධන පත්‍රයත් එවලා තිබුණාට පස්සේ තමයි සාධන පත්‍රය පිලිගන්න බැහැයි කියලා තිබුණේ. සංශෝධනය කරලා එවන්න කිවුවාම සංශෝධනය කරලත් යැවුවා මට මතක් විදියට. දැන් තමයි කියන්නේ එදා අර සාකච්ඡාවේදී ආව ආගියුමන්ට් එක නිසා තමයි නැහැ නැහැ අපිත් අපේ බලය පෙන්වන්නම් කියලා ඉවර වෙලා මේ මුදල් නිදහස් කරන්න තීන්දුව කරලා තියෙන්නේ. ඒ වගේම මෙතන ඔප්පු දීලා තියෙනවා ගරු නගරාධිපතිතුමා තිස් ගාණක්. හැබැයි ඒ එක ඔප්පුවක්වත් දෙන්න අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියවත් ලැබිලා නැහැ. අනුමැතිය ඉල්ලලා නැහැ. මොකද අපි දන්න විදියට පළවෙනි පන්තියේ ඔප්පුවක් අපිට තියෙන්නේ. පළවෙනි පන්තියක ඔප්පුවක සාමාන්‍යයෙන් නිදහස් කරන්න අපිට එහෙම අනුමැතිය ඕන නැහැ ජනාධිපතිතුමාගෙන්. ඒක නිදහස් කිරීමේ බලය තියෙනවා. එතකොට එහෙම තියෙන නිසා ඒ බලය අනුව තමයි ඔප්පු තිස් ගානක් අපි දීලා තියෙන්නේ. හැබැයි ඒ ඔප්පු තිස් ගානත් ජනාධිපතිගේ අනුමැතිය නැතුව දීලා මේ ඔප්පුව දෙන්න ජනාධිපතිගේ අනුමැතිය ඉල්ලනවා. ඒ කියන්නේ "පය බරවාට පිටකර බෙහෙත් බැන්දා සේ" ඒ කියන්නේ මේ නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත්තට්ටුවයි තව ටිකකුයි ඕනෙලු. ඒකේ අනෙක් පැත්ත තමයි මේ තියෙන්නේ මේක නොදී ඉන්න ඕනි නිසා කොහොම කොහොම හරි තමන්ගේ නිල කාලය ඉවර වෙනකන්ම නිලධාරීන් උත්සහා කරනවා මෙකෙන් ඇහ බේරගෙන මේක කොහේට හරි තල්ලු කරලා නිදහස් වෙන්න. ඒ නිසා ගරු නගරාධිපතිතුමා මේකේ කවුරු කිවුවත් මේ නඩු කියන්නේ ජනතාවගේ මුදල්. ඒ නිසා අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේකට මැදිහත් වෙලා මේ ඔප්පු දෙක නිදහස් කරන්න අවශ්‍ය කටයුතු කරන්න. ඒ සඳහා අපිටත් කරන්න පුලුවන් මැදිහත්වීම අපිත් කරලා මේ නගර සභාවට අනවශ්‍ය විදියට

පැවරෙන නඩු වලින් අපි මේක ඉවත් වෙන්න ඕන. අනෙක් එක තමයි මේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥවරු ගේන්න ඉඩ තියන්න එපා නගරාධිපතිතුමා. මේක මහා අපරාධයක් මේක දිසා අධිකරණයේ තියෙන නඩුවක්. රාවතාවත්ත උසාවියේ දක්ෂ නීතීඥවරු ඉන්නවා. ඒ මින්සුන්ටත් කරන ගෞරවයක් මේ මොරටුවේ නගර සභාව මොරටුවෙන් ලෝයර් කෙනෙක් ගන්නේ නැතුව ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණ නීතීඥයෙක් අරන් එනවා මේ නඩුවට. අපේ මොරටුව රාවතාවත්ත උසාවියේ ඉන්න නීතීඥ මහත්වරුන්ටත් කරපු නිග්‍රහාවක් ඒක. ඒ නිසා කරුණාකරලා එතනට යන්නේ නැතුව මේ නඩුව යනවානම් මොරටුවෙන් නීතීඥ මහත්මයෙක් නම් කරන්න. අපි කියන්නේ නැහැ ඒ, බී, සී ද කියලා. කවුරුහරි නම් කරලා මේක කරගෙන යන්න. අපි නැවත වරක් ඉල්ලනවා මේ නිලධාරීන්ගෙන් උද්දච්ච තීන්දු අරගෙන තමන්ට ඕන ඕන තීන්දු අරගෙන මේ නඩු දාගෙන ඉවරවෙලා අවසානයේ ඒ නඩු ජනතාවගේ කර පිට පටවන්න එපා කියන ඉල්ලීම අපි කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මෙවැනි කාරණාවක් සම්බන්ධයෙන් අපි අදහස් පල කිරීමේ දී ඉතාමත් සැලකිලිමත් විය යුතුයි. මේක නඩුවක් මේ නඩුවේ පදනම අපි දන්නවා. මේ ආයතනයේ ප්‍රධාන නිලධාරිනිය කොමසාරිස්තුමිය. එතුමියගේ අත්තනෝමතික නැතිනම් උද්ධච්චකම මේ සභාවක ප්‍රකාශ කරනවා. මම කියන්නේ ඒක ගැලපෙන්නේ නැහැ. මේ කටයුත්ත ඔබ දන්නවා ඔහුට සිදුවුණ අගතියක් තිබුණා ඔලිවර් මහත්මයාට. අනෙක් අයට දීපු පදනමින් ඔහුටත් දෙන්න තිබුණා. නමුත් ඒ මොහොතේ දුන්නේ නැහැ. නමුත් අපි ආපු ගමන් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයකුත් තිබුණා ඒකත් සැලකිල්ලට ලක්කරලා ඒ මහත්තයාට අපි දෙන්න තීන්දු කළා අපේ පළවෙනි නැත්නම් දෙවැනි සභාවේම ඔහුට දිය යුතුයි කියන තීන්දුව ගත්තා. හැබැයි එහෙම තීන්දුව අරගෙන තියෙනකොට තමයි චක්‍රලේඛනයක් නිකුත් වෙනවා සභාව සතු එවැනි දෙයක් දෙනවානම් අනිවාර්යෙන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියක් ඒ හරහා ජනාධිපතිවරයාගේ අනුමැතියක් ඕන. ඔලිවර් මහත්තයාට මේක කිවුවා තව පුංචි කාලයක් දෙන්න ඉතා ඉක්මනින් අවශ්‍ය කටයුත්ත කරලා දෙන්නම්. හැබැයි ඔබ දන්නවා අපි ගෙනෙල්ලා සාකච්ඡාවකුත් කළා මීට පෙරත් ඔලිවර් මහත්තයා පිළිබඳව ඉතිහාසක් තියෙනවා සිද්ධි තියෙනවා. ඔහුගේ ඇත්ත අවශ්‍යතාවය අරමුණ ඉතාම හොඳින් අපි තේරුම් ගත්තා ඔහුට ඔප්පුව ලැබෙන බව ඔහු දන්නවා. හැබැයි ඔහුට අවශ්‍ය වුණේ ඒ කාලය තුළ වෙච්ච අගතිය පිළිබඳ වන්දියක් අපෙන් ගන්න එක. ඔහු මීට පෙරත් එහෙම වෙච්ච සිදුවීමකට සභාවත් දන්නවා ලක්ෂ 116ක විතර වන්දියක් ගත්තා. ඔහුගේ එකම පරමාර්ථය මේ වන්දිය. මම ඔහුට ඉතාම හොඳින් කිවුවා ඔබට මේ ඔප්පුව ලබා දෙනවා ඔබ තවදුරටත් නඩු කියන්න යන්න එපා ඔබට නඩු කියන්නේ මේ ජනතාවගේ මුදල්. නිලධාරීන්ගේ අඩුපාඩු ඇති හැබැයි එහෙම යම් සමථයකට පත් කරගන්න බැරි වෙච්ච තැන ඔහු විසින් මෙම නඩුව දැම්මා. දැන් අපි මේ සභාවේ හැමෝම එකතුවෙලා මේ අපේ දෙයක් අපේ දේපළක් අපි ඔහුට දෙනවා ඔහු ඒක භුක්ති විඳලා තියෙනවා අපි පිලිගන්නවා කිසි ගැටලුවක් නැහැ. හැබැයි මේ නඩු කියන්නේ අපේ මහජනතාවගේ මුදල් ටිකත් වන්දි ලෙස ගන්න. ඒකට අවස්ථාව යන විදියට මේ සභාවේ කිසිදු නියෝජිතයෙක් මෙතන කතා කරන නීතීඥයා මොන ගණයේද කියලා මතු කරන ප්‍රශ්ණෙත් මම පුද්ගලිකව හිතනවා ඒ කියන්නේ ලක්ෂ 116ක් වන්දි ලෙස ලබා ගත්තේ ඔහු තනියෙන්ම මේ හැම අධිකරණයකම පෙනී හිටියේ. ඔහු දක්ෂයෙක් ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ මහාධිකරණයේ හැම අධිකරණයකම ඔහු මේ නඩජු කතා කලේ තනියමනේ. එතකොට ඔහු මෙ නීතිය පිළිබඳව ඉඩම් පිළිබඳව විශයන් පිළිබඳව විශාල දැනුමක් තියෙන කෙනෙක්. මේ නඩුව මම හිතනවා කිසිලෙසකවත් පරාද වියයුතු නඩුවක් නෙවෙයි. ඇයි ඔහු

අසාධාරණයි. අපි ඕනවට වැඩිය නම්‍යශීලී වුණා. ඒ කියන්නේ නගර සභාව කාගේවත් දෙපතුල ළඟ නමන්න ඕන නැහැයි කියලා මම කියන්නේ. අපි ඔප්පුව දෙන්න එකඟවෙලා තියෙද්දි ඒකට තව පොඩි කාලයක් නොදී අපිට විරුද්ධව නඩු කියන්නේ නැවත වන්දියක් ගන්න. මම කියන්නේ ඒක සාධාරණ නැහැ. ඒ නිසා අල්ලපු නීතිඥයා කවුරු වුණත් මේ නඩුව ජයග්‍රහණය කර ගැනීමට අවශ්‍ය කරන විදියේ මැදිහත්වීමක් ඕන ඒ නගර සභාවේ ගෞරවය. ඔලිවර් මහත්තයා එක්ක තරහක් නෙවෙයි. නගර සභාවේ ඔප්පුවක් දීලා වන්දිත් දෙන්න ඕන නැහැ කියන ස්ථාවරයේ ඉන්නේ. අපි මේ වෙලාවේ සභාවක මේ නිධාරීන් සම්බන්ධව කරන සමහර ප්‍රකාශන කරන ඒවා අතනින් අපිට අවාසි වෙන්න පුලුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට තියෙන ගැටලුව ඔබතුමා නගරාධිපතිතුමා හැටියට ඔබතුමා කියපු යම්යම් කරුණු අපි පිලිගන්නවා. හැබැයි ඔබතුමා ප්‍රකාශයක් කළා මේකට දක්ෂ නීතිඥයෙක් ගේන්න ඕන. එතකොට මොරටුව උසාවියේ නැද්ද දක්ෂ නීතීඥයෝ. ඒ නිසා මම ඔබතුමාගෙන් බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මේක මොරටුව නගර සභාව. ඒ නිසා මොරටුව උසාවියෙ ඉන්නවා මුළු ලංකාවේම නඩු කියන නීතීඥ මහත්වරු. ඒ නිසා අපේ නීතීඥ මහත්වරුන්ව හැල්ලු කරන්නේ නැතුව කරුණාකරලා මේක මේ අපේ මොරටුවේ තියෙන දිසා අධිකරණයේ තියෙන නඩුවට මොරටුවේ නීතීඥ මහත්මයෙකුට භාර දෙන්න. මේ බොරුවට සල්ලි ගෙවන්න එපා මේ මොරටු ජනතාවගේ මුදල්. මොකද ඔය මොන නීතිඥ මහත්තයා ආවත් මොරටුවේ සමහර නීතීඥ මහත්වරුන්ට ගහන්න පුලුවන් නීතිඥයෝ නැහැ. අපි ඒක පෞද්ගලිකව දන්නවා. ඒ කියන්නේ ඒතරම් දක්ෂ නීතිඥ මහත්වරු මොරටුව නියෝජනය කරනවා. මොරටුව දිසා අධිකරණයේ ඉන්නවා. ඔබතුමත් ඒක දන්නවා පෞද්ගලිකව. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් ඒ සම්බන්ධයෙන් මේ අවශ්‍ය කටයුතු කරන්න. අනෙක් එක තමයි නීතිඥ මහත්මයෙක්ව නම් කිරීමේ බලය කොයි වෙලාවකදීවත් නීතිඥතුමියට දෙන්න එපා. ඒක අඩුතරමේ නම් ටිකක් යෝජනා කරලා ආයතන කමිටුවට දාන්න අපේ නීතිඥවරු තුන්දෙනෙක් ඉන්නවා ආයතන කමිටුවේ. පොඩ්ඩක් කතා කරලා අපේ නීතිඥවරු තුන්දෙනා එක්කහරි කතා කරලා කවුරුන්ද අපි පත්කර ගන්න ඕන කියලා අහන්න පුලුවන්. හතර දෙනෙක් ඉන්නවා ලිහිණි මන්ත්‍රීතුමියත් ඉන්නවා කමිටුවේ නැති වුණාට.

ගරු නගරාධිපතිතුමනි, නඩු වාර්තාවේ අංක 04 මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 97689 නඩුවේ නියෝගය පරිදි සිවිල් නඩුවකින් මොරටුව ක්‍රීඩා සමාජය පවත්වාගෙන යන ගොඩනැඟිල්ල සම්බන්ධ ගැටලුව විසඳා ගැනීම සඳහා පවරා ඇත. දැන් මේක ගිය පාර අපි සාකච්ඡා කළා ක්‍රීඩා සමාජයේ අජිත් කුරේ මහත්තයාවත් ගෙන්නලා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා කළා. අපි තීන්දු තීරණ ගත්තා ගිය සභාවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි යෝජනාවකුත් සම්මත කළා. ඒ යෝජනාව සම්මත කලාට පස්සේ තමයි යෝජනාව ආවේ. තිබ්ලා තියෙන්නේ 2026.07.17 ඊටපස්සේ 2026.09.15 වෙනිදා තියෙන්නේ. 2026.07.17 වෙනකොට අපි කතා කරලා තිබුණේ. ගරු නගරාධිපතිතුමනි, නඩුව තවම ඉස්සරහාට යනවා. පූර්ව දිනය 2026.07.17 විචාරණ පිළිබඳ ලිඛිත දේශන ගොනු කරන ලදි. ඒ පිළිබඳව නියෝගය 2026.09.15 තව දවස් 15කින්. ගරු නගරාධිපතිතුමනි, ඇයි මේක තාම ඇදගෙන යන්න දීලා තියෙන්නේ. අපි තීන්දුව අරගෙන ඉවරනම් මේකට ඇක්ෂන් එකක් ගන්න ඕන නීති දෙපාර්තමේන්තුවෙන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔව්, මම කියන්නේ අපි කාටත් තේරුම් ගන්න වෙලා තිබෙනවා මෙම කටයුතු වල නියෙලන අපේ නිලධාරීන්ගේ තියෙන කාර්යක්ෂමතාවය. ඒක අපි කිසිලෙසක සාධාරණීකරණය කරන්න ඕන නැහැ. ඔබ කියන එක හරි. ඒ කියන්නේ දැන් අවස්ථාවක් මේ

සභාව ඒකමතිකව සම්මත කරපු යෝජනාවක්. අපි දැන් ඉදිරි නඩු දිනයට කලින් ඒ පාර්ශවයන් ගෙන්නලා අපි දෙගොල්ලෝ එකතුවෙලා සමථ කොන්දේසි ටික හදනවා. ඒගොල්ලන් අපිට එවපු ටික තියෙනවා අපි ඒ අයත් එක්ක එකඟවෙලා තියෙනවා අපි එකතුවෙලා හෙට අනිද්දාම දවසක් දාගෙන සමථ කොන්දේසි ටික හදලා ඊළඟට මෝසන් එකකින් නඩුව ගන්නවා. ඊට පස්සේ අදාළ සමථ කොන්දේසි හරහා සමථයකට පත්වෙනවා. ඒ සඳහා සාකච්ඡා කිරීම් ටික කරලා තියෙන්නේ. ඔබ මතු කරන කාරණා හරි. මේ කටයුතු කිරීමේ දී දැන් නිලධාරීන්ගේ පැත්තේ අදාළ මැදිහත්වීම් වලදී සමහර කරුණු කාරණා වලදී අපේ අවබෝධය අඩුයිනේ ඒ කියන්නේ අපි ප්‍රශ්ණ කරනකල් එතකොට අර පාර්ශවය අපි පිළිබඳව ටිකක් මෙච්චර ඕනෑම දෙයකට එකඟවෙලා තියෙද්දි ඔය ගැටලුව ටිකක් තියෙනවා. අනිවාර්යෙන්ම ඉතාම ඉක්මනින් මේ කාර්යය අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි එදා කොන්දේසියකට ආවානේ. ඔබතුමා කිවුවානේ මෙහෙම කරන්න කියලා. ආයෙත් අපි ලෝයර්ස්ලාට ගෙවන්න ඕන නැහැනේ. ඔබතුමා කියන එකවත් අහන්නේ නැද්ද නිලධාරීන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අහන්නේ නැතුව නෙවෙයි මේ තියෙන්නේ. තමන් විසින් කළයුතු වැඩ ටික අපෙත් අවබෝධය හදලා කරන්න දරණ උත්සහාය තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මේ සභාවේ අවුරුදු 30ක් අපිත් අවුරුදු 21ක් දැක්කා මේකේ නිලධාරීන් ක්‍රියාත්මක වෙච්ච විදිහ හැබැයි නගරාධිපතිවරයා නියෝගයක් නිකුත් කරලා සභාවේ ඒකමතිකව අනුමත වෙච්ච එකක් ක්‍රියාත්මක කරන්න නිලධාරීන්ට තමයි පැවරෙන්නේ, එතකොට නිලධාරීන්ගේ වගකීමක් ඒක. ඒක නීති නිලධාරී දෙපාර්තමේන්තුවෙන් කෙරෙන්නේ නැතිනම් නීති දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරන නිලධාරීන් ඉන්නවා එතකොට ඒගොල්ලෝ ඒක අහන්න ඕන බලන්න ඕන මොකද ඔයා කරන්නේ? ඇයි මේක නොකරන්නේ? කියලා. ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕන. ඇත්තටම මේ වැඩ වලින් ලැජ්ජාවට පත්වෙන්නේ නගරාධිපතිවරයා සහ මේ ඉන්න සියලුම මන්ත්‍රීවරු. මොකද අපි මහා ලොකුවට මන්ත්‍රීවරු ඔක්කෝම ටික එකතු කරලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එකතු කරගෙන අපි සාකච්ඡා කරලා තීන්දු තීරණ අරගෙන ඒ මනුස්සයාවත් ගෙන්නලා. අපි මහ ලොකුවට තීන්දු ගත්තා හැබැයි ඒක ක්‍රියාත්මක කරගන්න බැහැ. දැන් මාසයක් වුණා තීන්දුව අරගෙන අපි ඔක්කෝම ෆේල් වෙලා එක්කෙනෙක් නෙවෙයි. මේ ඉන්න පනස්දෙකම නෝන්ඩි වෙනවා. මම කරුණාකරලා ඔබතුමාට කියන්නේ ඒකට අවශ්‍ය නියෝග ක්‍රියාත්මක කරලා 15 වෙනිදායින් ඉස්සෙල්ලා ඔබතුමා කියපු ටික කරන්න ක්‍රියාත්මක වෙන්න. නැතිනම් අපිත් හෑල්ලුවට පත්වෙනවා දැන් මේ නියෝගයක් දෙන්නනේ තියෙන්නේ. ගරු නගරාධිපතිතුමනි, නඩු වාර්තාව පෙරලලා බලන්න ලක්ෂ කීයක්නම් අපි නීතිඥ මහත්වරුන්ට ගෙවනවාද කියලා. සමහර නඩු තියෙනවා මෙලෝ වැඩක් නැහැ. හැබැයි අපි ලක්ෂ ගණන් වලින් නීතිඥ මහත්වරුන්ට ගෙවන්නේ. කිසිම වැඩක් නැති නඩු. මේ මින්සුන්ගේ සල්ලි කරුණාකරලා මේ සඳහා අවධානය යොමු කරන්න. මේවායින් පාරක්, බෝක්කුවක් හදන්න පුලුවන් සල්ලි මේ. අනෙක් එක තමයි ගිය සභා වාරයේ මම යෝජනාවක් දැම්මා මේ කලාප වලට ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකරන්න. ඒක ඒකමතිකව සම්මත වුණා. මට ඔබතුමාගෙන් දැනගන්න ඕන ඒකේ ප්‍රගතිය මොද්ද කියලා. කලාප වල ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීම සම්බන්ධ ප්‍රගතිය සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමාගෙනුත් අහන්නේ ඒකමයි.

මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්දුජීත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, ඊට අදාළ ක්‍රියාමාර්ග අදාළ දෙපාර්තමේන්තු හරහා තමයි යන්නේ මැෂින් මිලදී ගන්න එපැයි. එතකොට ඒක සැපයුම් එකට යන්න ඕන. ඒක දැනට තියෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඒ මැෂින් ගත්තාට පස්සේ තමයි සවි කරන්න ඕන.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා තව කරුණක් මතුකළා ගලිය සම්බන්ධයෙන් ඒක නිවැරදි කරලා තිබුණා අදාළ නිලධාරියාව ඉවත් කරලා ඒ වෙන සේවකයෙක් පත්කරලා තිබුණා එතැනට එහෙම ආරංචියක් ආවා. ඒ සම්බන්ධයෙන් අපි ස්තූතිවන්ත වෙනවා. ගරු නගරාධිපතිතුමනි, අපිට ලිඛිතව ඉදිරිපත් කරලා තියෙනවා චමින්ද එයාගේ හිඟ වැටුප් ලබා දෙන්න අපේ ආයතන කමිටුවේ අනුමත කරලා සභාවෙත් අනුමත වුණා. හැබැයි මේ දක්වා ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. අපි ඒකේ ප්‍රගතිය දැනගන්න කැමතියි. මොකද හේතුව සභා අනුමැතියක් ලැබුණාට පස්සේ මේක ක්‍රියාත්මක නොවෙන්නේ ඇයි කියලා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, කාලය බලන්න, සභාවේ ඉන්න ප්‍රමාණය බලන්න. ඔබ මේ කමිටුවේ සාමාජිකයෙක්. ඔබ සහභාගී වූ කමිටුවේ නිර්දේශ පිළිබඳවයි ඔබ මේ කතා කරන්නේ. අනුමත කරපු චමින්දගේ මුදල ගෙවීම කරනවා. පමාව පිළිබඳවනේ ඔය අහන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, එය නෙමෙයි ප්‍රශ්ණය. අවුරුදු හයකට පසුව මූලික විමර්ශනයක් කරන්න කියලා ඇවිල්ලා. මම තනියම නෙමෙයි මේ කතා කරන්නේ. අවුරුදු හයකට පසුව මූලික විමර්ශනයක් කරන්නේ කොහොමද?

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, ඔබ ඔය මතු කරන කාරණය මේ ආයතනයේ කොහේද තියෙන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, මේ ආයතනයේ තියෙන එක නෙමෙයි ප්‍රශ්ණය.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, ඔබට අවශ්‍ය මේ සභාවේ කාලය ගන්න නම්,

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මේ සාකච්ඡා කරන්නේ ඔබ නියෝජනය කරන ආයතන, නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව. මේ කමිටුවේ ඔබ ඔය කතා කරන කාරණය නෑ. අපි කවුරුත් දන්නවා ඉතිහාසයේ වුණ වැරදි නිසා වෙච්ච දේවල් තිබෙනවා. නමුත් අපි ඒවට වගකිව යුතු නෑ. ඒ සේවකයාට අද ගෙවීමක් කරනවා නම් මේ සභාව තමයි වගකියන්න ඕනේ. අපි මේ ගෙවන්නේ සභාවේ මුදල්. එහෙත් මම කිව්වා ඔහුට ගෙවිය යුතු මුදලින් අඩක් ගෙවන්න. කොමසාරිස්තුමියත් එයට එකඟයි. අපි ඒ මුදල හෙට අනිද්දට ගෙවනවා. ඔබ මේ කතා කරන්නේ ආයතන කමිටුවේ නොමැති කරුණක්. ඔබට ඇත්ත උවමනාව තියෙන්නේ මේ ප්‍රශ්ණ විසඳන්නද නොමැති නම් මේ සභාවේ කාලය ගන්නද කියලා ගැටලුවක් එනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සභාවේ කාලය ගන්න මගේ පෞද්ගලික ප්‍රශ්ණයක් කතා කළේ නැනේ. මේ කතා කරන්නේ, සේවයකයන්ගේ ප්‍රශ්ණයක් කතා කරන්න වෙන තැනක් නොමැති නිසා. ආයතක කමිටුව වෙලාවේදි තමයි සේවකයන්ගේ ප්‍රශ්ණ කතා කරන්න පුළුවන්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, වෙන වෙලාවක මේ සම්බන්ධව මා සමඟ කතා කරන්න. මේ සේවකයාගේ ගෙවීම කරන්න ඕනේ. අපි ඒ දේ කරමු. සභාවේ කාලය ඕනේ නෑ ඒ කාරණයට.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි අහන්නේ එක දෙයයි. මොන ප්‍රතිපාදනයේද තියෙන්නේ අවුරුදු හයකට පසු මූලික විමර්ශනයක් කැඳවන්න. කොමසාරිස්තුමිය ඇයි එහෙම කළේ. මූලික විමර්ශනයක් කරලා, විධිමත් විනය පරීක්ෂණයකුත් කරලා සියල්ල කරලා තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබ ඉතාම ඕනෑකමින් මේ සභාව අනවශ්‍ය තැනකට ගෙනියන්න දරණ උත්සහයක්. ඔබේ තනි උවමනාවකට සමස්ථ සභාවක් මෙහෙම කරන්න දෙන්න එපා. කුමක්ද මේ කරන්නේ. විනය බලධාරියා කොමසාරිස්තුමිය.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මුදල් කමිටුවේදි අවස්ථා ගණනාවකදි මේ කාරණය සම්බන්ධයෙන් කතා කළා. අවසානයේදි කොමසාරිස්තුමිය පොරොන්දු වුණා වගකීම එතුමිය භාරගෙන හරි මෙම ගෙවීම කරනවා කියලා. ඉන්පසු කුමක්ද දන්නේ සිදුවුණේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අඩුම තරමේ මේ වගේ දෙයක් ගෙනවා නම් පෙත්සම් හා පැමිණිලි යටතේ ඉදිරිපත් කරන්න. අද මෙහෙම අයිතමයක් නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පෙත්සම් හා පැමිණිලි යටතේ සාකච්ඡා කරන්න බැහැනේ. එහෙම නීතියක් නැනේ.

සභා සෝෂා

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඉතා පැහැදිලිවම අදාළ සේවයකයාට ඉදිරි සති දෙක තුන ඇතුළත ගෙවීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ඇහුවේ ගෙවනවද කියලා. ඔය උත්තරය දුන්නා නම් ප්‍රශ්ණය ඉවරයිනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අයිතම අංක 03 යටතේ කාරණා කිහිපයක් කතා කිරීමට අවශ්‍යයි. සුජීත් පුෂ්පකුමාර මහතා ඒ සම්බන්ධව කරුණු දැක්වුවා. මට කීමට අවශ්‍ය මේ නිවැරදි කිරීම් කිහිපය පමණයි. පළවෙනි කාරණය, ලංකාවේ සියලුම නීතිඥවරු ශ්‍රේෂ්ඨාධිකරණයේ තමයි දිවුරුම් දීලා තියෙන්නේ. මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ දිසා අධිකරණයේ කිසිම නීතිඥවරයෙක් නෑ. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරු තමයි සියලු දෙනා.

ගරු නගරාධිපතිතුමා, දෙවැනි කරුණ ඇමුණුම 04 යෝජනා කරලා රුවන්ත නීතිඥ මහත්මාව. නමුත් මම දන්නේ නෑ නඩුවේ කාරණාව. මගේ මතකයට අනුව මෙය ආයතන හා නීති කමිටුවේ සාකච්ඡාවට ලක්වුණේ නෑ. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් ගන්නේ නෑ. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා මීට පෙර මේ නඩුව සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව පෙනී සිට තිබෙන්නේ මෙම නීතිඥ මහත්මා. එමනිසා මේ නඩුවේ මුල සිට අගට නීතිමය කාරණා හා සිද්ධිමය කාරණා පිළිබඳ මනා දැනුමක් අධ්‍යයනයක් මෙතුමට තියෙනවා. නමුත් අපි දිසා අධිකරණයට වෙනම නීතිඥවරයකු පත්කර ගත්පසුව එම නීතිඥවරයාට ශ්‍රේෂ්ඨාධිකරණයේ සිට ලිපිගොනු සියල්ල අධ්‍යයනය කරන්න යම් විශාල කාලයක් යනවා. ඒ පැත්තෙන් බැලුවම අපිට යම් අසාධාරණයක් වෙනවා නව නීතිඥවරයෙක් පත්කරගැනීම නිසා. ඒ හැරෙන්න සුජිත් මහත්මයා කියපු කාරණය සම්බන්ධයෙන් මාගේ විරෝධතාවයක් නෑ. මොරටුව අධිකරණයේ ඉතා දක්ෂ නීතිඥවරු සිටිනවා. මම මොරටුවේ ඉන්න නිසා නෙමෙයි කියන්නේ. මීට පෙර කිව්වා වගේ නීතිඥ ගුණසිරි හේවගේ මහතා කියන්නේ සිවිල් ක්ෂේත්‍රයේ ඉතා පළපුරුද්දක් තිබෙන දක්ෂ නීතිඥවරයෙක්. ඊට අමතරව අනුෂ ගුණසේකර මහත්මයාත් නගර සභාවේ නඩු වලට පෙනී සිට තිබෙනවා. නමුත් කාරණය තිබෙන්නේ මේ නඩුවේ අර ආකාරයේ සම්පූර්ණ අධ්‍යයනයකින් පස්සේ, වෙනත් නීතිඥවරයකුට ලබාදීමෙන් ඔහුට විශාල කාලයක් යනවා නීතිමය හා සිද්ධිමය කාරණා අධ්‍යයනය කිරීම සඳහා. එය මගේ අවබෝධය හැටියට සභාවට දැන ගැනීම සඳහා පමණයි ප්‍රකාශ කරන්නේ.

ගරු නගරාධිපතිතුමා, ඊළඟ කාරණය නීතිඥ ගාස්තු සම්බන්ධයෙන්. මොරටුව අධිකරණයේ නීතිඥවරයෙක් අපේ නඩුවලට සම්බන්ධ කරගැනීමට හැකිනම් එතුමාට වෙනම යන එන වියදමක් නෑ. උසාවියේ නඩු කිහිපයකට පෙනී සිටින අතර තමයි ගාස්තු අය කරන්නේ. එහෙම නැතුව අපි කොළඹ හෝ පිටස්තර නීතිඥවරයකු සහභාගි කරගතහොත් ඔහුට එදා දවසට එක නඩුවක් පමණයි භාරගැනීමට සිදුවන්නේ. එහිදි ඔහු, ඔහුගේ සම්පූර්ණ වියදමත් සමඟ යම් වැඩිපුර ගාස්තුවක් ගන්නවා. ඒක සාමාන්‍ය තත්ත්වයක් අපිට කියන්න බෑ. මේ නීතිඥවරයාව නීති නිලධාරි තෝරාගත්තද කොහොම පත්කර ගත්තාද කියලා මා හට අවබෝධයක් නෑ. නමුත් මම මීට පෙරත් ආයතන හා නීති කමිටුවේ කියලා තියෙනවා අපේ නගර සභාව පැමිණිලිකරු හෝ විත්තිකරුවක් විදිහට යම් නඩුවකට ඇතුළත් වෙන්න සිදුවුණාම ඒ නඩුවට අපි කැමැත්තෙන් යනවද අකමැත්තෙන් යනවද කියන එක අපි කලින්ම තේරුම් ගන්න ඕනා. සභාවේ අනිත් අය මේ පිළිබඳව දන්නේ නැති නිසයි මම මේ කියන්නේ. නගර සභාව විත්තිකාරයෙක් කරනවා නම් නගර සභාවට විරුද්ධව එම පැමිණිලිකරුගේ පැමිණිලි ආයාචනයේ යම් සහන ඉල්ලනවා. ඒ සහන මොනවද කියලා අපි අධ්‍යයනයක් කරන්න ඕනා. ඒ සහන කිසිවක් නගර සභාවෙන් ඉල්ලා සිටින්නේ නැතිනම්, ආයාචනයක් විදිහට නාමිකව පත්කිරීමක් පමණක් නම් ඉල්ලන්නේ අපිට ඒ නඩුවට ඇතුළත් වෙන්නේ නැතුව ඉන්න පුළුවන්. මම මීට පෙරත් ආයතන හා නීතිය පිළිබඳ කමිටුවේදි කිව්වා අපේ සභාවේ නීතිඥවරු කිහිපදෙනෙක් ඉන්නවා. ඊට අමතරව වෙනත් නීතිඥ මණ්ඩලයක් හරි පත්කරලා අපි නඩුවලට ඇතුළත් වෙන්න අවශ්‍ය ද නැද්ද යන්න පිළිබඳ විශ්ලේෂණයක් කරන්න හැකියාවක් තියෙනවා. ඒ විශ්ලේෂණය කරන වෙලාවේදීම අපිට පුළුවන් මේ නඩුවට අපි දරණ වියදම කීයද, අපි මේකට නීතිඥවරයෙක් පත්කර ගන්නේ මොරටුව අධිකරණයෙන්ද නැතිනම් පිටතින් ද, මේ විෂයේ ප්‍රවීණයන් කවුරුන්ද , ඒ මිල ගණන් මොනවද කියලා අපිට තීරණය කරන්න හැකියාවක් තියෙනවා. අපිට අවශ්‍ය නම් ඔවුන්ගෙන් කලින් මිල ගණන් කැඳවීමටත් පුළුවන්. නමුත් සමහර නඩු තිබෙනවා අපිට සිතාසි ලැබෙන්නේ ඊළඟ සතියේ හෝ අත්‍යාසන්න දිනයක පෙර කලාසි ගොනු කල යුතු අවස්ථාවක. සභාව මාසෙකට වරක් පමණයි රැස්වෙන්නේ. ඒ වගේ අවස්ථාවක සභාවක් රැස්කරලා තීරණයක් ගන්න කාලයක් නෑ. එවිට නඩුව ඒකපාර්ශිකභාවයට යනවා. ඒනිසා අපිට ලොකු අසාධාරණයක් වෙනවා. ප්‍රායෝගිකව අපිට එවැනි

අවස්ථාවලටත් මුහුණදීමට සිදුවෙනවා. එහෙම නොමැති නම් අපිට ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාකච්ඡා කරලා සුදුසු නීතිඥවරයා කවුද, අදාළ මුදල් කොහොමද, වියදම් කොහොමද, අත්‍යාවශ්‍ය පාර්ශවයක් විදිහට සම්බන්ධ වීමට අවශ්‍ය ද නැද්ද කියන කරුණු තීරණය කරන්න පුළුවන්. ඔබතුමා අවශ්‍ය නම් කමිටුවක් හෝ පත්කරගන්න.

ගරු නගරාධිපතිතුමා, අනිත් කාරණය සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා සඳහන් කළ 1032/එල් නඩුව. මේ නඩුව මම සම්පූර්ණයෙන් අධ්‍යයනය කරලා නෑ. මම මේ පොදු කාරණා සම්බන්ධයෙන් කියන්නේ. යම් සමථයක් දෙපාර්ශවය මගින් යෝජනා වෙලා නමුත් එම සමථය දැනට අධිකරණයෙන් අවසන් වෙලා නෑ. තිබෙන තත්ත්වය අනුව 09.15 වන දින නියෝගය සඳහා නියම කරලා තියෙනවා. නඩුවක් විභාගයෙන් පසුව දෙපාර්ශවයම දිනන්නේ නෑ. දෙපාර්ශවයම දිනන්න නම් අනිවාර්යයෙන් සමථයකයට යන්න ඕනේ. වින් වින් සොලියුෂන් කියන්නේ දෙපාර්ශයම දිනන්නේ සමථයකට ගියොත් විතරයි. එහෙන නැතිනම් නඩු යන්නෝ වැනසෙන්නෝ තමයි මූලික මූලධර්මය මම විශ්වාස කරන. නඩු ගිහිල්ලා දෙපැත්තම කිසි වෙලාවක දිනලා නෑ.ඒක තේරුම් ගන්න ඕනේ. මම නගර සභාවට කියන්නෙත් ඒකයි. සමහර අය කැමැත්තෙන් යනවා, සමහර අය අකමැත්තෙන් යනවා. මම දන්නේ නෑ මේ යන්නේ කැමැත්තෙන්ද අකමැත්තෙන්ද කියලා. අපි සමථයකට එළඹිලා සමථය කඩ කරලා තියෙන්නේ, සමථයට ඇවිල්ලා නැත්තේ අපේ නගර සභාවේ නීති නිලධාරි හෝ නගර සභාවේ නිලධාරින් නම් අපේ අතේ වරදක් තිබෙනවා. නමුත් අපි යෝජනා වෙච්ච සමථ කොන්දේසි ඉටුකර නොමැතිව ඒ සමථ කොන්දේසිවලට ඇතුළත් වෙලා නැත්තේ අනිත් පාර්ශවය නම් එය අපේ පාලනයෙන් තොර දෙයක්. ඔබතුමාලට නඩුවට යන්නම සිද්ධ වෙනවා. ඔබතුමාලා සාකච්ඡා කළා වගේ අදාළ පාර්ශවය ගෙන්නලා මේ සමථය ඇයි ඉටුකරන්න බැරි, ඇයි සමථයට එන්නේ නැත්තේ කියන කාරණය නැවත සාකච්ඡා කරලා මේ සමථ කොන්දේසි අනුව නඩුව අවසන් කරගන්න පුළුවන් නම් ඒක අපි හැමෝටම වටිනවා. ඒක තමයි මගේ අදහස.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා. මුළු සභාවටම පිලිගත හැකි පිලිගත යුතු ඉතාම වටිනා අදහස් ටිකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම ඒක අනුමත කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, අනුමත කරනවා විතරක් නෙමෙයි. බොරුවට කියනවත් නෙමෙයි. අපේ මේ සභාව දීර්ඝ කාලයක් නීති ක්ෂේත්‍රයේ ගැටලුවල සැලකිය යුතු ලෙස තේරුමක් නොමැතිව මහජනයාගේ මුදල් වැය කළා, වැය කරමින් ඉන්නවා. මේක වෙනස් කරගන්න පුළුවන් ඔබ උදව් කළොත්. ඒ උදව්ව සහයෝගය ගන්න සූදානම්. අපි ඇත්තටම මේ නඩුවෙන් නඩුව වෙන වෙනම හදුනාගෙන, මේවා කොහොමද අපි ඉස්සරහට අපි නීතිඥවරු පත්කරගන්නේ කියන එක ගැන අදහසක් ආ යුතුයි. ඒ සඳහා කඩිනමින් අප සභාවේ සිටින නීතිඥවරුන් රැස්කරලා සාකච්ඡාවක් සූදානම් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මධුරංග මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණාව මමත් අනුමත කරනවා. අංක 03 කාරණයට අදාළව. මේ සම්බන්ධයෙන් මම අවස්ථාව ගණනාවකදි සභාවට කරුණු ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් මා හට පවසන විට මා ඔහුට සඳහන් කළා මට මෙතනින් එහාට යන්න බෑ.

මේක සභාවක් අපි නිලධාරින් සමඟ කටයුතු කරන්නේ. ඔබගේ කාරණයත් ඉෂ්ඨවෙනවා නම් අපි මේක අත්හැරලා දාලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීරණයකට එළඹෙමු කියලා. කවුරුහරි වැරදි උපදෙස් දීලා හරි එම පුද්ගලයා එතනින් එහාට ගෙනියනවද කියන එක මම දන්නේ නෑ. මම කියන්නෙත් තව පාරක් ඔහුව ගෙන්නලා සාකච්ඡා කරලා මේ ප්‍රශ්ණය විසඳගමු සභාවේ මුදල් නාස්ති කරන්නේ නැතුව.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.10 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.10 වන දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(4) හා 02(8) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා

5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරයා 2026.08.10 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.08.10 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා

2026.08.10 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

06(04) 2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පළමුවෙන් පැමිණි නිර්දේශය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවුණා. සුජිත් මන්ත්‍රීතුමත් මීට පෙර මතු කරපු. ඉන්පසු අපි එම නිර්දේශය ඉවත් කරලා නැවත සාකච්ඡාවකට

කමිටුවට කැඳවීමට සූදානම් වුණා. නමුත් අප හට සභාවට පෙර එම කමිටුව රැස්කරගන්න නොහැකි වුණා. විශේෂයෙන් අපගේ කොමසාරිස්තුමියගෙනුත් ගරු නගරාධිපතිතුමාගෙනුත් වෙලාවල් වෙන්කර ගැනීම සම්බන්ධව ගැටලු කිහිපයක් නිසා. අපි මේ සභාවෙන් පසුව පැමිණෙන කමිටුවේදි දිනයක් සාකච්ඡා කරලා නැවත කමිටුව කැඳවලා මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරලා, එනම් පොහොර දීමනාව ඉවත් කරනවා නම් ඒ අයට කොහොමද දෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඇයි පොහොර දීමනාව ඉවත් කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, පොහොර දීමනාවයි, දිරි දීමනාවයි දෙකක් දෙන්න බෑනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, දිරි දීමනාවටත් දින 24 සම්බන්ධ වෙනවද ?

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, මගේ යෝජනාවක් තිබෙනවා පොහොර දීමනාව අතරතුරේ බෙල් එකේ සේවකයන්ට යමක් ලබාදීමට. කඩුවෙල වගේ තැනක මාසෙකට පැමිණීමේ දීමනාවක් ලෙස රුපියල් පන්දහසක බඩු මල්ලක් ලබා දෙනවා. යෝජනා තියෙනවා ගොඩක්. ඒවා කමිටුව තුළ කතා කරලා නිර්දේශය සභාවට ගෙනල්ලා සභාවෙන් හොඳ තීරණයක් ගැනීමේ අදහසක් තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, සභාපතිතුමා ඒ වන තෙක් මේ සේවකයන්ට පොහොර දීමනාව ලබා දෙනවද?

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ඔව් ඒ දීමනාව ලබාදෙනවා. ඒකේ වෙනසක් සිදුවෙන්නේ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, අනු කමිටුවට අපිවත් කැඳවන්න. අපගේ අදහස් ලබාදෙන්න කැමතියි.
ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 04.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රිතුමා අපි කැඳවන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 04. මම ආයාචනා හා පෙත්සම් යටතෙත් සඳහන් කළා ධූමායන දෙකක් මිලදි ගැනීම සම්බන්ධව. මෙහි සඳහන් කරලා තියෙන්නේ ධූමායන යන්ත්‍රයක් කැඩී ඇති බැවින් ධූමායන කටයුතු සාර්ථකව කරගෙන යාමට නොහැකි තත්ත්වයකට පත්ව ඇත. එබැවින් ධූමායන යන්ත්‍ර දෙකක් කඩිනමින් මිලදි ගැනීමට අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි යනුවෙන්. මේකට දැන් කුමක්ද සිදුවෙලා තියෙන්නේ. මුදල් කමිටුවට ගියාද?

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, අපි සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙන් දැන ගැනීමට කැමතියි 02(11), මොරටුව මහා නගර සභාව මගින් ක්‍රියාත්මක ආදර්ශ කොම්පෝස්ට් අංගනය පිහිටි භූමිය තුළ බී.එස්.එෆ්. බ්ලැක් සෝල්ජර් ෆ්ලයි ක්‍රමය තුළින් ආදර්ශ කොම්පෝස්ට් ඒකක කිහිපයක් කොන්ක්‍රීට්

සිලින්ඩර් කිහිපයක් භාවිතයෙන් සකස් කර ගුණාත්මක භාවයෙන් ඉහළ තවත් කොම්පෝස්ට් වර්ගයක් නිෂ්පාදනය කිරීම කියලා සඳහන් කරලා තියෙනවා. අපි දැන ගැනිමට කැමතියි බී.එස්.එෆ්. ක්‍රමය කියන්නේ කුමක්ද කියන එක. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. අපිට ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, දීර්ඝ කාරණයක්. නමුත් මම කෙටියෙන් පැහැදිලි කරන්නම්. දැනට පළාත් පාලන ආයතන බොහොමයක මෙම ක්‍රියාව ආරම්භ කරලා තියෙනවා. මෙය සිදුවෙන්නේ පණුවෙක් හරහා. මේ සම්බන්ධව සජිත් මන්ත්‍රීතුමා දන්නවා. අපි සාමාන්‍යයෙන් සිලින්ඩර් මත තමයි මෙය ක්‍රියාත්මක වෙන්නේ. දැනට නියමු ව්‍යාපෘතියක් හැටියට තමයි අපි මෙය යෝජනා කරලා තියෙන්නේ. කරදියානේ දැනට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. ඒකෙන් පණුවෙක් තමයි නිපදවෙන්නේ. එම පණුවා ඉතාම කෙටි කාලයකින් කොම්පෝස්ට් බවට පත්කර කරගන්න උදව් වෙනවා. විශේෂයෙන් මේ සඳහා විශේෂයෙන් එළවළු, ඉදුල්, බත්,පළතුරු වර්ග වැනි දිරන අපද්‍රව්‍යක්, දාන්න පුළුවන්. අපි මෙතනදි අදහස් කරන්නේ ඉදුල් වැනි දේවල් නොදා අපිට දෛනිකව විශාල වශයෙන් එකතුවන පළතුරු, එළවළු යොදලා එතනින් මෙම ආරම්භය ගන්න. මේ දේවල් දින දාහතරක් වැනි කාලයකදි කොම්පෝස්ට් බවට පත්වෙනවා.ඒකේ ස්ලජ් එකක් තියෙනවා. ඒ ස්ලජ් එක තමයි කොම්පෝස්ට් බවට පත්වෙන්නේ. ඒකෙන් ඉතාම මිල අධික වේස්ට් කරන අය භාවිතා කරන ඔයිල් එකක් හැදෙනවා. අපිට එච්චර දුරට තාක්ෂණයෙන් අපිට යන්න බැරිවෙයි. ඊට අමතරව මෙම පණුවා අධි ප්‍රෝටීන ආහාරයක් කුකුළන් සඳහා. එහි ආකාර ගොඩක් තියෙනවා. මුදල් කමිටුවට යොමු කරලා තියෙනවා එහි විස්තර සඳහන් වෙනවා. ඉංග්‍රීසි භාෂාවෙන් තියෙන්නේ. සමහර දේවල් තේරුම් ගන්න මටත් අමාරුයි. මෑතකදි කරදියාන කසුන් මහත්මයා ඇවිල්ලා යම් පැහැදිලි කිරීමක් කළා. අපිට පුළුවන් මේ සම්බන්ධව දිනයක් යොදාගෙන සියලු මන්ත්‍රීවරුන් කැඳවලා, එතුමා හරහා පුළුල් අවබෝධයක් ලබාදෙන්න. මේක ඇත්තටම හොඳ වැඩක්. අපේ තිබෙන භූමි ප්‍රමාණයේ ප්‍රශ්ණයකුත් තිබෙනවා. අපි ඉතා කුඩා පරිමාණයෙන් ආරම්භ කරලා බලනවා. අපි ඉදිරියට සභාවේ සම්මත කරගත්ත ප්‍රධාන ව්‍යාපෘතියක් තියෙනවනේ. ඒකට අදාළවත් මේ වගේ ව්‍යාපෘතියක් නැවත විශාල පරිමාණයෙන් ඇතුළත් කරගන්න උත්සහයක් තියෙනවා.දැනට කසළ කළමනාකරණ ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් මෙය භාවිතා වෙනවා. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රාදේශීය සභා මට්ටමෙන් ආරම්භ කරලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් ඔබතුමන්ගේ අවධානය යොමු කරනවා කරුණු අංක 03 සම්බන්ධයෙන්. එය ඉතා වැදගත් යෝජනාවක්. නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට අනුව පවත්වන ජ්ලැනින් කමිටුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හට අසුන් ගැනීමට අවස්ථාව ලබාදීම සම්බන්ධව. විශේෂයෙන් අපජල කළමනාකරණ සම්බන්ධයෙන් තිබෙන රාජකාරියේදි ඔබතුමා සහ සෞඛ්‍ය කමිටුව ගත්ත තීරණය ඉතා වැදගත්. ඒ නිසා මෙය ක්‍රියාත්මක කරලා මීළඟ කමිටුවේදිවත් ඔවුන්ට අවශ්‍ය අසුන් ගැනීමේ කටයුත්ත කඩිනමින් ඉටුකරලා දෙන්න.

ගරු නගරාධිපතිතුමා, බී.එස්.එෆ්. ක්‍රමය සම්බන්ධයෙන් ගත්තොත් මම ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් අධ්‍යයනය කරලා තියෙනවා. එය හොඳ ක්‍රමයක්. කසුන් මහත්මයාත් ඒ සම්බන්ධයෙන් හොඳ දැනුමක් ඇති පුද්ගලයෙක්. විශේෂයෙන් මම අකමැති වෙච්ච කොටස තමයි අවසාන වශයෙන් පණුවන් ටික කුකුළන්ට ආහාරයට දීම. අනිත් සියල්ලම ගත්තම හොඳ ක්‍රමයක්. විශේෂයෙන් මේ ක්‍රමයට අමතරව තවත් ක්‍රම කිහිපයක් තිබෙනවා. ඒ නිසා මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කැමැතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුව තිබෙන මේ ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙන්න අවශ්‍යයි. වීරපුරන්අප්පු ඝාතනය වෙච්ච දවස අගෝස් 08 වෙනිදා ඔබතුමාගෙත් ප්‍රාදේශීය ලේකම්තුමාගෙත් ප්‍රධානත්වයෙන් ඉතාමත් හොඳ ඩෙංගු මර්දන වැඩසටහන් සිදුකළා. එහිදි අපගේ නිවාස සංකීර්ණය පිටුපස රේල්වේ ස්ටේෂන් එක අයිනේ තිබෙන අනවසර ඉදිකිරීම් සම්පූර්ණයෙන් ඉවත් කළා. එහි පදිංචියක් නොමැති වුනත් වෙන වෙන අයතා දේවල් එතන සිදුවුණා. අපි ඉහළ මහලයේ සිට බලද්දි ගොඩක් දේවල් පේනවා. ප්‍රාදේශීය ලේකම්තුමා අපට පැවසුවා පුළුවන් නම් එම ස්ථානයේ මල් ටිකක් සිටුවා එය නඩත්තු කරගන්න කියලා. අපි උත්සහයක් ගන්නවා එම ස්ථානයේ මල් ටිකක් සිටුවලා නඩත්තු කරන්න. විශාල කාලයක් තිස්සේ තිබුණ ගැටලුවක් අවසන් කළාට ඔබතුමාටත් ප්‍රාදේශීය ලේකම්තුමාටත් ගෞරණීය ප්‍රණාමය මම පුද කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඩෙංගු මාතෘකාව යට ගිහින් 22 සම්බන්ධයෙන්නේ කතා කරන්නේ. නමුත් ඩෙංගු තවමත් තිබෙනවා. මම යෝජනාවක් ඉදිරිපත් කරන්නත් හදලා මේ විදිහට අදහසක් පළ කරන්න සිතුවේ ඔබතුමාගේ තිබෙන සංවේදිබව නිසා. අපේ කාණු පද්ධති බොහොමයක ජලය බැස යන්නේ නෑ. එමනිසාම මදුරු ග්‍රහණය වැඩිවෙලා තිබෙනවා. ගොඩක් ස්ථානවලට ගියාම ප්‍රදේශවාසින් අපෙනුත් අහනවා අපේ ගෙවල්වලට ඇවිල්ලා ඔයාලා නඩු දානවා කාණු වල මදුරුවන් සිටිද්දි, බෝවෙද්දි කාටද නඩු දාන්නේ කියලා. සමහර කාණු තිබෙනවා ගප්පි වගේ මාළු ජාති තාම යම් ප්‍රමාණයක් ඉන්නවා. එහෙම ගප්පි සිටින කාණු වල මදුරු ග්‍රහණය යම් අඩුවක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපගේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමඟ සාකච්ඡා කරලා, අපේ ඩෙංගු මර්දන කණ්ඩායම යොදවලා, අපේ කොට්ඨාශවල මන්ත්‍රීවරුන් සිටිනවා ඒ අයගෙනුත් විමසලා යම් වැඩපිළිවෙලක් යොදන්න. මක්නිසාද ඔක්තෝම්බර් නොවැම්බර් මාස වන විට දැවැන්ත වර්ෂාපතනයක් ලැබෙන බවට කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි පළ කරනවා.මේ වන විට ඩෙංගු යම් ප්‍රමාණයකින් අඩුවෙමින් පවතිනවා. නමුත් නැවත වතාවක් ඩෙංගු වැඩිවීමේ අවධානමක් තිබෙනවා. ඒ නිසා දැන් ඉදලා ඒ සම්බන්ධයෙන් පූර්ණ මැදිහත්වීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය

13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(10), 02(11), 03 හා 04 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් 2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.11 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

06(05) 2026.08.11 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ කමිටුවේ ඉතා වැදගත් කාරණා තමයි තිබෙන්නේ. නමුත් දීර්ඝ කාලයක් තිස්සේ මෙම කරුණු නිතරම එනවා. එම නිසා ඒ වෙනුවෙන්ම අපි කමිටුවට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ මැද විකට්ටුව සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කැමැතියි. එය තාම ඉටුවෙලා නෑ. මාස ගාණක් තිස්සේ මෙම කරුණ එනවා. කුමක්ද මෙහි තත්ත්වය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සති දෙකක් ඇතුළත විසඳලා දෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගිය සභා වාරෙදිත් කිව්වා සති දෙකකින් විසඳලා දෙනවා කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, කිව්වේ නෑ. දැන් හොයලා බලනකොට පස් ලෝඩ් හය ගෙනල්ලා තියෙන්නේ. දුම්නිදව අරගෙන විකට් යම් ප්‍රමාණයක් හාරන්න අවශ්‍යයි. ඉන්පසුව ඒ පස් ටික දාලා විකට් එක හදන්න තියෙන්නේ. ඊයේ පෙරේදා දිගටම මේ සම්බන්ධව සාකච්ඡා කළා. පස්වල ප්‍රමිතියත් බලලා තියෙන්නේ.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසීනා බක්කර් මහත්මිය

9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.11 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා)

06(06) 2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(02) සම්බන්ධයෙන් අදහස් දැගැනීමට කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එහි ඉදිරි කටයුතු සඳහා වාර්තාවක් ඉල්ලුවා රථ වාහන දෙපාර්තමේන්තුවෙන්. අබලින් භාණ්ඩ වෙන් කිරීම සඳහා සහභාගිවෙන්න කියලා අදාළ නිලධාරින්ට ලිපියක් යවලා තියෙනවා. ඔවුන් තාම ඊට සහභාගි වෙලා නෑ. ඔවුන් සහභාගි වූ වහාම එම කටයුත්ත සිදු කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙය සභාව මුහුණ දීලා තිබෙන විශාල ගැටලුවක්. අපිට වැඩ කරන්න ජේ.සී.බී.රථයක් නෑ. නමුත් ජේ.සී.බී.රථ තුනක් පමණ පේන්න තිබෙනවා. අබලි වලට යන වාහන විශාල ප්‍රමාණයක් මේ භූමියේ රඳවාගෙන සිටිනවා. මෙය නිලධාරින් සතු වගකීමක්. මෙම

කටයුත්ත කඩිනමින් අවසන් කරන්න පුළුවන් ක්‍රියාවලියක් අවශ්‍යයි. කොමසාරිස්තුමිය, මෙම කටයුත්ත නිශ්චිතව අවසන් කරන දිනයක් සභාවට ඉදිරිපත් කරන්න. මාසයක් ඇතුළත ඉවර කරන්න. සභාවට කියන්න. නැත්නම් අපට දෙන්න අපි එම කටයුත්ත ඉවර කරන්නම්. කොට වගයක් දාගෙන ඉන්නවා පස් වෙනකම්. කමිටුවකුත් පත් කළා. අපිට නීති විරෝධී පැත්තට මේක පත්කරමින් ඉන්නේ. අපි මේවට මැදිමත් වුනොත් අපිවත් අහුවෙනවා ලී හොරකම් කළා කියලා. මම නිලධාරින්ට ඉතාමක් වගකීමෙන් කියන්නේ, කොමසාරිස්තුමියටත් අදාළ ලිපියකුත් නිකුත් කළා. අපි තීන්දු තීරණ ගන්නවා, එවා කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නෑ. සමාවෙන්න ඕනා. මේවා කිව යුතු දේවල් නෙමෙයි. නමුත් කියන්න සිදුවෙනවා. මම ජාතික කොඩිය ඔසවන්න දෙපාර්තමේන්තු වලට භාරදෙන්න කිව්වා. දවසක් දෙකක් ආවා. දැන් මම තනියෙන් එය සිදුකරනවා. කිසි දෙයක් සත පහකට ගනන් ගන්නේ නෑ. මම කියන්නේ මේ හැම දේකටම මීට වඩා සැලකිල්ලක් දැක්වුවහොත් මේ ආයතනයට මීට වඩා හොඳ තැනකට ගන්න පුළුවන්. අපිට වෙනම ලකුණු අවශ්‍ය නෑ. අපි මහන්සි වෙන්නේ මේක හරියට හදලා දීලා යන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම දන්න විදිහට ආර්.එම්.බී.එකේ අවසරය ලැබෙන්න මේ වාහනවල චැසි නම්බර් අවශ්‍ය වෙනවා. මේ සෑම වාහනයකම එම චැසි නම්බර්, අවශ්‍ය කරන දේවල් තිබෙනවද?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම දන්න විදිහට එකක දෙකක පමණයි ගැටලුවක් තිබෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ගියවර සභාවෙදිත් තීරණය කළේ එවැනි ප්‍රශ්ණ තිබෙන ඒවා ඉවත් කරලා ඉතිරි ටික ඉතා ඉක්මණින් කරන්න. ඒ අවස්ථාවේදි විවාදයකුත් පැවතුණා. තක්සේරු අංශයේ තිබුණ එක වාහනයක විස්තරයක් ආවේ නෑ කියලා මාසයක් ගත්තා. ඒ අවස්ථාවේදි අපි විශේෂයෙන් මැදිහත් වුණා එහෙම වෙන්න බෑ ඉතා ඉක්මණින් කරන්න අවශ්‍යයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(6). සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන්. එහි සඳහන් කරලා තියෙනවා මිල ගණන් විද්‍යුත් තැපෑල හරහා කැඳවීම පිළිබඳව. එය බොහොම හොඳයි. මම හිතනවා මෙය ඉංජිනේරු දෙපාර්තමේන්තුවට පමණක් නෙමෙයි නාගරික ගරාජයටත් හොඳයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි ඊට අදාළ කමිටුවේදි ඔබතුමා හිටියේ නෑ. ඊ ප්‍රොකියුමන්ට්ස් වලට නීත්‍යානුකූලභාවයක් සභාව තුළ නෑ. එය තමයි ගැටලුව වෙලා තිබුණේ. එම නිසා මෙම සාකච්ඡාව එතනදි නැවතුණා. අපි යෝජනා කළේම ඊ ප්‍රොකියුමන්ට්ස් වලට එනවා නම් හොඳයි කියන එකයි. මක්නිසාද මෙය ගෙනාවෙම ගරාජය සම්බන්ධව තමයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සටහනක් නෑ ගරාජය සම්බන්ධව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඇත්තටම නීත්‍යානුකූල පසුබිමක් නොමැතිකමේ ගැටලුව තමයි තිබෙන්නේ

මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනි, එහි තිබෙනවා භාණ්ඩ මිලදි ගැනීමේ ක්‍රියාවලියේදි වැයවන ශ්‍රමික පැය ගණන අඩු කිරීම. බොහොම හොඳයි. අපිත් ආණ්ඩු පක්ෂය නියෝජනය කළානේ. යම් යම් අකටයුතුකම් අපිත් දැක්කා.සභාපතිතුමා හොඳ යෝජනාවක් කරලා තියෙනවා. තව එහි සඳහන් වෙනවා ඉන්ධන පරිභෝජනය අවම කරගැනීම. මම දැක්කා ඒ කාලේ ගරාජයේ සිටි පිරිස මිලදි ගැනීමක් ආවම ක්ෂණිකව යනවා කොළඹ. එයින් යම් කිසි ප්‍රතිලාභයක් ඔවුනට ලැබෙනවා. ඒවා අවම කරන්න තමයි දැන් ඔබතුමාලා පත්වෙලා තියෙන්නේ. මේ දේවල් ක්‍රියාත්මක කරලා සී.සී.ටීවි සවි කරලා අවශ්‍ය දේවල් කළා නම් ඔබතුමාලගේ පුනරුදය වගේ දෙයක් වෙයි කියලා මම හිතනවා.

මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, මන්ත්‍රීතුමා අපි අනිවාර්යයෙන්ම වෙනස් කරනවා. ඔබතුමා මෙය සඳහන් කරපු එක හොඳයි. භාණ්ඩ මිලදි ගැනීම කාර්යක්ෂම කිරීම සඳහා අපි බිමල් මෝටර්ස් නිල වශයෙන් නම් කරලා තියෙනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, දැන් භාණ්ඩ මිලදි ගැනීම සඳහා කොළඹ යන්නේ නෑ.

මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, ඒවගේම යාන්ත්‍රික ඉංජිනේරුතුමාගෙන් ගිය කමිටුවේදිත් ඉල්ලීමක් කළා අගුලානේ සර්විස් මැෂින් එක ඉතා කඩිනමින් අවසන් කරන්න කියලා. එහි සි.සී.ටීවි සවි කිරීමේ යෝජනාව සම්මත වෙලා තිබෙනවා. එය සැපයුම් අංශයටත් භාරදීලා තිබෙනවා. ඉතා ඉක්මණින් අපි එය කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනි, නාගරික ගරාජයේ පරිපාලන නිලධාරිගේ නිල කාමරය හා බාත්රූම් එක අවසන් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, ඒ සඳහා ටෙන්ඩර් එකක් ඕපන් කරන්න ඕනා. එය සෘජු ශ්‍රමිකව කරන්න බෑ. අපි උත්සහ කළා. තාක්ෂණ නිලධාරි කෝකිලා මහත්මිය තමයි භාරව සිටියේ. අවස්ථා තුනකදීම එතුමියත් එක්ක දිගින් දිගටම වාද වෙලා අවසානයේ නාගරික ඉංජිනේරුතුමා කිව්වා ලබන සතියේ ටෙන්ඩර් එක ඕපන් කරනවා කියලා. අපි ඉතා ඉක්මණින් නාගරික ගරාජය හොඳ මට්ටමකට ගේන්න උත්සහ කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(5) සහ 02(6) නාගරික යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කියලා එක කරුණක් ආරම්භ වෙනවා අනිත් කරුණ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කියලා ආරම්භ වෙනවා. නමුත් ගරාජයේ තිබෙන වාහන සම්බන්ධව තමයි දෙකෙහිම සඳහන් වෙන්නේ. මෙය වැරදීමකින් ද නැත්තම් ඇත්තටම නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව කියන එකද 02(6) තිබෙන්නේ කියන එක මා හට ගරු සභාපතිතුමාගෙන් දැන ගැනීමට අවශ්‍යයි. යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්ත්මේන්තුව කියන එක ද එතන සඳහන් වෙන්න අවශ්‍යය.

මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය විය යුතුයි.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, එය යාන්ත්‍රික ඉංජිනේරු ලෙස සංශෝධනය කරන්න. ගරු නගරාධිපතිතුමා, මම සභාපතිතුමා හට ස්තුතිවන්ත වෙනවා. 02(6) යෝජනාව සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා මාගේ පාසල් මිතුරාට. මක්නිසාද තමයි මේ වනවිට නගර සභාවේ වංචා දූෂණ වැඩි ප්‍රමාණයක් සිදුවන ස්ථානවලින් එකක් නාගරික ගරාජය නිසා. ඒනිසා මෙම ක්‍රියාවලිය ඒ සම්බන්ධයෙන් සාධනීය ලෙස අපි දකිනවා. මෙය ඇත්ත වශයෙන්ම සිදුකරන්න පුළුවන් නම් ඔබතුමාට අපි ගරු කරනවා.

ගරු නගරාධිපතිතුමා, අංක 02(5) යටතේ නාගරික යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත් කිරීම සඳහා පහත සඳහන් යෝජනා ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණ කමිටුව ඉදිරිපත් කරනවා කියලා යෝජනා පහක් සඳහන් කරලා තියෙනවා. එහි පළවෙනි යෝජනාවේ සඳහන් වෙනවා කළාප කාර්යාලයීය පදනමින් කළාප කාර්යාල 05 සඳහා එක් දින වැඩමුළු පහක් පැවැත්වීම කියලා. මම කියන්න කැමතියි වැඩමුළු 05 ක් පවත්වන්න දින 05ක් වැයකරනවට වඩා එක දවසක මේ සියල්ලෙහිම රියදුරු මහතුන් රැස්කරලා කරන්න පුළුවන් නම් එය වටිනනවා කියලා. මක්නිසාද සම්පත් දායකත්වයට එන්නේ අපේ ඉංජිනේරු මහත්මයා නම් එතුමත් කාර්යබහුලයි. මෙය හොඳ වැඩක්. එක දවසක කරන්න පුළුවන් නම් වටිනවා.

මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, ඒ සම්බන්ධව සඳහන් කරනවා නම් අපි එහි පළමු වැඩසටහන කළා. එහිදි වාහනය නඩත්තු කිරීම සහ රථයේ රනින් චාට් එක සම්බන්ධයෙන් උපදෙස් ලබාදුන්නා. අපිට පොඩි ගැටලුවක් ආවා අපට ඉන්වෙන්ට්‍රි ලෙස වාහන ලබාගෙන තිබෙන රියදුරන් ඉන්නේ කිහිප දෙනයි. නමුත් වාහන තිබෙනවා එකසීය ගාණක්. එවිට ගැටලුවක් ආවා එක් රියදුරකුට වාහන තුන හතරක් භාරදීම සම්බන්ධව. ඉන්පසු අපි තීරණය කළා පසුගිය කමිටුවේදි පලමු පියවර ලෙස සෞඛ්‍ය අංශයේ රියදුරු මහතුන්ව ඉන්වෙන්ට්‍රි ලබාදීමට සහ ඔවුන්ගේ නඩත්තු වැඩසටහන් කිරීම සමබන්ධයෙන් දැනුවත් කරන්න. මේ වන තෙක් සෞඛ්‍ය අංශයෙන් ඉන්වෙන්ට්‍රි කර තිබෙන දත්ත විස්තර ලැබී තිබුණේ නෑ. අපි ඉදිරියේදි නිශ්චිත වාර්තා ලැබුණු පසු ඉතාම පැහැදිලව රියදුරෙකුට අවශ්‍ය කරන ඔහුගේ කාර්ය සටහන , ඔහු වාහනයක් නඩත්තු කළ යුත්තේ කොහොමද , ඔහු වාහන ආයතනයෙන් බැහැරට ගෙනියනවා නම් කොහොමද කියන කාරණා විශාල සංඛ්‍යාවක් ගැන සාකච්ඡා වෙනවා. එම වැඩමුළුව ඉදිරියේදි ඉන්වෙන්ට්‍රි තිබෙන රියදුරන් සම්බන්ධයෙන් තොරතුරු ලැබුණු පසු අපි එය සාර්ථකව නිම කරනවා.

මහා නගර සභා සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, ඇත්තටම මෙහි හොඳ යෝජනා ටිකක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මා හට දැන ගැනීමට අවශ්‍යයි, සාමන්‍යයෙන් අපි දන්න විදිහට වාහනයක් දෙන්න පුළුවන්, පවරන්න පුළුවන් ස්ථීර සේවකයෙකුට පමණයි. ඒවගේම වාහන පැදවීමට අවසර දෙන්න බෑ මෑන් පවර් සේවකයන්ට. මක්නිසාද හදිසියේ අනතුරක් සිදුවුවහොත් එහි වගකීම ගන්න කෙනෙක් නෑ. නමුත් අපිට දැනගැනීමට ඇති පරිදි මේ වන විට මෑන් පවර් සේවකයන් කිහිපදෙනෙක්ම වාහන පදවනවා කියලා. ඒවගේම රියදුරු පුරප්පාඩුව සඳහා බඳවාගත් පුද්ගලයෙක් මුලින්ම ජේ.සී.බී.ගෙනියලා හප්පලා. එම තාප්පය පිළිසකර කිරීමට සිදුවී ඇත්තෙත් අපට. දැන් එම සේවකයාට කැබ් එක්ක

භාරදීලා තියෙනවා කියලත් දැන ගැනීමට ලැබිලා තිබෙනවා. එමනිසා ඒ සම්බන්ධයෙන් හොයලා බලන්න. මම නම කියන්න කැමති නෑ. මක්නිසාද එය සභාගත වෙන නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමා එම රියදුරු මහතා ගැන සඳහන් කරනවා නම් ඔහු සුදුසුකම් ලත් රියදුරෙක්. සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා තමයි අරගෙන තිබෙන්නේ. මූලික සුදුසුකම් පරීක්ෂණවලින් සමත්වුණ රියදුරෙක්. රියදුරෙක්ගෙන් රිය අනතුරක් වෙන්න පුළුවන් සම්භාවිතාවක් තියෙනවා. ඒ හැර මෙතෙක් ඔහු පිළිබඳ වෙනත් චෝදනා නෑ. අපේ නගර සභාවේ සියලුම රියදුරන්ට මෙම ගැටලුව තිබෙනවා. එමනිසා තමයි අපි ඉහත වැඩසටහන ගත්තේ. මේ වන විට වාහනයකට ආදරය කරන රියදුරන් අඩුයි. ඉස්සර මොරටුව මහා නගර සභාව කිව්වම වාහනයට ආදරය කරපු, වාහන සම්බන්ධයෙන් වගකියපු හොඳ රියදුරු මහතුන් සිටිය තැනක්. එය ක්‍රමිකව මැකිලා ගිහිල්ලා දැන් අඩුම තරමේ වාහනය සෝදන්නේ නැති රියදුරන් තරමට පත්වෙලා. අපි මෙය වෙනස් කරන්න තමයි සුජීත් මන්ත්‍රීතුමා මේ වැඩසටහන සකස් කරමින් යන්නේ.

<u>මහා නගර සභා සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සභාපතිතුමා ඔබට දොස් කියනවා නෙමෙයි. මෙය බොහොම හොඳ යෝජනාවක්. අපි කිව්වේ මෑන් පවර් සේවකයන්ට හා ඔබතුමා කිව්වට එම සේවකයා පාස්වෙලා කියලා අපිට දැන ගැනීමට තිබෙන්නේ ඔහු අසමත් වෙලා යම් අයකුගේ බලපෑම මත බඳවා ගත්තා කියලා. මන්ත්‍රීවරයෙක්ගේ නෙමෙයි. අපි දන්නේ නෑ කොහොමද කියලා ඔබතුමා හොයලා බලන්න. මේ යහපත් යෝජනාවක් ක්‍රියාක්මක කරන්න පුළුවන් නම් හොඳයි.

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(8) ආපන ශාලාව සම්බන්ධව. මෙහි සඳහන් වන්නේ වෙනත් බදුකරුවෙක් සොයනවා කියලා. මට දැනගැනීමට අවශ්‍යයි එම ගිවිසුමේ බදුකරු අතරමගදි ඉවත්වුණාට පස්සේ ඒ බදුකරුගේ ඩිපොසිට් මුදල නිදහස් කිරීමේ ගැටලුවක් තිබෙනවද කියලා. ගිවිසුම අපි දැක්කේ නෑ. එමනිසා ඒ සම්බන්ධයෙන් දැනගැනීමට අවශ්‍යයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමිය මේ සම්බන්ධයෙන් යම් අවබෝධයක් තිබෙනවද? ඒ ගැන බලලා තමයි කියන්න වෙන්නේ. මටත් ඒ පිළිබඳ අවබෝධයක් නෑ. නමුත් මම යම් කිසි ස්ථාවරයක හිටියා ඔහු කැන්ටිම අවසන් කරපු විදිහ මම පිලිගන්නේ නෑ. ගිවිසුමකින් අපි යම් නිශ්චිත කාලයකට ඔහුට දුන්නා. ඒ කාලය ඇතුළේ ඔහු කැන්ටිම කරගෙන ගියා. මට තදින් දැනුනේ අපේ විශාල සේවක සංඛ්‍යාවක් හැමදාම උදේට එනවා මොනවා හරි කාලා තේ එකක් බොන්න. එක පාරටම ඒක වහලා දැම්මා. මගෙන් තුන් හතර දෙනෙක් කැන්ටිම ඉල්ලුවා දෙන්න විදිහක් නෑ. යන්න ඕනේ ටෙන්ඩර්වලට. ඒක තාම ටෙන්ඩර් එකේ. අඩුම තරමේ ඔහුට තව මාස තුනක කාලයක් කැන්ටිම කරගෙන යන්න කියලා අනිත් කටයුතු ටික සුදානම් කරන්න ඕනේ. එහෙම අඩුවක් වුණා කියන එක තැන තමයි මම ඉන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, එම ටෙන්ඩර් එකේදි අපි කළාප වෙන්කරපු නිසා වෙළඳාම අඩුවුණා කියලා. අපි එහි ලයිට් වතුර බිල් ගෙවන්නත් භාරගත්තා. ඒක අපි කළේ ආදායම් ඉපයීමේ මාර්ගයකට වඩා අපේ සහෝදර සේවකයන්ට හොඳ සේවයක් දෙන්න. එහි මිල ගණන් පවා අපි ඇග්‍රිමන්ට් එකට එන්ටර් කරලා තියෙන්නේ. නමුත් දැන් ඒ ඔක්කොම නැති කරලා හිතුමතේ කිසිදු දැනුම්දීමකින් තොරව වහලා දාලා තියෙනවා. අපේ ගිවිසුමේ එක්සිට් කන්ඩිෂන්ස් තියෙනවා. ඒවා කිසිවක් බැලුවද කියන්න අපි දන්නේ නෑ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එයාගේ නෙමෙයි ගැටලුව. ඔහු නෙමෙයි වගකියන්න ඕනේ. අපි එහෙම කරන්න දීපු වගකිව යුතු නිලධාරිනුයි වගකියන්න ඕනේ.

මහා නගර සභා සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, මම දන්නේ නෑ. කැන්ටිම සම්බන්ධයෙන් අපේ සම්බන්ධයක් නෑ. නමුත් මම දන්න විදිහට හිතුමතේ නතර කළා නෙමෙයි. ලිඛිතව අදාළ පාර්ශවයන් දැනුවත් කරලා ඒ අයගේ උපදෙස් මත තමයි අවසන් කරලා තියෙන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා

ගරු නගරාධිපතිතුමා, ඔය සඳහන් කරන විදිහට සභාවේ සියලු දෙනා අපහසුතාවයට පත්කරලා කැන්ටිම අවසන් කරලා ගියා නම් ගිවිසුම බලන්න. ඔහු ඉවත්වීමේ දැන්වීමක් අපට එවන්න ඕනේ. එසේ ඉවත්වීමේ දැන්වීමක් නිසි පරිදි එවා නැත්නම්, සුජිත් මන්ත්‍රීතුමා මතුකරන ප්‍රශ්නයට පිලිතුර එතෙන තිබෙනවා. ඔහුගේ මාස තුනක ඩිපොසිට් මුදල කපා ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඉස්සරහටත් අපි ගිවිසුම්වලට යනවිට බදුකරුට හිතුමතේ ඉවත්වීමට යාමට නොහැකි පරිදි කොන්දේසි ඇතුළත් කළා නම් මෙවැනි ගැටලු මතුවෙන්නේ නෑ.

මහා නගර සභා සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, එහෙම කපා ගැනීමේ හැකියාවක් තිබෙන්නේ ගිවිසුම් පත්‍රයේ තිබෙනවා නම්. නමුත් ගිවිසුම් පත්‍රයේ නැත්තම් එසේ කපා ගැනීමේ හැකියාවක් නෑ. ඒ නිසයි මම ඇහුවේ ගිවිසුම් පත්‍රයේ කොහොමද තියෙන්නේ කියලා. දැනුවත් කිරීමක් කරලා තමයි නවත්තලා තියෙන්නේ. එහෙම දැනුවත් කළාම අදාළ පාර්ශවය කිවුවා නම් ඔබට එහෙම වහන්න බෑ අපි කාවහරි හොයාගන්නා තෙක් අහවල් දවස වෙනකම් පවත්වාගෙන යන්න යනුවෙන් ඔබතුමා කියපු එක හරි. එහෙම කිවුවා නම් ඔය ගැටලුව මතුවෙන්නේ නෑ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා

14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(2) හා 02(6) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(5) හා 02(6) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලද අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.11 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

06(07) 2026.08.12 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කමිටු සාමාජිකයෙක් ලෙස මට ප්‍රකාශයක් කරන්න අවශ්‍යයි කරුණු අංක 02(6) සම්බන්ධව. ප්‍රථමයෙන් කීමට අවශ්‍යයි ඵලදායිතා හා මුදල් උත්පාදනය කිරීමේ කමිටුව කියන්නේ විහිලුවකට දාපු කමිටුවක් ද කියලා හිතෙනවා වෙලාවකට. කමිටුව පටන් ගන්න කොට කවුරුත් නෑ. මන්ත්‍රීවරුත් ඇවිල්ලා, ලේකම්තුමත් ඇවිල්ලා බලන් ඉන්නවා. එක නිලධාරියෙක්වත් නෑ මෙම කමිටුව සඳහා උනන්දුවෙන් සහභාගිවීමට.

. ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(6), වඩු කර්මාන්තයෙන් ජනිත වන ලී කුඩු සම්බන්ධව. ඔබතුමාට මතක ඇති අමුණුම 06න් අපි කමිටුවක් පත්කරලා අයි.ඩී.බී.එකෙන් ඇවිල්ලා අපි සාකච්ඡාවක් කළා. කර්මාන්ත ඉංජිනේරුතුමාට අපි භාරදුන්න ප්‍රොජෙක්ට් රිපෝට් එකක හදන්න කියලා.නමුත් එතනින් එහාට කිසිම උනන්දුවක් නෑ. මෙම කරුණ නැවත මීළඟ කමිටුව ගියත් එතනිනුත් තව කමිටුවකට යයි. එමනිසා අපගේ නිලධාරි මඩුල්ල මේ සම්බන්ධව උනන්දු වෙලා අපේ සභාපතිතුමාට සහයොගයක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා. සභාපතිතුමාටත් උවමනාවක් තිබෙනවා මෙය ඉක්මණටම කරන්න. ඒනිසා නිලධාරි මඩුල්ලේ සහයෝගය ලබාදීලා මෙයට උත්තරයක් ලබාදෙන වැඩපිළිවෙලකට අපි යා යුතුයි. මෙතුමා මෙම යෝජනාව දැම්මේ මෙතුමා සභාපති වුණාට පස්සේ. නමුත් මම මේ යෝජනාව දැම්මේ අවුරුද්දකට විතර ආසන්න කාලයකට පෙරයි. මේ ලිපිගොනුවට දැන් වසරක් සම්පූර්ණ වෙලා තියෙනවා. එමනිසා ලිපිලේඛන පුරවාගෙන ඉන්නේ නැතුව ප්‍රශ්ණවලට පිලිතුරක් ලැබෙන ආකාරයට මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමුකරලා නිලධාරි මඩුල්ල මේ සම්බන්ධව දැනුවත් කරන්න.

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(10) ජීව වායු පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධව. හොඳ යෝජනාවක්, නමුත් කිසි අදහසක් නෑ. කමිටුව පිරෙන්න කොළ ගහලා එවනවා. ඉංජිනේරුතුමා විසින් යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. නමුත් එතුමටත් කිසි අදහසක් නෑ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අදහසේ වැදගත්කමක් තියෙනවා. ඇත්තටම සමහර කමිටු නිලධාරින්ගේ නොසැලකිලිමත්භාවයට පත්වෙලා තියෙනවා. මේ සෑම කමිටුවකටම අදාළ වගකිවයුතු නිලධාරින් වගකීමෙන් සම්බන්ධවෙන්න ඕනේ. මන්ත්‍රීවරු ඇවිත් බලන්න ඉන්නවා නිලධාරින් සහභාගි වෙනකම්. මෙම තත්ත්වය වෙනස් කරගන්න ඕනේ කොමසාරිස්තුමිය. ගොඩක් අවස්ථාවල මමත් ගිහිල්ලා බලන් ඉන්නවා. ලී කුඩුවලට අදාළ කාරණයේදී අපි අදාළ ආයතන රැස්කරලා සාකච්ඡා කළා. ඒ වෙලාවේ පැවතුණ උවමනාව තමයි වඩු කර්මාන්ත පැවතුණු ප්‍රදේශවල ලී කුඩු ගොඩ ගැහිලා අසීරුතාවයක තිබුණ එක. ඒනිසා තමයි අපිට මේ සම්බන්ධව වැඩි බරක් තියන්න සිද්ධ වුණේ. රැස්කරපු සාකච්ඡා පැත්තෙන් අදාළ ආයතන වලින් පැවසුවේ ඔවුනුත් ලොකු නිෂ්පාදන ක්‍රියාවලියක ගිහිල්ලා නෑ කියලයි. දැන් මේ වන විට ලී කුඩු ප්‍රශ්ණයක් තරමක් විසඳිලා තියෙනවා. එයින් මම අදහස් කළේ මෙම යෝජනාව පැත්තකට දානවා කියන එක නෙමෙයි. පුළුවන් නම් තවදුරටත් උත්සහ කරලා කමිටුවක් විදිහට යම් දෙයක් කරන්න පුළුවන් නම් හොඳයි. මට විශේෂ ඇගයීමක් තියෙනවා සභාපතිතුමා විශාල මහන්සියක් ගනිමින් සිටිනවා, අලුත් අලුත් දේවල් පිළිබඳ උත්සහ ගනමින් සිටිනවා වැඩේ කරන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, මේ අවස්ථාවේදි ඔබතුමා සඳහන් කළාට ලී කුඩු ගැටලුව විසදුනා කියලා. එය දීර්ඝ කාලීන විසදුමක් නෙමෙයි. සමහර විට එය මේ මාස දෙකට අදාළ වෙන්න පුළුවන්. අපි පටන් ගත්තු අපේ වැඩපිළිවෙල කරගෙන යන්න ඕනේ. කැඳවපු සාකච්ඡාවේ අවසන් ප්‍රතිඵලය වුණා අපට අවසාන නිලධාරි මහත්මා ප්‍රකාශ කළා මේ සම්බන්ධයෙන් යම්කිසි දෙයක් සිදුකිරීමේ හැකියාවක් තිබෙනවා. එමනිසා මේ සම්බන්ධයෙන් ඉංජිනේරුතුමා හරහා නැවත ප්‍රොපොසල් එකක් ඉදිරිපත් කරන්න කියලා. මෙය කරන්න පුළුවන් හැකියාවක් තියෙනවා. එමනිසා අපිට ළඟටම ආපු අවස්ථාවක් නැතිවුනොත් ඒක මොරටුවට කරන ලොකු අපරාධයක්. ඇත්තටම මේක කරන්න පුළුවන් දෙයක්. අපි ඇස් දෙකට දැක්කා එයාලට ඒක අමතක වෙන්න ඇති. මම ඇස් දෙකින් දැක්කා ලී කුඩු වලින් මල් පෝච්චියක් හරි හදලා තියෙනවා. දැකපු දේ තමයි මම කිව්වේ. ඒක නැතිකරගන්න අවශ්‍ය නෑ. මෙච්චර දුරට ආපු එකේ තව ටිකක් මහන්සි වෙලා ඉදිරියට ගියා නම් මෙ වැඩපිළිවෙළ සාර්ථක වෙනවා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි කරුණු අංක 02(5) සම්බන්ධව. එහි සඳහන් වෙනවා මොරටුව මහා නගර සභා පරිශ්‍රය තුළ පවතින ත්‍රිරෝද රථ ගාල සම්බන්ධයෙන් කියලා. ගරු සභාපතිතුමා, මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, මෙය බල ප්‍රදේශය තුළ තිබෙන ත්‍රිවිල් සම්බන්වයි.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, වචනයේ වරදක් තිබෙන්නේ. එය බල ප්‍රදේශය යනුවෙන් සංශෝධනය විය යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඇමුණුම් අංක 02 සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කැමතියි. පී.බී.7689 දරණ කැබ් රථය ලීටර් 770ක් භාවිතා කරලා තියෙනවා. එහි වටිනාකම ගත්තොත් රුපියල් දෙලක්ෂ අනු හතරදහස් එකසීය හතළික වගේ මුදලක්. මාසයක් තුළ ඩීසල් සඳහා වැයකරලා තියෙනවා. 56-7707 සඳහා ලීටර් 410යි, මුදල රුපියල් එක්ලක්ෂ පනස් හයදහස් හයසීය විස්සක්. නමුත් නගරාධිපතිතුමා වන ඔබතුමාගේ වාහනය සඳහා වැය වෙලා තිබෙන්නේ ලීටර් 160යි. උප නගරාධිපතිතුමියගේ වාහනය සඳහා ලීටර් 200යි, නාගරික කොමසාරිස්තුමියගේ වාහනය සඳහා ලීටර් 250ක් වැයකරලා තියෙනවා. මුදල රුපියල් අනු පන්දහස් පන්සීයක්. නගරාධිපති හා උප නගරාධිපතිට වඩා රාජකාරි තිබිලා තියෙනවා නාගරික කොමසාරිස්වරියගේ කැබ් රථයට. ඒවගේම 58-2054 සඳහා ලීටර් 440යි. එමනිසා කැබ්රථ සඳහා ඩීසල් කොපමණ ප්‍රමාණයක් වැයවෙනවද කියන කරුණ සම්බන්ධයෙන් අදාළ කමිටුවේ සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා. ලීටර් 770ක් කියන්නේ සැලකිය යුතු ප්‍රමාණයක්. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ මොරටුව ජනතාවගේ මුදල්.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ප්‍රධාන කාරණා දෙකක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. එක් කරුණක් තමයි විශේෂයෙන් අපි මෙතන සාකච්ඡා කරපු 02(10) කරුණට අදාළව. එහි සඳහන් වෙනවා බයෝ ගෑස් සී.එන්.ජී. ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න.

ගරු නගරාධිපතිතුමනි, මම දකින දෙයක් තමයි සමහර ව්‍යාපෘති. අපි උදාහරණයක් ලෙස ගත්තොත් බී.එස්.එෆ්.ව්‍යාපෘතිය යම් සාර්ථක තත්ත්වයකට එන්නත් මේ වගේ ව්‍යාපෘතියක් එසේ නොවෙන්නත් ප්‍රධාන ගැටළු එකක් තියෙනවා. ඒ ගැටළු එක අපි මේ වාර්තාව තුළ හඳුනාගත්තේ නැත්තම් මේ වාර්තාව අපිට ලබන මාසෙත් තියෙනවා, ඊළඟ මාසෙත් තියෙනවා ලබන අවුරුද්දෙත් තියෙනවා යෝජනා විදිහට විතරක්. මෙහි අනු කමිටුවේ යමසිංහ මහත්මයා ඉන්නවා, ප්‍රියශාන්ත මහත්මයා ඉන්නවා, රුක්මන් ජයසේකර මහත්මයා ඉන්නවා. මෙම අනු කමිටුව තුළ බාහිරින් සම්පත් දායකයන් ලෙස නොමිලේ උපදෙස් සපයන්න පුළුවන් අපි කසුන් මහත්මයා සම්බන්ධ කරගෙන තියෙනවා බී.එස්.එෆ්. එකට. ඒ වගේ කෙනෙක්ගේ අඩුපාඩුව නිසා තමයි මෙය ඉදිරියට යන්නේ නැත්තේ. මොරටුව ගත්තොත් මේ ඉන්න අනු කමිටුවට අමතරව අවශ්‍ය තරම් පිරිස ඉන්නවා විශේෂඥභාවයක් තිබෙන. එවැනි අයෙකු මෙම කමිටුව තුළ හෝ පිටතින් හරින් සම්බන්ධ කරගත්තොත් මෙය ඉදිරියට යනවා. ගොඩක් කාරණාවල මේ තත්ත්වය තමයි තියෙන්නේ. ඒ නිසා ලබන වාරේ ඉදලවත් මෙම යෝජනාව ක්‍රියාත්මක වීමට අවශ්‍ය නම්, මේ පිළිබඳ විශේෂඥතාවය තිබෙන බොහෝ පිරිසක් මොරටුවේ ඉන්නවා. මම දන්න අයත් ඉන්නවා, ඔබතුමා දන්න අයත් ඇති. විශේෂයෙන් මම මේ විෂය පිළිබඳ ඉගෙන ගෙන තිබෙන නිසා. එහෙම අයෙකු සම්බන්ධ කර ගතහොත් මෙම ව්‍යාපෘති ටික ඉදිරියට යනවා.

ගරු නගරාධිපතිතුමනි, දෙවැනි කාරණය නම්, කරුණු අංක 02(9). අපේ සභාපතිතුමා බොහොම හොඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා පද්ධති විගණනයක් සම්බන්ධව. මම දැන ගැනීමට කැමතියි සභාපතිතුමනි, මම දැක්කා නගර සභාවේ යම් පද්ධතිවල සිස්ටම් ඔඩිට් එකේ තියෙන අඩුපාඩු. මේ සිස්ටම් ඔඩිට් එක හදාගැනීමට අවශ්‍ය අපි විශේෂ ගයඩ් ලයින් එකක් දෙන්න අවශ්‍ය තැනක් තියෙනවා. ඒ තැන පිළිබඳ සභාපතිතුමා දැනුවත් ද කියලා. අපි එනවා මොරටුව මහා නගර සභාවට වෙළඳ බලපත්‍රයක් ලබාගැනීමට. එහිදී ආදායම් පරීක්ෂකතුමා අපට කහපාට කොළයක් දෙනවා ගිනි නිවීම් ඒකකයෙන් සහතිකයක් අරගෙන එන්න කියලා. අපේ දුල්සිරි මහත්මයා ඉතා උනන්දුවෙන් එය ඉටුකරලා දෙනවා. එතන ඉන්න නිලධාරිණියන් දෙදෙනත් අනිත් සියලු දෙනාමත්

එහෙමයි. නමුත් ගැටලුවක් තියෙනවා අපි කහපාට පෝරමය දුන්නට පස්සේ ගෙවන්න තියෙනවා නම් බිල් එකක් කඩලා දෙනවා. ගාස්තු රහිත නම් ගාස්තු රහිත කියලා සඳහන් කරලා දෙනවා. කහපාට කොළය පුරවලා නිල්පාට කොළයේ සඳහන් කරලා දෙනවා නිර්දේශ කළා කියලා. නමුත් එහි තිබෙන ගැටලුව තමයි ඒ නිර්දේශ කිරීමේදි වෙළඳ බලපත්‍රය නිකුත් කරන ස්ථානයෙන් බලන්නේ නෑ කහපාට කොළයට අදාළ බිල ගෙව්වද නැද්ද කියලා.එමනිසා එසේ බිල් නොගෙවපු විශාල ලේඛනයක් තියෙනවා. මම හිතන්නේ ලක්ෂ ගාණක මුදලක් තියෙනවා. දුල්සිරි මහත්මයාටත් සිදුවෙනවා නැවත වතාවක් ඔවුන්ට ඇමතුමක් දීලා ගෙන්න ගන්න. මම අත් විදපු තත්ත්වයක්. මම හිතන්නේ 2026 වර්ෂයට පමණක් සී.ආර්.පොතේ පිටු තියෙනවා තුනක් පමණ තියෙනවා කෝල් කරලා සල්ලා ගෙන්න ගත්ත. එවිට ගරු නගරාධිපතිතුමා, සිස්ටම් ඔඩිට් එක යටතේ ගයිඩ් ලයින් එක නැතිකම සම්බන්ධයෙන් ඔබතුමාගේ විසඳුම කුමක්ද කියලා දැනගැනීමට කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ පේමන්ට් එක කරාට පස්සෙ නැවත වතාවක් උඩට නගින්න ඕනා අපේ ඉන්න ජනතාව.එතකොට මිනිස්සු බැන බැන යන්නෙ මගේ ඉස්සරහත් තුන්දෙනෙක් බැන්නා.පොඩි වෙනසක් තියෙන්නෙ. ඔබතුමාට මම අවධානය යොමු කරනවා පොඩි ගයිඩ් ලයින් එකක් දෙන්න කියලා.ඒ තමයි මෙතනින් අපි බිල ගෙව්වාට පස්සෙ වෙළඳ බලපත්‍ර නිකුත් කරන තැනින් අනිවාර්යයෙන්ම කියන්න, ගිනි නිවීම් සහතිකයේ ගාස්තු රහිත නම් ගාස්තු රහිතයි කියලා දාලා තියනවා.ඔබතුමාගේ හා සමස්ථ අයගේ යහපතටයි මම කියන්නේ.ගාස්තු රහිත නම් සල්ලි ගෙවන්න ඕනා නැහැ.හැබැයි ගාස්තු ගෙවන්න ඕන එකේ බිල ගෙව්වාට පස්සෙ වෙළඳ බලපත්‍රය ගෙවන බිලත් එක්ක සංසන්දනය කරලා බලන්න මේකෙ පේමන්ට් එක කරාද කියලා.එතකොට මිනිසුන්ට උඩ නගින්න වෙන්නෙ නැහැ.ඒ වගේම දහස් ගානක් ලක්ෂ ගානක් අපතේ යන්න වෙන්නෙ නැහැ.පොඩි වෙනසයි.ඒ නිසා ගයිඩ් ලයින් එක තමයි කොමසාරිස්තුමිය හරහා හරි මෙතුමා හරහා හරි මිශ්‍ර ආදායම් අංශයට නිකුත් කරන්න ඕනා.මේ වෙළඳ බලපත්‍රය ගන්නකොට ගිනි රක්ෂණයේ තියෙන සහතිකය සීල් එක වැදිලාද කියලා බලන්න කියලා.එහෙම නැත්නම් මිනිස්සු සල්ලි ගෙවන්නෙ නැතුව යනවා.එතකොට මේ අපතේ යන එක අවම කරගන්න පුලුවන්.ඒක තමයි සිසිටම් ඔඩිට් එකේ ගැප් එක අඩුකරගන්න කරන යෝජනාව.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා

12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජීත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(3), 02(6), 02(9), 2(12), 2(13) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අංක 02(4), 02(7), 02(8),02(10), 02(11), 02(14) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලද අතර අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සජිත් දුමින්ද පීරිස් මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසිනා බක්කර් මහත්මිය
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
11.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
15.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.12 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනෙවිය)

06(08) 2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, වඩු මඩුවක් තියෙනවා. ඒ සඳහා නගර සභාවට වරිපනම් බදුත් ගෙවනවා, වෙළඳ බලපත්‍රයත් අරගෙන තිබෙනවා. මේ අයත් මෙම ප්‍රශ්ණයට මුහුණදීමට සිදුවෙලා. මේ අය කියලා තියෙනවා සති දෙකක් කල් දෙන්න වෙනත් ස්ථානයකට වඩු මඩුව ගෙනියනවා කියලා.මේ ආකාරයෙන් කටයුතු සිදුවුණාම වඩු කර්මාන්තයට කුමක්ද සිදුවෙන්නේ කියලා හිතාගන්න බැරිවෙනවා.මම හිතනවා මෙම ගැටලුව සාකච්ඡා කරන්න අවශ්‍ය ගැටලුවකුත් නෙමෙයි, ලේඛනවලට අරගෙන විසඳන්න අවශ්‍ය ප්‍රශ්ණයකුත් නෙමෙයි. මේවා ක්ෂණිකව විසඳන්න අවශ්‍ය ගැටලු.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

මෙම කරුණ කර්මාන්ත කමිටුවේ කුමක් හෝ අංකයක් යටතේ තිබෙන දෙයක්ද ?

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 04 යටතේ සඳහන් වෙලා තියෙනවා. මට ඊයේ ලිපියක් ගෙනත් දුන්නා. ඔවුන්ටත් මෙම තත්ත්වය උදාවෙලා තියෙනවා කියලා. මම දැනුවත්ව මෙම වඩු මඩුවට අවුරුදු 40කට වැඩියි. එක පුද්ගලයෙක් ඉන්නවා ඔහු හතර වටේටම පෙත්සම් ගහනවා. මීට පෙරත් මේවගේ දෙයක් සිදුවෙලා. එය ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයා මැදිහත් වෙලා එම ප්‍රශ්ණය විසඳුවා. මම එවිට මන්ත්‍රීවරයකුත් නෙමෙයි. මම හිතනවා එතුමාගෙනුත් ඔබතුමා විමසලා වඩු කර්මාන්තය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගනී කියලා. මෙයින් කාටවත්

අසාධාරණයක් සිදුවෙන්න හොඳ නෑ. මමත් එය පිලිගන්නවා. නිවැසියන්ටත් ගැටලුව අවම වන ආකාරයෙන් මෙම කටයුතු සිදුකළා නම් හොඳයි. මෙම ලිපිය මම සභාවට ඉදිරිපත් කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(10), සොයිසාපුර B^1 හා B^2 නිවාස එකක අතර මාර්ගය සංවර්ධනය කිරීමෙන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට යොමු කිරීමට කටයුතු කර ඇති බව කමිටුවට වාර්තාව වූ බැවින් මෙම කාරුණ වාර්තාවෙන් ඉවත් කරනවා කියලා කියනවා. නමුත් මම ගිය මාසේ අන්තිම සතියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියා ඒ වන විටත් ව්‍යාපෘතිය ඇතුළත් වෙලා තිබුණේ නෑ. මෙය සැප්තැම්බර් මාසයට ද ඇතුළත් වෙන්නේ කියලා දැනගැනීමට ක්‍රමවේදයක් තියෙනවාද?

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

සුදේශ් මන්ත්‍රීතුමා මේ සම්බන්ධව අවබෝධයක් තියෙනවද ?

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, මෙතුමිය නියෝජනය කරන ප්‍රදේශයේ මාර්ගය කාපට් කරන්න නේද ඉල්ලන්නේ?.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමා, එම මාර්ගය සංවර්ධනය කරන්න කියලා ඉල්ලන්නේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, අයිතිය තියෙන්නේ නිවාස සංවර්ධන අධිකාරියටද?

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, නැහැ. නගර සභාව සතු පාරවල්. එම මාර්ගය සංවර්ධනය කිරීමේ අදහසක් අපේ යෝජනාවලියේ තියෙනවා. නමුත් මාගේ අදහස නම් ඊට ප්‍රථමයෙන් මෙතුමියලා මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්ණයක් තියෙනවා ජල ගැලීමෙන් යටවීම. ඒ සඳහා කාණු පද්ධතිය සාදා ගත යුතුව තිබෙනවා. අපි ඒ සඳහා තමයි ප්‍රමුඛත්වය දීලා තියෙන්නේ. එතුමියත් එයට එකඟ වෙයි. දෙකම කරන්න අදහස තියෙනවා නමුත් මුදල් ගැටලුව තමයි තිබෙන්නේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, දැනට කාණු පද්ධතිය සඳහා ඇස්තමේන්තුව හදලද තියෙන්නේ ?

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, කෝකිලා මිස්ට මන්ත්‍රීතුමිය කතා කළාද ?

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමා, මම කෝකිලා මිස්ට කතා කළා.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, අපි මේ සම්බන්ධව කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරමු. කාණු පද්ධතිය සකස් කිරීම තමයි වැදගත්ම කාරණය. මක්නිසාද වර්ෂාවට ඒ ප්‍රදේශයම යටවෙනවා. ගලියක් තමයි තිබුණේ. ගලිය හැදුවා ස්වරේජ් එකෙන් ඒ නිසා දැන් වතුර යන්නේ නෑ. ඒ නිසා වැස්සෙන් ගෙවල් සියල්ලම යටවෙනවා. කාණු පද්ධතිය සකස් කිරීම වැදගත් කියලා තමයි මට හිතෙන්නේ. ඒක සභා අරමුදලෙන් අපට කරගන්න පුළුවන්.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, ඇස්තමේන්තු හදලා ඉදිරිපත් කරන්න කියන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, මම කෝකිලා මිස්ව දැනුවත් කරලා එය හදන්න කියන්නම්. පාර සංවර්ධනය කිරීමේ කටයුත්තට අපට තව කාලයක් අවශ්‍යයි. මක්නිසාද ඒ සඳහා විශාල මුදලක් වැයවෙන නිසා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, චෝටර් බෝඩ් එක දැනුවත් කරලා මේ වනවිට ගලි තුනෙන් දෙකක් හදලා ඉවරයි. අනිත් ගලිය තාම කිඳා බැහැලා තියෙනවා.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, ඒක තමයි අපි මේ කියාගෙන යන්නේ. සොයිසාපුර තිබෙන ගලිවල තිබෙන ප්‍රශ්ණවලට වියදම් කරන්න මිලියන 40ක් ලබන අවුරුද්දට නිවාස සංවර්ධන අධිකාරිය යටතේ වෙන්කරලා තියෙනවා. ඒ සියල්ලම හදුනාගෙන ලබන අවුරුද්දට ක්‍රියාත්මක වෙනවා. කාණු පද්ධතියට අදාළව කෝකිලා මිස්ට කියලා ඇස්තමේන්තුවක් හදලා ඉක්මණට හදමු.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, වැසි ජලය බැසයන විදිහට සකස් කර ගන්න අවශ්‍යයි.නැත්තම් වැසි ජලය එන්නේ B1 ,B2 සහ B3 කියන බ්ලොග්ස් වලට.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, එය ඉක්මණට කරමු. මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ටික කාලයක් ගන්න වෙයි.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරලා තියෙන යෝජනාව මේ නිසා ඉවත් වෙනවද?

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, නැහැ. නගර සභා අරමුදල්වලින් ඒවගේ ක්‍රියාවලියට යන්න අපහසුයි. අපි ඒ නිසා තමයි අපි විමධ්‍යගත අරමුදල් යටතේ ග්‍රාමීය මාර්ග හරහා සංවර්ධනය කිරීමට ඉදිරිපත් කරලා තියෙන්නේ. මෙතුමා එයයි අදහස් කළේ.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, මම බලාපොරොත්තු වුණේ අපිට ඉක්මණටම හදලා දෙයි කියලා.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, අනිවාර්යයෙන්ම කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(11) එගොඩඋයන දකුණේ මෝදර මාතෘ සායනය සම්බන්ධව. මාතෘ සායනයේ ඉඩකඩ මදිකම නිසා පිටුපස කොටස සංවර්ධනය කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කළා. එහි නිර්දේශයේ සඳහන් වෙනවා, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, එගොඩඋයන මාතෘ සායනයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට සිංහ සමාජය විසින් එකඟතාවය ප්‍රකාශ කර ඇති බව කමිටුවේදි ප්‍රකාශ වූ බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට නිර්දේශ කරන

ලදී. යනුවෙන්. මේ සම්බන්ධව සිංහ සමාජය අපව වාචිකව ද දැනුවත් කරලා තියෙන්නේ, ලිඛිතව ද දැනුවත් කරලා තියෙන්නේ කියන කාරණය දැන ගැනීමට පුළුවන්ද?

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමිය, අපේ මන්ත්‍රීවරයෙක් හරහා සිංහ සමාජය විසින් ඉල්ලීමක් කළා. අපි ඒ අයව කැඳවලා සාකච්ඡාවක් පැවැත්වුවා. එහිදි එතුමන්ලාගේ අදහස වුණේ අපේ මාතෘ සායනයට අවශ්‍ය කරන සංවර්ධන කටයුතු කිරීමට අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා පානදුර ප්‍රදේශයේ හෝල් එකක සංගීත සංදර්ශණයක් පවත්වන්න. ඔවුන් අපෙන් ඉල්ලීමක් කලා අදාළ පානදුර පළාත් පාලන ආයතනයට කතා කරලා විනෝද බදුවලින් නිදහස් කරලා දෙන්න කියලා. එය අපට කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. අපිට කතා කරලා කියන්න බෑනේ විනෝද බද්දෙන් නිදහස් කරන්න කියලා. එවිට එයාලා කියයි අදාල මුදලින් එහේ හදන්න කියලා. එනිසා එය ප්‍රායෝගික දෙයක් නෙමෙයි. අනිත් කාරණය එයාලා එය සාදා දෙන්න බලාපොරොත්තු වෙන්නේ පෙබරවාරි මාසයේ. අපට එච්චර කාලයක් ඉන්න බෑනේ. එමනිසා අපි මේ ඇස්තමේන්තුවට යටත්ව ලොකු වියදමක් දරන්නේ නැතුව මාතෘ සායනයේ ඉදලා ඉදිරියට කණු කිහිපයක් දාලා වහල ගහලා ඉස්සරහ හදන්න මේ මාසය තුළ බලාපොරොත්තු වෙනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(8). ධර්මබන්දු මාවතේ මැදපාරේ තිබූ ගලි මෝටරය නගර සභාව විසින් ගලවාගෙන එනවා. මට මතක හැටියට මාස දෙකකට උඩදි කමිටුවට සහභාගි වෙන අවස්ථාවේ සඳහන් කළා ගලිමෝටරය ගලවාගෙන ඇවිත් මෙහි තියෙනවා. ගලි මෝටරයේ ඇතුළේ කොටස ඉන්පසුව නෑ. මෙය කොහොම හරි සංවර්ධනය කරන්න අවශ්‍ය නිසා සති දෙකකින් හදලා දෙනවා කිව්වා. දැන් මාස දෙකකුත් පසුවෙලා. මෙහි නිර්දේශයේ සඳහන් කරලා තියෙනවා, ගලි මෝටරය සපයා ගෙන අදාළ ස්ථානයන්හි සවිකිරීමේ කටයුතු සිදුකිරීමටත්, එහි ප්‍රගතිය සම්බන්ධව වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කිරීමටත් කියලා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු සභාපතිතුමා, මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, ගලි මෝටරය සඳහා අපිට දීර්ඝ කාලයක් ගතවුණා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු සභාපතිතුමා, තිබුණු ගලිමෝටරය ගලවගෙන ආවනේ. එය හදන්න බෑ කිව්වනේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමා, මම ඒ ගැන තමයි කතා කරන්න සූදානම් වුණේ. කොරළවැල්ල කොන්ස්ටන්ටයින් මාවතේ ගලි මෝටරයකුත් ගලවාගෙන ඇවිල්ලා මෙහේ තිබ්බා. එයත් හදන්න බෑ කියලා තිබ්බා. ඒ සඳහා ලක්ෂ එකහමාරක පමණ මුදලක් වැයවෙනවා. ඒක හදලා දැම්මා රුපියල් තුන්දහසයි ගියේ. මම විදුලි අංශයෙන් ඉල්ලීමක් කරලා අනිත් ගලි මෝටර් තිබෙනවා නම් කඩිනමින් දෙන්න කියලා. මේ වගේ සුළු මුදලකින් කරගන්න පුළුවන් නම් ඒක හදාගන්න පුළුවන් කියලා. දැන් සති දෙකක් පමණ වෙනවා තාම ඒ සඳහා පිලිතුරක් ලැබුණේ නෑ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු සභාපතිතුමා, මගේ අවබෝධයේ හැටියට තව ගලි මෝටර් තුනක් මිලදි ගැනීමට සැපයුම් අංශයට ඉදිරිපත් කළා නේද?.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමා, මිලදි ගැනීමට ඉදිරිපත් කළා. නමුත් මිල ගණන් කැඳවීමේදි මොරටුව බල ප්‍රදේශයේ නෑ මීට අදාළව ඉල්ලුම් කරනු ලබන ගලි මෝටරය. ඒ නිසා වෙනත් ආයතනයකින් මිල ගණන් කැඳවලා කොළඹින් තමයි මිලදි ගැනීමට තිබුණේ. නමුත් එය තාම ලැබිලා නෑ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
ගරු නගරාධිපතිතුමා, ගලි මෝටර් සඳහා ලබාදෙනවනේ වගකීම් කාලයක්. ඒ කාලය පරීක්ෂා කළා නම් අපිට මුදල් නොගෙවා හදාගන්න පුළුවන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමා, අපේ පැතෙන් අපි උපරිම රාජකාරිය ඉටුකරන්න උත්සහ කරනවා. නමුත් මිල කැඳවීම සම්බන්ධයෙන් කිසිදු ලෙසකින් මැදිහත්වීමට අපට බෑනේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු සභාපතිතුමා, ඔය ඉවත් කළා කියන ගලි මෝටර්වලින් එකක් හැදුවා කියනවනේ අඩු වියදමකින්. එනිසා ගලවා තිබෙන ඉතිරි මෝටර් ටිකත් අරන්ගෙන ගිහින් බලන්න හදන්න පුළුන්ද කියලා.

මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමා, මම මේ සම්බන්ධයෙන් දැනුත් කළා. මීට දවස් තුනකට පෙරත් කතා කළා. අපිට දීලා බලන්න. ලක්ෂ තුන හතරක් වියදම් නොකර අඩු වියදමකින් හදාගන්න පුළුවන් කියලා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු සභාපතිතුමා, අපට බැරිද මේ සම්බන්ධයෙන් සැපයුම් අංශය පැත්තෙන් පිලිතුරක් ගන්න. මමත් මේක වෙනම කතා කරලත් තියෙනවා.හෙට අනිද්දා දිහාවට වැස්සත් එනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමා, ඒ සම්බන්ධයෙන් ඉතා ඉක්මණින් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා
ගරු නගරාධිපතිතුමා, ඒ සම්බන්ධයෙන් යමක් කතා කිරීමට අවශ්‍යයි. ඒ වලවල් වල කොන්ක්‍රීට් ලෑලි කැඩිලා තියෙනවා. එය ඉක්මණින් හදලා දෙනවා කියලා ඔබතුමා පැවසුවත් එය තාම ඉටුවෙලා. දැන් මාස හය හතක් පමණ වෙනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, දුල්සිරි මහත්මයා කවදා වගේ මෙය අවසන් කරන්න පුළුවන්ද?, මෝටරය ගෙන්වන කටයුත්තට ඔයත් සම්බන්ධයි නේද, ගලවගෙන ආපු මෝටර දැනට ගබඩාවේ තිබෙනවද? කවදා වගේ වෙන කොට දන්න පුළුවන්ද? අපි මෝසස් ලේන් එකට සවිකරපු මෝටර් එක ඉතා හොඳ එකක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(37) යටතේ 2026.07.15 වන දින ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා 551/සී උතුරු මොරටුමුල්ල ප්‍රදේශයේ ශ්‍රී බෝධිරුක්ඛාරාම පාරේ පළමුව හමුවන පටුමග ඉනෙක්ස් ආයතනයට යාබඳව පිහිටි පටු කාණුව පුළුල් කිරීම සම්බන්ධයෙන්. එහි තාක්ෂණ නිලධාරි විසින් 551/සී උතුරු මොරටුමුල්ල ප්‍රදේශයේ ශ්‍රී බෝධිරුක්ඛාරාම පාරේ පළමුව හමුවන පටුමග ඉනෙක්ස් ආයතනයට යාබඳ පිහිටි කාණුව සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදුකරන යනුවෙන් සඳහන් කරලා ඒ යටතේ වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා.කරුණු අංක 02(38) යටතේ මෙතුමා විසින්ම යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා 551/සී උතුරු මොරටුමුල්ල ප්‍රදේශයේ ශ්‍රී බෝධිරුක්ඛාරාම පාරේ පළමුව හමුවන පටුමග ඉනෙක්ස් ආයතනයට යාබඳව පිහිට යනුවෙනි සඳහන් කරලා. එකම ස්ථානයක් පිළිබඳව නේද මෙතුමා විසින්ම යෝජනා දෙකක් ඉදිරිපත් කරලා තියෙන්නේ. මෙහි යම් අපහැදිලිතාවයක් තිබෙනවා නේද?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මෙහි කිසිදු අපහැදිලිතාවයක් නෑ. මෙහි යෝජනා දෙකෙහි සංකේතයක් ලෙස ඉනෙක්ස් ආයතනය සඳහන් කරලා තිබෙනවා. නමුත් එහි එක යෝජනාවක් කාණුව සම්බන්ධයෙන්, අනිත් යෝජනාව මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්. කාණුව සම්බන්ධයෙන් කතා කළොත් එය වතුර බැසපු කාණුවක්, එය සභාව විසින් සකස් කළ කාණුවක් නොවන නිසා තාක්ෂන නිලධාරි සඳහන් කරනවා අදාළ සැලසුම් පරීක්ෂා කරලා නිරවුල් කරගෙන තමයි යෝජනාව ක්‍රියාත්මක කරන්න සිදුවෙන්නේ කියලා. අනිත් කරුණ මාර්ගය, මාර්ගය සකස් කරගැනීමට ඉල්ලීම කරද්දි තාක්ෂණ නිලධාරි සඳහන් කරනවා ඒ මාර්ගය නගර සභාව සතු මාර්ගයක් නොවන නිසා එය සංවර්ධනය කිරීමට නම් සභාවට පවරා ගැනීම අවශ්‍යයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෙහි තාක්ෂණ නිලධාරිතුමියගේ වාර්තාවේ තියනවා ඉනෙක්ස් ආයතනයට යාබඳ පිහිටි කාණුව සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදුකරන ලදී. මෙම කාණුව යම් ස්ථානවලදි ඉඩම් මැදින් ගලා බසී යනුවෙන් සඳහන් කරලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දීර්ඝ කාලයක් ජලය ගලා බසින මාර්ගයක් තියෙනවා. ඉඩම් මැදින් තමයි යන්නේ. ඒක දැන් විධිමත් කාණුවක් බවට පත්කරගන්න අවශ්‍යයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මට එහි ගැටලුවක් නෑ. මට පැහැදිලි කරගැනීමට අවශ්‍ය වන්නේ ඉඩම් මැදින් තිබෙන කාණුවක් නම් පාරක් කොහොමද එතන තියෙන්නේ කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේක තේරුම් ගන්න හරි සරළයිනේ. යෝජනා දෙකම පටන් ගැනීමේදි ඉනෙක්ස් කියලා සඳහන් කරලා තියෙනවා. ඔබතුමා ඒ නිසා පටලවාගෙන තියෙන්නේ. පළමු යෝජනාවෙන් ඉල්ලනවා ඉඩම් මැද්දෙන් එන කාණුවක් තියෙනවා. එම කානුව විධිමත් විදිහට බැඳලා සංවර්ධනය කරලා දෙන්න කියලා. එහිදි තාක්ෂණ නිලධාරි කියනවා අදාළ මිනින්දෝරු සැලසුම් පරීක්ෂා කරලා බලලා තමයි තහවුරු කරගන්න වෙන්නේ කියලා. ඊළඟ යෝජනාවෙන් ඉල්ලනවා පාර සංවර්ධනය කරලා දෙන්න කියලා. එහිදි තාක්ෂණ නිලධාරි කියනවා අදාළ මාර්ගය නගර සභාවට

පවරා ගන්න අවශ්‍යයි කියලා. ඒ නිසා පටලවා ගන්න එපා කාණුව යන ලයින් එකෙන් පාර යනවා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ අයිතමය පිළිබඳ අපට කතා කරන්න තැනක් නොමැති නිසා කර්මාන්ත කමිටුවේදි කතා කරන්න අදහස් කළේ. පසුගිය කාල සීමාව පුරාවටම මොරටුව පුරා පවතින පදික වෙළඳ සැල් ඉවත් කිරීම සිදුවුණා. ඒ සඳහා මොරටුව මහා නගර සභාවත්, මාර්ග සංවර්ධන අධිකාරියත්, ශ්‍රී ලංකා පොලීසියත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ව තමයි බොහෝ ස්ථානවල සිදුවුණේ. මිනිස්සු දුප්පත්කම, නරක් දේවල් කරන්න බැරිකම හා සමාජ විරෝධී ක්‍රියාවන් කරන්න බැරිකම නිසා තමයි අව්වට වේලි වේලි, වැස්සට තෙමී තෙමී මොනවා හරි දෙයක් විකුණලා කීයක් හරි හොයාගන්න පදික වෙළඳාම සිදුකරන්නේ. කවුරු මොන දේ ඉවත් කළත් ඒක ඒ පවුලේ උදවියට හා ඒ හා යැපෙන අනිත් පිරිසට යම් බලපෑමක් සිදුවෙනවා.

ගරු නගරාධිපතිතුමා, අපි කියන්නේ මේවා අයින් නොකරන්න නෙමෙයි. නමුත් ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න ක්‍රමවේදයක් අවශ්‍යයි. මක්නිසාද එම මිනිස්සු අනීතික වැඩ කරන්න අකමැති නිසා තමයි කැඳ ටිකක් විකුණ ගන්නේ, පළතුරු ටිකක් විකුණ ගන්නේ, කෑම ටිකක් හදලා විකුණ ගන්නේ. ඒනිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ප්‍රථමයෙන්ම මේ පදික වෙළඳුන් සඳහා යම්කිසි සහනදායී වැඩපිළිවෙලක් අනුගමනය කරන්න කියලා. ඒත් එක්කම අපි සමහර වෙලාවට දකිනවා, අපි දන්නේ නෑ කාගේ වුවමනාවට සිදුවෙනවද කියලා. මොරටුව පොලීසිය සමහර පුද්ගලයන්ගෙන් පන්න පන්න පලිගන්න ස්වභාවයක් අපි දකිනවා. ඒගැන පොලීසියෙන් විමසුවම කියන්නේ නගර සභාව තමයි කියන්නේ කරන්න කියලා. ඒ නිසා තමයි අපි මේක කරන්නේ කියලා. අපිත් නගර සභා සභිකයන් හැටියට අපි විශ්වාස කරනවා නගරය පිරිසිදුව තියෙන්න ඕනා කියලා. එහි කිසි ගැටලුවක් නෑ, තර්කයක් නෑ. නගර පිරිසිදු කරන්න ඔබතුමා සත්භාවයෙන් ගන්න ඕනෑම ක්‍රියාමාර්ගයකට අපි අත් දෙකම ඔසවනවා. නමුත් මේ නගරයේ පුරවැසියන්ම තමයි පදික වේදිකාවේ බිස්නස් එකක් කරලා කීයක් හරි හොයාගන්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ මිනිසුන් හටත් සාධාරණයක් ඉටුකරන්න කියලා. අනිත් කරුණ තමයි පොලීසියට උපදෙස් ලබාදෙන්න එක්කෙනෙක් දෙන්නෙක්ගේ පස්සේ පන්නන්නේ නැතුව සැමට නීතිය එකසේ ක්‍රියාත්මක කරන්න කියලා. ඔබතුමාගේ රජයේ ප්‍රධානතම පාඨයක් තමයි නීතිය සැමට උඩින් කියන එක. අපි ඒකට එකඟයි. අපි ඒකට අත් දෙකම ඔසවනවා. ඒනිසා නීතිය ක්‍රියාත්මක විය යුත්තේ කිසිවකු තලාපෙලන්නට නොව සමස්ථ ජනතාවට ප්‍රයෝජනවත් වන ආකාරයට. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මහජන නියෝජිතයන් හැටියට ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මක්නිසාද අපේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ම තම ජීවිකාව ගැටගසා ගැනීම සඳහා පදික වේදිකාවේ වෙළඳාම්වල නිරතවුණා. සමහර වෙලාවට මෙය ක්‍රියාත්මක වෙන ආකාරයට දැක්කම අපිට හිතෙනවා මේක දේශපාලන පලිගැනීමක්ද කියලත්. ඒ නිසා සැමට එක සේ නීතිය ක්‍රියාත්මක කරන්න. මේ පදික වේදිකාවල සිටින සැමටම තමන්ට ජීවත්වීමට පුළුවන් විදිහට සහනදායී වැඩපිළිවෙලක් ක්‍රියාත්කරන කරන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අදහස් ඉදිරිපත් කිරීමට කැමැතියි සුජීත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධවම. ඇත්තටම පදික වේදිකාව පිරිසිදු කරගන්න අවශ්‍යයි. නමුත් මමත් විශේෂයෙන් දකිනවා මොරටුව පොලීසිය විසින් වැරදි ක්‍රියාවක් කරනවා. සීමාවක් දාලා එම සීමාව තුළ වෙළඳාම් කිරීමට අවස්ථාව ලබාදිය යුතු තැනයි අපි ඉන්නේ. අපි කොච්චර මිනිස්සුන්ව පදික වේදිකාවෙන් ඉවත් කළත් ඔවුන්ගේ ජීවිකාව මෙයනේ. ඒනිසා කාණු මට්ටමේ ඉඳලා ඔවුන්ට වෙළඳාම් කිරීමට

අවස්ථාවක් ලබාදෙන්න කියලා ඉල්ලීමක් තියෙනවා. මම දැක්ක දෙයක් තමයි මීට දවස් තුනකට කලින් මොරටුවැල්ල ප්‍රදේශයේ ගමන් කරනවිට එක් පුද්ගලයෙක් මා හට කතාකරලා පෙන්නනවා මම ලීබඩු කෑලි ටික මෙතන තියන් විකුණනවා මට නඩු දානවා. අතන බලන්න, වාහන නවත්වලා තියෙනවා ඒවට කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැනේ කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපි මැදිහත් වෙලා පදික වෙළඳාම් කරන අයට යම් සහනයක් කිරීම අවශ්‍යයි. ඒ නිසා අදාළ ප්‍රදේශභාර ස්ථානාධිපතිවරු රැස්කරලා ඒ අයව දැනුවත් කරන්න යම් සීමාවක් පෙන්නලා ඒ තුළ වෙළඳාම් කිරීමට අවස්ථාව ලබාදෙන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ගිය සභා වාරයේදී මේ සම්බන්ධව සඳහන් කළා. මම රංග මන්ත්‍රීතුමාගේ අදහස පිලිගන්නවා. විශේෂයෙන්ම මොරටුව දකුණු කළාපයේ නව ගාලු පාර හැදුවේ ඒ අවට පදිංචි මිනිසුන්ගේ ඉඩම්වලින් කොටස් අත්පත්කරගෙන. ඒ හේතුවෙන් මිනිසුන්ගේ බිම් ප්‍රමාණය අඩුවීම නිසා තමන්ගේ ව්‍යාපාර කරගැනීමට ඇති ඉඩප්‍රස්ථාව අඩුවුණා. අපේ පාලනය කාලෙත් අපි නගරාධිවරයත් සමඟ රණ්ඩු කරලා ඒ මිනිස්සුන්ට අවස්ථාව ලබාදුන්නා. දකුණු කළාපේ පදික වේදිකාවේ සමහර තැන්වල අඩි 10 , 15 හා 20 තියෙන තැන් තියෙනවා. ඇත්තටම එය පදිකයන්ට ගමන් කිරීමට ප්‍රමාණවත් වැඩී. නමුත් කාණු සීමාවේ තමන් නිෂ්පාදනය කරන භාණ්ඩයක් අලෙවි කරගැනීමට අපි ඒ කාලේ හිටපු නිසි බලධාරින් සමඟ සාකච්ඡා කරලා අවස්ථාව ලබාදුන්නා. රංග මන්ත්‍රීතුමා කිව්වා වගේ පදික වේදිකාව අවහිර කරන්නේ නැතුව කාණු සීමාවේ වෙළඳාම් කිරීමට අවස්ථාව ලබාදෙමු කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කර්මාන්ත කමිටුවේ නොමැති කරුණක් සම්බන්ධයෙන් තමයි අපි මේ කතා කරමින් සිටින්නේ. නමුත් ඒ පිළිබඳවම සාකච්ඡා කිරීමට ගියහොත් කමිටුවට අදාළ නොමැති කරුණක් සම්බන්ධයෙන් ලොකු කාලයක් ගතවෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කිරීමට අවශ්‍ය නම් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළාට කමක් නෑ. ඉතිහාසය පුරා දුප්පත් මිනිසුන් මුහුණදෙන ගැටලුවක් නිසා. මෙහි දෙපැත්තම තියෙනවා. පදික වේදිකාව කියන්නේ පදිකයන්ට ගමන් කිරීමට වෙන්කර ඇති කොටස. නමුත් කාලයක් සමඟ තමන්ට අවශ්‍ය ආකාරයට මුළු පදික වේදිකාවම අත්පත් කරගත් තැන් හා ඔවුන්ගේ හැසිරීම් අපි හොඳට අත්වින්දා. ජීවත් වෙන්නත් ඕනේ අනතුරක් නොමැතිව පදිකයන් ගමන් කරන්නටත් ඕනා. ඒ නිසා ඔවුන්ට ජීවිකාව කරගැනීමට සුදුසු පොදු ස්ථානයක් හදලා දෙන්න පුළුවන් නම් එය තමයි හොඳම දෙය. නමුත් අපි එම ස්ථාන හදලා දුන්නත් වෙළඳාම් තිබුණේ පාරේ නිසා යන්නෙම පාරට. පදික වෙළඳාම ඉවත් කිරීම සම්බන්ධයෙන් අපිට විරුද්ධ වෙන්න බෑ. මේ සඳහා ආයතන ගණනාවක් සම්බන්ධවෙලා තියෙනවා. ඉන් එකක් තමයි ආර්.ඩී.ඒ.එක.එම ආයතනය තමයි ඒ සඳහා වගකියන්නේ. අනිත් පැත්තෙන් පොලීසිය. රජයේ ප්‍රතිපත්තියක් විදිහට මාර්ගවල තිබෙන අවහිර ඉවත් කරන විට එයට නගර සභාවේ කැමැත්ත අකමැත්ත අදාළ වෙන්නේ නෑ. මෙය යම් යම් කාල වලදි මතුවෙලා නැවත යටපත් වෙලා යනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් කලබලවෙලා, ගැටිලා වැඩක් නෑ. මෙය ලබාදිය යුතු කියා නීතියක් නැනේ අනුමත කරන්න බැනේ.මෙම ක්‍රියාවලිය යම් සිස්ටම් එකක් ඇතුළේ යනවා. අපි උත්සහ කරමු මේ සිස්ටම් එක වෙනස් කරලා ඔවුන්ගේ ජීවිකාව කරගැනීමට සුදුසු පරිසරයක්, සුදුසු ස්ථානයක් හදලා දෙන්න. ඒ හරහා මෙය අවසන් කරගන්න පුළුවන්. දිනපොළ ගත්තොත් අපට දිනපොලේ ඉඩකඩ තියෙනවා. නමුත් එහි අවස්ථාව ලබාදුන්නට දවස් දෙකයි ඉන්නේ වෙළඳාමක් නොමැති නිසා.

මහා නගර සභා මන්ත්‍රී -ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, මිනිස්සු ඇතුළට යන්නේ නැනේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එය තමයි මම සඳහන් කළේ. අපිට මේ වෙනුවෙන් කිරීමට තිබෙන්නේ ජනතාව වැඩි වශයෙන් ගැවසෙන පොදු ස්ථානයක් හදුනාගෙන උත්සව කාලෙදි ලබාදෙන්න අපට බලය තිබෙනවා. එහෙම නැතුව අපිට බෑනේ.

මහා නගර සභා මන්ත්‍රී -ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, අපි කියන්නේ නගර සභාව පැත්තෙන් කුමක් හෝ කන්ඩිෂන් එකක් දාලා මිනිස්සුට කීයක් හෝ හම්බකරගැනීමට පුළුවන් වාතාවරණයක් හදලා දෙන්න කියන එකයි.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
ගරු නගරාධිපතිතුමා, හැම තැනම පදික වේදිකාව අවහිර කරන එක කරන්න දෙන්න බෑ. නමුත් ඒ ඒ ප්‍රදේශයට අදාළ ව්‍යාපාරික ස්ථාන තිබෙනවා නම් ඒ වගේ අයට අවස්ථාව ලබාදුන්නට කමක් නෑ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙහිදි උපරිමයෙන් මාර්ගයට බාධාවක් නොවන ආකාරයට කටුයුතු කරන්න උත්සහ කරමු. අපි මේ සඳහා වෙනම සාකච්ඡාවක් අරගෙන කුමක් ද කරන්න පුළුවන් කියලා බලමු.

මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය
ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 12 සම්බන්ධයෙන් අදහස් කිහිපයක් දැක්වීමට කැමැතියි. ශ්‍රී බෝධිරුක්ඛාරාම පන්සල අසල සිට නිහාල් නෙල්සන් පටුමග දක්වා වූ කාණු පද්ධතියේ පවතින ගැටලු සම්බන්ධයෙන්. එම යෝජනාව මහජනතාව නිතරම සඳහන් කරන දෙයක්. මම හිතන්නේ නිතර එම කාණුවට කසළ දැමීමෙන් එය සුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධ ගැටලුවක් තමයි මූලික හේතුව වෙලා තිබෙන්නේ. මීට පෙර බෝධිරුක්ඛාරාම පාරේ තාප්පයක් කඩා වැටිලා එම ගෙදර ගෘහ මූලිකයා මරණයට පත්වුනෙත් ඔය මෙතුමා සඳහන් කරන හේතුව මත. ඒ ප්‍රදේශයේ ජනතාව ඉතා අපහසුතාවයකින් ජීවත් වෙනවා මෙම කාණු පද්ධතිය නිසා. ඒ සඳහා කුමක්ද කරන්න අවශ්‍ය කියලා එතුමාගේ යෝජනාවම සඳහන් වෙනවා කාණු කාණ්ඩායමක් යොදවලා ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළා නම් ගොඩක් දුරට එම ගැටලුව අවම කරගැනීමට පුළුවන් කියලා. එම යෝජනාව ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරලා තිබෙනවා එමගින් සඳහන් වෙන්නෙත් මෙම කාරණය තමයි.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,ඒ සඳහා සේවකයන්වම යොදවන්න ඕනා නේද? යන්ත්‍ර සූත්‍ර යොදවන්න බෑ නේද?

මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය
ගරු නගරාධිපතිතුමා, මරණ සිදුවුණු අවස්ථාවේ එම ගෙදර කාණුවේ තිබුණු කුණු වලින් අඩි 06ක් විතර පිරුණා. එය දැක්කම අපිත් අපහසුතාවයට පත්වුණා. එහි තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි අවට ජනතාව කුණු කසළ බැහැර කරන්නේ මෙම කාණු පද්ධතියට. එමනිසා ඇතිවන ගැටලු තමයි

තිබෙන්නේ. සතියකට එක දවසක් හරි කාණු කණ්ඩායමක් යොදවලා ක්‍රමවක් වැඩපිළිවෙලක් සකස් කළා නම් ඒ අවට තිබෙන කාණුවල ගැටලුව විසඳෙනවා. එම ප්‍රදේශය මහත් පීඩාවෙන් සිටිනවා. මම හිතන්නේ ඒ අවට ගෙවල් 18, 20ක් පමණ වර්ෂාවත් සමග යටවෙන තත්ත්වයක තිබෙනවා. එමනිසා ඔය ගැටලුවට එතුමා බලාපොරොත්තු විසඳුම මෙම කාණු පද්ධතිය පිරිසිදු කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කියන එක තමයි මාගේ හැඟීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(3) සම්බන්ධයෙන් අදහස් දැක්වීමට කැමතියි. මෙම යෝජනාව අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ 2025.08.12 වන දින. අපේ කොමසාරිස්තුමිය ගිය මාසයේ දුම්රිය දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කළා මේ සම්බන්ධව සාකච්ඡාවක් ඉල්ලලා. මීළඟ කමිටුවට ප්‍රගතිය දක්වන්න අවශ්‍ය නිසයි ලිපිය ඉදිරිපත් කළේ. තව සුමානයක් දෙකක් යනකොට කමිටුව පවත්වන දිනයත් එනවා. මාස 13ක් ගිහිල්ලත් මෙහි ප්‍රගතියක් මීළඟ කමිටුවට ඉදිරිපත් කරන්න බැරිවෙනවා කොමසාරිස්තුමිය යවපු ලිපියට පිලිතුරක් ලබාගන්න බැරිවුනොත්. එමනිසා මීළඟට තිබෙන කමිටුවට මේ පිළිබඳව හොඳ ප්‍රතිඵලයක් ලබාගැනීම සඳහා කඩිනමින් මේ සාකච්ඡාව රැස්කරගන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එම ලිපියේ පිටපතක් මරදානට අරගෙන ගියා නම් හරි. එයාලගේ අනුමැතියනේ අවශ්‍ය වන්නේ. ලක්ෂ 20ක් අපෙන් අයකරනවනේ. අපිට එම මුදල නවත්ත ගන්න පුළුවන් නම්. එයාලගෙන් අපට කිසිම උදව්වක් නෑ. එයාලා කරන්නේ රේල් පීලි දෙක ගලවා දෙන එක විතරයිනේ එයට ලක්ෂ 20ක්. අනිත් සියල්ලම අපි කරගන්න ඕනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම හෙට ගිහිල්ලා එම කටයුත්ත කරගන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(12) සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කිරීමට අවශ්‍යයි. අඟුලාන පොදු සුසාන භූමිය නිරීක්ෂණය කිරීම සඳහා ඔබතුමා ඊයේ පෙරේදා ගිය බව දැනගැනීමට ලැබුණා. එහිදි ඔබතුමාට දැකගැනීමට ලැබෙන්න ඇති මරණයක් තැන්පත් කරන්නේ කොහොමද, මනුෂ්‍යයෙක් අතක් පයක් සෝදා ගන්නේ කොහොමද කියලා. ඒවගේම ඔබතුමා රාත්‍රියක ගියානම් දැක ගැනීමට පුළුවන් එම ස්ථානය කොතරම් අන්ධකාරද කියලා. මම මේ ඉල්ලීම හරහා හැමදාම කතා කළේ මිනිස්සුන්ට පහසුකම් සැපයීම සම්බන්ධව. මේ සම්බන්ධයෙන් ගිය කමිටුවට කලින් කමිටුවේදි ඉංජිනේරුතුමාට සැලසුම් සකස් කරන්න කියලා සභාපතිතුමා පැවසුවා. අපි සැලසුම් සකස් කරලා ගිය කමිටුවට ඉදිරිපත් කරලා ඇස්තමේන්තු සකස් කරන්න ඉල්ලීමක් කළා. සභාපතිතුමා ප්‍රකාශ කරනවා ඇස්තමේන්තු හදන්න දෙන්න විදිහක් නෑ මුදල් නැති නිසා කියලා. කොච්චර අසාධාරණ කතාවක්ද. අඟුලාන ප්‍රදේශයේ ජනතාව බදු ගෙවනවා නගර සභාවට. ඔබතුමා මේ සම්බන්ධව උනන්දු වෙනවා. ඔබතුමා මට මීට පෙර පොරොන්දු වුණා ආදාහනාගාරය හදනවා කියලා. අඟුලාන පොදු සුසාන භූමිය සම්බන්ධයෙන් මේ අවුරුද්දේ කුමක් හෝ වැඩපිළිවෙලක් ආරම්භ කළ යුතුයි. මේ යෝජනාව මාස 13 ක් තිස්සේ කමිටු වාර්තාවේ තියෙනවා. මේක කරන්න බැරි නම් ඉවත් කරන්න ඕනේ. ඔබතුමාගේ සුවිශේෂී අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරන්න. අඟුලාන, ලක්ෂපතිය, උයන, කල්දෙමුල්ල ප්‍රදේශවල දුප්පත පිරිසක් ඉන්නේ. ඔවුන්ගේ හඬ මෙතන්ට ගේන්න බැරිනිසයි ඔවුන්ව නියෝජනය කරලා අපිව මෙතනට එවන්නේ. නමුත් ඒ ප්‍රදේශවලින් පත්වුණු කිසිම මන්ත්‍රීවරයෙක් මේ සම්බන්ධව කතා කරන්නේ නෑ. මේ පිළිබඳව

හැමදාම කතා කළේ මම. මේ සම්බන්ධයෙක් කතා කරන්න කරන්න මේ සම්බන්ධව හැමෝම නිහඬව ඉන්න නිසාද මන්දා ඔබතුමාලගේ අවධානය මේ සම්බන්ධයෙන් ගිලිහිලා තියෙන්නේ. එම ස්ථානයට හවසකට වැස්සකට ගියොත් ඉන්න තැනක් නෑ. ඔබතුමත් දකින්න ඇති කොහොමද එම ස්ථානයට ගිහිල්ලා ආදාහන කටයුත්තක් කරන්නේ කියලා. මේ සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02 (16) සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. මම මීට කලින් කතා කළා මෝයකට ළඟ අත්වැට සම්බන්ධයෙන්. අත්වැට සඳහා භාණ්ඩ ගෙනල්ලා දෙන්නේ මුදල් ගෙවීමෙන් අනතුරුව කියලා සඳහන් කරනවා. ඒ සඳහා වැඩපිළිවෙල කොහොමද කියලා මම දන්නේ නෑ. ඒ සඳහා මුදල් අනුමත වෙලා තියෙනවා. නමුත් ප්‍රථමයෙන් සැපයුම්කරුට මුදල් ගෙවිය යුතුයි කියලා සඳහන් කරනවා. එමනිසා එම මුදල කඩිනමින් ගෙවලා මේ ජනතාවට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එසේම එම මුදල් වලින් 10%ක වැඩිපුර මුදලක් තිබෙන නිසා එම මුදලින් එම ස්ථානයේ අඩුපාඩුව පවතින ලයිට් කණුවක් සිටුවා විදුලි බල්බයක් දාලා දෙන්න කියලා ඔබතුමාගෙන් දෙවැනි කරුණ යටතේ මම ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමා, උයන උතුර කළපුව මාර්ගයේ ඇති කුණු , පස් හා අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඔබතුමාලා පසුගිය කාලයේ ලොකු වෙහෙසක් දරලා ශ්‍රමදානයක් පවත්වලා උයන උතුර ප්‍රදේශයේ පිරිසිදු කිරීම් කළා. නමුත් කළපුව අයින දිගේ අපද්‍රව්‍ය ගොඩක් තියෙනවා. පස් තියෙනවා, ගෙවල් කඩපු කැලි දාලා තියෙනවා. මේවා කලින් තිබුනේ නෑ. මේ සෑම දෙයක්ම මිනිස්සු මැතකදි ගෙනැවිත් දාලා තියෙන්නේ. කළපුව අයිනේ පාර මුල චාල්ස් පෙදෙස ආරම්භ වන ස්ථානය අලි නාවන්න පුළුවන් වලවල් තියෙන්නේ. බයිසිකලයවත් යන්නත් බෑ පයින් යන්නත් බෑ. වැසි කාලයේදි වතුරේ බැහැලා තමයි යන්න වෙන්නේ. බැකෝ එකක් ගෙනල්ලා හරි ඒ පස් ටික තුනී කරලා දාලා මිනිස්සුන්ට ගමන් කරන්න පුළුවන් ආකාරයට එම පාර සකස් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒවගේම ඇවිදින මංතීරුව වටේ තිබෙන කුඹුක් ගස් ටික.ඒ සම්බන්ධයෙන් හැමදාම කතා කරනවා. යන්ත්‍රයක් හම්බවෙනකන් එය හදන්න බෑ කියලා සඳහන් කරනවා. නමුත් හෙට අනිද්දා සුළඟක් ඇවිල්ලා ගස් ටික වැටුණට පස්සේ හදලා වැඩකුත් නෑ. කොහොම වුනත් බාදනය වෙනවා.

ගරු නගරාධිපතිතුමා, ඒ සමඟම මතක් කරන්න ඕනේ කර්මාන්ත කමිටුව අවස්ථාවේදි දිරාපත් වුණ ගස් ටික 18 වෙනිදා මැනුම් කටයුතු සඳහා දාන්න ඔබතුමා සාකච්ඡා කළා. නමුත් ඒවා සිද්ධ වෙන්නේ නෑ. ගස් ටික තාම තියෙනවා. ගස් අතුත් එහෙන් මෙහෙන් දිරලා. මෙය සභාවට මුදල් ලැබෙන මාර්ගයක්. ඒ නිසා මේ සඳහා ටෙන්ඩරයක් කැඳවීමට අවශ්‍ය නම් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් සකස් කරලා, එසේ නැතිනම් කාගෙන් හෝ විකුණන් පුළුවන් ගාණක් විමසලා හා ඒ ගාණට ටෙන්ඩරයක් කැඳවලා හෝ මේ ගස්ටික ඉවත් කරලා සභාවට මුදල් ලැබෙන ක්‍රමවේදයක් සකස් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, පාලම සඳහා දිස්ත්‍රික් ප්‍රතිපාදන යටතේ මුදල් වෙන්කරලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට කළපුව අයිනේ සමහර පාරවල් තියෙනවා ගමන් කිරීමට නොහැකි මට්ටමට වලවල් සෑදුණු.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, සංවර්ධනය නොකරපු පාරවල්?

මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
ගරු නගරාධිපතිතුමා, කළපුව අයිනත් එක්ක තිබෙන කාපට් කර නොමැති මැටි පාරවල්. ඒ සඳහා ඔබතුමා පළාත් සභාවෙන් ඉල්ලීමක් කළානම් ප්ලේනර් එක දෙන්න කියලා ඒකෙන් පුළුවන් පාරවල් ටික ලෙවල් කර ගන්න. ලොකු මුදලක් සභාවට වැය වෙන්නෙත් නෑ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, පී.ආර්.ඩී.ඒ. එකේ තියෙනවද ?

මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
ගරු නගරාධිපතිතුමා, තියෙනවා. ජේ.සී.බී. යන්ත්‍රය වගේ යකඩ ප්ලේට් එක තියෙන එකක්. මම හිතන්නේ එයට ප්ලේනර් කියලා කියන්නේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව කතා කරලා බලමු.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා

22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කරුණු අංක 02(3), 02(4), 02(8), 02(10), 02(12), 02(16), 02(21), 02(27), 02(28), 02(34), 03, 04 හා 09 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.12 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය)

06(09)2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 11 සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහි සඳහන් වෙනවා ප්‍රධාන ගණකාධිකාරි විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම.2026 අගෝස්තු මස මුදල් කමිටුවේ නිර්දේශය සඳහා මේ සමඟ පහත දක්වා ඇති ඇමුණුම් ඉදිරිපත් කරමි කියලා, ඒ යටතේ ප්‍රධාන ආයුර්වේද නිලධාරිගේ ඉල්ලීම, සටහන් පත්‍රිකාව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ මිල දර්ශනය හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ මිල දර්ශනය අනුව සැකසූ ඖෂධ ඇණවුම යනුවෙන් සඳහන් කරලා තියෙනවා. ඇමුණුම 12, 13, 14 හා 15 කෙරෙහි අවධානය යොමු කළ විට, නගර සභාවෙන් පාලනය වන ආයුර්වේද 08ක් තියෙනවා. ඒ ආයුර්වේද 08 සඳහා තමයි ඇණවුම ඉදිරිපත් කරන්නේ. 03 වන කාර්තුව සඳහා අපි ඇණවුම ඉදිරිපත් කරන්නේ මිලියන 1.6ක්. එහි මිලියන 1.6ට සූරියප්පෙරුම ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමිය අත්සන් කරලා තියෙනවා, නමුත් ප්‍රධාන ගණකාධිකාරිතුමිය අනුමත කරලා නෑ. මෙහි අපේ ආයුර්වේදවල ඖෂධවලට දැනට තිබෙන ස්ටොක් එක කොපමණද, දැනට අපි ඇණවුම් කරන්නේ කොපමණ ප්‍රමාණයක් ද කියලා සඳහන් කරලා නෑ. නමුත් ඉල්ලන ප්‍රමාණය අනුමත කරනවා. ස්ටොක් එක තියෙනවද නැද්ද කියන එක සභාවේ දන්නේ නෑ . ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම හිතනවා ඉදිරියේදී මෙම ඇමුණුම සකස් කරන ක්‍රමවේදය වෙනස් කරලා ස්ටොක් එකත් ඒ කොලම් එකටම දාලා අවශ්‍ය කරන ප්‍රමාණය එවයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(2) සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි. එහි නිර්දේශය තියෙන්නේ උක්ත කරුණ සළකා බැලූ කමිටුවට, ප්‍රධාන නාගරික ගණකාධිකාරි වෙතින් මේ පිළිබඳව වාර්තාවක් (ඇමුණුම -01) ඉදිරිපත් වූ අතර, එම වාර්තාව අනුමත කිරීමට නිර්දේශ කරන ලදී යනුවෙන්. ඒ කියෙන්නේ මේ යෝජනාව ප්‍රතික්ෂේප කරලා තියෙනවා කියන එකනේ. නිර්දේශයේ ඒක පැහැදිලවම ලිව්වා නම් හරි. ඇමුණුම් අනුමත කරනවා කියලා නිර්දේශය දැම්මම මේක පිටපොට යනවා.

ගරු නගරාධිපතිතුමා කරුණු අංක 02(3) සඳහන් වෙනවා කමිටු සාමාජික, මහා නගර සභා මන්ත්‍රී, තුසිත් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම කියලා. එහි සඳහන් වෙනවා මෑතකදී සභාවේ විදුලි පරිපථය ජාතික සැපයුමට සම්බන්ධ කිරීමේදී වෘත්තිය සහය ලබාගත් විශේෂඥ විදුලි ඉංජිනේරු ඩයාන් ගුණවර්ධන මහතා සමඟ මේ සම්බන්ධව සාකච්ඡා

කළෙමු කියලා. එය සාකච්ඡා කළේ කමිටුව ද, නැත්තම් තුසිත් මන්ත්‍රීතුමාද කියලා දැන ගැනීමට කැමතියි.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, මෙය සාකච්ඡා කළේ තුසිත් මන්ත්‍රීතුමා.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, ඔබතුමයි කමිටු සභාපති.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, අපි කුමක් හෝ කාර්යයක් කරගත්තු දැනුම තියෙන, හැකියාව තියෙන අයෙකු ලෙස හඳුනාගත් කෙනෙකු සමඟ අපගේ ඊළඟ අවශ්‍යතාවය පිළිබඳව මන්ත්‍රීවරයෙකු විදිහට ඔහු තිබෙන වගකීම ඇතුළේ සාකච්ඡා කරලා එහි ප්‍රගතිය මුදල් කමිටුවට ගේන්න ඕනේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, මම තර්ක කරන්නේ නෑ එතුමා උගත් මන්ත්‍රීවරයෙක් නිසා. නමුත් එක් මන්ත්‍රීවරයෙක් සාකච්ඡාවක් පවත්වන එක නීත්‍යානුකූල නෑ. එහෙම නැත්තම් නිලධාරියෙක් සම්බන්ධ කරන්න ඕනා. එහෙම නැත්තම් කුමක් හෝ කමිටුවත් පත්කරන්න ඕනා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දන්න විශේෂ හැකියාවක් තියෙන කෙනෙක් ඉන්නවා. ඔබතුමා ඒ සම්බන්ධව කමිටුව ඉදිරිපත් කරනවා. නමුත් කමිටු ඒ පුද්ගලයව දන්නේ නෑ. ඒ අවස්ථාවේදි කමිටුව සිද්ධවෙනවා එම පුද්ගලයත් සමඟ සාකච්ඡා කරන්න. නමුත් මේ සඳහන් කරන මහත්මාව දන්නවා, මෙතුමා සභාවේ යම් මූලික වැඩකොටසක් කරපු කෙනෙක්.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, අපි තුසිත් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සඳහා ඉන්වෝල් වීම සම්බන්ධයෙන්. නමුත් මෙය තනිවම කරන එක ප්‍රායෝගික නැහැ කියන එකයි අපි කියන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 03(1) සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. එහි සඳහන් වෙනවා වරිපනම් අංක 25, 25/1/1 දරණ දේපල සඳහා කොට්ඨාශය භාර ආදායම් පරීක්ෂක විසින් තක්සේරු වටිනාකම් ලබාදී ඇති අතර විල්ලෝරාවත්ත බටහිර, බෝධිරාජ මාවත, වරිපනම් අංක 105/11 දරණ දේපළ සඳහා 2020 තක්සේරු ප්‍රතිශෝධනයේදී වාර්ෂික වටිනාකම් ලබාදී ඇත. මෙම දේපළ වල ලබාදී ඇති තක්සේරු වටිනාකම් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ද ඉදිරිපත් වී ඇති බැවින් ඒ අනුව ප්‍රධාන තක්සේරු නිලධාරි විසින් හා කොට්ඨාශය භාර ආදායම් පරීක්ෂක විසින් වාර්ෂික තක්සේරු වටිනාකම් ලබා දී ඇති දේපල සඳහා නැවත තක්සේරුවක්, තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් සිදුකරන්නේ ද යන්න පිළිබඳ සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා මුදල් කමිටුවට ඉදිරිපත් කරමි කියලා නාගරික ගණකාධිකාරිතුමිය විසින් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා නිර්දේශය දීලා තියෙනවා, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, ඉහත සඳහන් දේපල සඳහා නව තක්සේරුවක්, තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ලබාගැනීම අනුමත කිරීමට නිර්දේශ කරන ලදී කියලා. ගරු නගරාධිපතිතුමා, අපගේ ප්‍රධාන තක්සේරු නිලධාරි හා ආදායම් පරීක්ෂකවරු තක්සේරු කරන ලද ගොඩනැගිලි සහ දේපළ අති බහුතරයක් තියෙනවා. මේ කමිටු වාර්තාව ගත්තම ප්‍රධාන තක්සේරු නිලධාරිණිය විසින් ලක්ෂ ගාණක් තියෙනවා කපා හරින්න යෝජනා කරපු. සාමාන්‍යයෙන් කෙනෙක් පැමිණිල්ලක් කරපු සැනින් මුදල් කමිටුවට ඇවිල්ලා අපේ තක්සේරු

නිලධාරිව, ආදායම් පරීක්ෂක මහත්වරුන් විශ්වාස නැති නිසා තක්සේරු දෙපාර්තමේන්තුවට යවනවා මෙය තක්සේරු කරන්න කියලා. මම හිතන්නේ කොහොමත් තව අවුරුද්දකින් හෝ දෙකකින් නව තක්සේරුවක් ලබාගැනිමේ අවශ්‍යතාවයක් තියෙනවා. ඔබතුමා බජට් එකෙත් දාලා තිබුණා වගේ මා හට යාන්තමට මතකයි. මම අහන්නේ, මෙම දේපළ නැවත වතාවක් තක්සේරු කිරිමට අපි විසින් තක්සේරු දෙපාර්තමේන්තුවට මුදල් ගෙවන්න අවශ්‍යයි. මගේ පළමු තර්කය නම් මේකේ තක්සේරු වටිනාකම වෙනස් වුණේ නැත්නම් පෙත්සම දාපු පුද්ගලයාගෙන් සභාව දරණ ලද මුදල අයකරගන්නවාද? , එසේ නොමැතිනම් පසුගිය කාල සීමාවේ ප්‍රධාන තක්සේරු නිලධාරි විසින් සිදුකරන ලද සෑම තක්සේරුවකටම පෙත්සමක් ආවොත් මේ ඇක්ෂන් එකම ගන්නවද? මේවා ප්‍රායෝගික නෑ. ඒ නිසා මෙයට අඩුම තරමින් නාගරික කොමසාරිස්තුමියගේ ප්‍රධානත්වයෙන් හෝ කමිටුවක් පත්කරලා මේවගේ පෙත්සම් ආවම නගර සභාව තුළින්ම මේ පිළිබඳව සොයා බලලා විසඳගන්න ඕනේ. අපි සල්ලි ගෙවලා නැවත වරක් තක්සේරු දෙපාර්තමේන්තුව හරහා කරගන්න ගියහොත් මේක නවතින්නේ නෑ. මේකේ තක්සේරු වටිනාකම දිහා බැලුවම මේ හා සමාන සමහර ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම ගත්තම මෙම දේපළෙහි තක්සේරු වටිනාකමට වඩා අඩුයි. ඒවා මීට වඩා සුඛෝපභෝගි ගොඩනැගිලි. ඒ නිසා අපි කියන්නේ මේවා පෞද්ගලික පලිගැනීම් කරගන්නේ එපා කියලා.ඒ තුලින් සභාවට රුපියලක හෝ පාඩුවක් වෙනවා නම් අපි කතා කරන්නේ එතනදී. අපිට කමක් නෑ ඔබතුමාලා කැමති දෙයක් කරගන්න. නමුත් මේ තීන්දුව ප්‍රායෝගික නෑ. මේ සම්බන්ධව පෙත්සමක් නාගරික කොමසාරිස්තුමියට ආවම කොමසාරිස්තුමිය හරහා පරීක්ෂණයක් කරවන්න ඕනේ. මෙහි අවසානයේ කරන්න තියෙන දේ තමයි මුලින්ම කරලා තියෙන්නේ.ඒකයි අපේ තියෙන තර්කය. ජනතාවගේ මුදල් අපතේ යැවීම නිසා මේ සම්බන්ධව අපගේ දැඩි විරෝධය පළකරනවා. මේ වගේ පෙත්සම් ගොඩක් එයි. ඒවත් තක්සේරු දෙපාර්මේන්තුවට යවන්න වෙයි. ඒ සඳහා මුදලුත් ගෙවන්න වෙයි. එම මුදල් ගෙවන්නේ කවුරුන්ද කියන එක ගැන තීන්දුවක් ගන්නත් වෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න කැමතියි. මෙය ඉදිරිපත් කළේ කවුරුන්ද කියලා බලන්න. මෙම කාරණාව එන්න බලපාපු හේතුව හොයලා බලන්න. මටවත් මාලිමා ආණ්ඩුවටත් මෙහෙම දෙයක් කරන්න උවමනාවක් තිබුණේ නෑ. නම නොකියා යන්න හේතුවත් හොයලා බලන්න. මේක සමන්ලාල් මහත්මයාගේ බිල්ඩින් එකක්. මේ හැමෝම එකිනෙකාට හොරා මොකක්දෝ මන්දා කරගෙන යනවා. අපිට තිබෙන්නේ එහි නීත්‍යානුකූලභාවය හෝ නීත්‍යානුකූලනොවන භාවය පිළිබඳ යම් පරීක්ෂණයක් පවත්වන්න. ඒ අවස්ථාවේදි තක්සේරු නිලධාරිතුමිය සඳහන් කළේ අවශ්‍ය නම් නව තක්සේරුවක් කරන්න කියලා. අපි මේක ගෙනාපු එකකුත් නෙමෙයි, ඉල්ලපු එකකුත් නෙමෙයි. කවුරුහරි පුද්ගලයෙක් මීට විරුද්ධව දාපු පැමිණිල්ලක්. එම පුද්ගලයා සුදු ද කළු ද කියලාවත් මම දන්නේ නෑ. මෙම පුද්ගලයා මම හිතන පුද්ගලයා නම් නිතරම අපටත් කරදර කරන කෙනෙක්. දිගින් දිගටම මෙවැනි දේවල් කරගෙන යනවා. එම පුද්ගලයා පැමිණිල්ල ඉදිරිපත් කළාම මුදල් කමිටුවට එනවා. මම කියන්නේ අපටත් නොතේරෙන මේවා අතර එකිනෙක අන්තර් සම්බන්ධයක් තියෙනවා. ඒ වෙනුවෙන් සමහර අය පෙනී සිටිනවා. මොරටුවේ ජනතාව තමන්ගේ දේපළ සඳහා වරිපනම් අංකයක් ගන්න විශාල කරදරවලට මුහුණ දෙනවා. අංක ගොඩක් තියෙනවා, ඒවා සංසදනයත් කරනවා. මේ කිසිදෙයක් නිශාන්තවත් මාළිමාවවත් කරපු දේවල් නෙමෙයි. ඇයි මේ ඉක්මන් වෙන්නේ, කලබල වෙන්නේ. ජනතාවගේ මුදල් වැයවෙනවා නම් අපි ඒකට එකඟ නෑ. ලබන අවුරුද්දේ තක්සේරුව එනවා. ඒ තක්සේරුව කරමු. මම කියන්නේ කලබල වෙන්න එපා. අපි කිසිවිටකත් දේශපාලන පලිගැනීම් කරන්නේ නෑ. පුළුවන් හොයලා කියන්න අපි ඉල්ලීම් කරලා මෙම කරුණ මුදල් කමිටුවට ආවා

කියලා. එහෙම නෑ. සමන්ලාල් මහත්මයා හරි කවුරුහරි වැරදි කරලා තියෙනවා නම්, ඒ වරදට අදාළ නීත්‍යානුකූල පියවර ගත යුතුයි කියන තැන අපි හැමෝම ඉන්නවා. මෙම කටයුත්ත සිදුවෙච්ච ආකාරය තමයි මම මේ පැහැදිලි කළේ. මමත් බැලුවා කොහොමද මෙවැනි ටිකක් මුදල් කමිටුවට ආවේ කියලා. ඉතිහාසයේ විශාල වැහිච්ච සම්බන්ධකම් ජාල තියෙනවා. මේවට මුල්වෙච්ච අය ඉන්නවා. මේ අයගේ හිත් ඇතුලේ යම් යම් ප්‍රශ්ණ තියෙනවා. මම කියන්නේ මේවා එකකට එකක් සත්‍ය, අවංක දේවල් නෙමෙයි. සභව ගත්තු දේවලුත් එක්ක තියෙන්නේ. අපිට කියන්න තියෙන්නේ නිවැරදි තක්සේරුවක් ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපිට තියෙන්නේ ඔබතුමා මුදල් කමිටුව අප වෙත එව්වට පසුව මුදල් කමිටුවේ තිබෙන අයිතමයන් කියවගෙන යනවිට අපිට පැන නගින ගැටලු ටික සාකච්ඡා කරන එක. අපිට ඉන් එහාට දෙයක් නෑ. ඔබතුමා එය වෙනත් විදිහට අර්ථනිරූපනය කරනවා නම්, අපි දන්නේ නෑ කොහොමද එම කරුණ මෙතනට ආවේ කියලා. අපි නෙමෙයි මෙම මෙම කරුණ ඉදිරිපත් කරලා තියෙන්නේ නාගරික ගණකාධිකාරිතුමිය. ගරු නගරාධිපතිතුමනි, අංක 03(03) 2020 තක්සේරු ප්‍රතිශෝධනයේදී 141/6 සහ 141/6/A වරිපනම් අංක ලබාදී ඇති බව ස්ථාන පරීක්ෂාවේදී තක්සේරු නිලධාරිනි හඳුනාගෙන ඇත. 2020/01 සිට 2026/04 කාර්තුව දක්වා පිළිවෙලින් රු.10,409.25 ක සහ 56,849.00 ක මුදල කපා හැරීම සඳහා මුදල් කමිටු නිර්දේශය හා සභා අනුමැතියට දාලා තියෙනවා අපි කියන්නේ මේ කපා හරින්න දාන ඒවා ගැන ඔබතුමා මීට වඩා මුදල් කමිටුවේ දී බලන්න. මොකද හේතුව, මේ ඇවිල්ලා සභාවේ මුදල්. මේ කපා හරින්නේ සමහර වෙලාවට මේවා කපා හරින්නේ ඇයි කියලා හිතගන්න බැහැ අපිට සමහර වෙලාවට මේ තියෙන තත්ත්වයන් උඩ. මේවා මේ සමහර වෙලාවට නිලධාරීන්ගේ වැරදි අඩුපාඩු නිසා සමස්ථ ජනතාවටම මේ බර උහුලන්න වෙලා තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේක පොඩ්ඩක් කියවපුවාම තේරෙනවා පැහැදිලි මේ පිලිබඳව සැකයක් දෙගිඩියාවක් තියෙනවානම් සභාවේ ඕනෑම මන්ත්‍රීවරයෙකුට පුලුවන් අදාළ ලිපි ගොනුවත් අරගෙන අදාළ ස්ථානයට ගිහිල්ලා බලන්න. වරිපනම් අංක 141/5 සහ 141/5/A සඳහා වේ. ඊළඟට කියනවා 141/5, 141/5/A, 141/6 සහ 141/6/A යනු එකම දේපල බැවින් මේක කියන්නේ තක්සේරු නිලධාරීතුමිය එකම දේපළ බැවින් දැන් අපිට පුලුවන් බලන්න ගිහිල්ලා මේ අංක 04න්ම එකම දේපළද මේ කියන්නේ කියලා හොයලා බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියපු එක හරි. එහෙම ගිහිල්ලා අපිට තක්සේරු නිලධාරිනිය ළඟට ගිහිල්ලා බලන්න බැහැ ෆයිල් එක. අපිට කොමසාරිස්තුමිය ළඟට ගිහිල්ලා තමයි බලන්න පුලුවන් ෆයිල් එක. හැබැයි ඔබතුමා දන්නවා පහුගිය කාලේ ඇති වුණ යම් ප්‍රශ්ණයක් නිසා මට දාලා තියෙනවා ඡෝදනාවක්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මා ළඟට එන්න. මගේ ළඟට ඇවිල්ලා ෆයිල් ඒක ගෙනෙල්ලා දෙන්න කියන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට බොහෝම ස්තූතියි ඒ මැදිහත් වීම සම්බන්ධයෙන්. අපි ඊළඟ දවසේ එහෙම කරමු. ගරු නගරාධිපතිතුමනි, 03(04) ඒකේ තියෙන්නේ මේක අද ඊයේ වෙච්ච දෙයක් නෙවෙයි. ඉඩම, මහ වීදිය, වරිපනම් අංක: 112D දරණ දේපල ලේඛනයෙන් සම්පූර්ණයෙන් (ලේඛනගත කල දා සිට) කපා හරින ලෙස ප්‍රධාන තක්සේරු නිලධාරි විසින් ලබාදුන් නිර්දේශය මත මොරටුව මහා නගර සභාව 2024.11.29 කළමනාකරණ කමිටු වාර්තාව මොරටුව මහා නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීගේ ඒ කියන්නේ කොමසාරිස්වරිය. 2024.11.29 දින අනුමැතිය පරිදි කපා හරින ලදී. ඒ කියන්නේ මේක 2024 කපා හැරලා තියෙන්නේ. හැබැයි මේක අයින් කරලා නැහැ පරිගණකයෙන් දැන් ඒ වැරැද්ද කරන්නේ කවුද අපිද? මිනිස්සුද? ඔබතුමාලා වත්කම් හැටියට ගණන් ගන්නකොට මේවත් එක්ක ගණන් ගැනෙන්නේ. මේ බජට් එක සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවානේ මේ හේතුව නිසා. මේවා මේ පොඩි වැරදි නෙවෙයි. ඒ වරද කිසිම දඩුවමක් නැහැ ඇයි වරද වුණේ කියලා හොයන්නෙත් නැහැ හැමදාම මේකට එවනවා මේකෙන් කපා හරින්න. මේකට මොකක්හරි ඉවරයක් තියෙන්න ඕන. මේක හැමදාම පරිගණකයෙන් කපා හරින්න, කපා හරින්න කියලා එවනවා. හැබැයි ඔබතුමන්ලා බජට් එක හදනකොට අවුළුද්දේ මුල දැන් මේ අවුරුද්දේ බජට් එක හදනකොට හදන්නේ ඔය ඔක්කෝමත් එක්ක. එතකොට බජට් එක සම්පූර්ණයෙන්ම බොරුවක් වෙනවානේ මේවා එනකොට. මම කියන්නේ මීට වඩා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා. මේ එන එන එක කපා හරින එක නෙවෙයි මුදල් කමිටුව කරන්න ඕන. මේවා එන්නේ ඇයි කියලා හොයන්න ඕන. ඇයි මේකට හේතුව කියලා හොයන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, 03(06) කරුණ එහි තියෙන්නේ මෙම දේපල ලේඛනයෙන් ඉවත් වුවද පරිගණකයේ තව දුරටත් පවතින අතර මේක කතා කරලා වැඩක් නැහැ. එකම දේ තමයි කියන්න තියෙන්නේ. අංක 04 කරුණ මේක ඉතාම වැදගත්. මම දන්නේ නැහැ මේකේ ප්‍රින්ටින් වල වරදක් තියෙනවාද කියලා. ඇමුණුම් අංක 03 කියලා තියෙන තැන ඒකේ එන්න ඕන ඇමුණුම් අංක 04. මොකද දන්නවාද 04 තියෙන විස්තරය තමයි ඇමුණුම් අංක 03 කියලා මෙතැන ඇතුලත් වෙලා තියෙන්නේ. ඇමුණුම් අංක 04 තියෙන්නේ තවද මේ සම්බන්ධයෙන් ගිණුම් කාරක සභාවෙහි දිගින් දිගට සාකච්ඡාවට ලක්වන කරුණක් බැවින්, දෙපාර්ශවයේම එකඟත්වය මත අදාළ හිඟ සේවා ගාස්තු වාරික වශයෙන් ගෙවීම් කිරීමට කඩිනමින් කටයුතු කරන ලෙස දන්වා සිටීමු කියලා තියෙනවා. ඒ නිසා මේක සංශෝධනය කරන්න. ඇමුණුම් අංක 04 කියන තැන ඇමුණුම් අංක 03 වෙන්න ඕන. මේකේ අපි මිලියන 31.4 ක් අපි ගෙවන්න තියෙනවා කරදියාන කසළ අංගනයට. මම අහන්නේ කරදියාන කසළ අංගනයට ගෙවන්න තියෙන මේ මුදල කොයි කාලේ එකක්ද? ඔබතුමන්ලාගේ කාලේ එකක්ද නැතිනම් ඊට කලින් ආව එකක්ද? කොහොමද මේක එකතු වුණේ? මිලියන 31 යි කියන්නේ ලක්ෂ 314ක්.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔය සමන්ලාල් හිටපු නගරාධිපතිතුමාගේ කාලේ එකක්.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, ඒ කාලේ ඉදලාම එනවා මේක. අපිට ඕන මොන කාල සීමාවද කියලා දැනගන්න. අනෙක් එක තමයි ඔබතුමා කියලා තියෙනවා ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡාවක් ඉල්ලලා තියෙනවා කියලා. ලක්ෂ 314ක් ගෙව්වොත් එහෙම නගර සභාව හාන්සියි.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, සමහර පුද්ගලයින්ගේ හිතුවක්කාරකම්, වැරදි මම කියන්නේ ඒක තනි පුද්ගලයෙක්ගේ නෙවෙයි ඒ අදාළ කසළ කළමනාකරණ ඒකකයත් මේකට වග කියන්න ඕන. ගිවිසුම් ගියානම් ගිවිසුම් වල වගන්ති තියෙනවානම් ඒ වගන්ති වලට අනුව අයකර ගන්නවා වෙනුවට දිගින් දිගටම කුණු දාන්න දීලා තියෙනවා එහෙම අයකර ගැනීමකින් තොරව. මොන මොනවාහරි කතා එක්ක ගිහිල්ලා අවසානයේ ඒවා බ්‍රේක් වුණා හිඟය ඉතුරු වුණා. මේ හිඟය දැන් ගෙවන්න ඕන අපි නගර සභාව විදියට.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, අංක 05 කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා ඒකේ සැපයුම්කරුවෙකු ලියාපදිංචි කරවීම කියලා අනුමැතියට දානවා කියලා ඉදිරිපත් කරලා තියෙනවා. සැපයුම්කතරුවෙකු ලියාපදිංචි කරන්නේ මොනවා සඳහා ද කියන එක පිළිබඳව නැහැ ඒකේ, ඉල්ලීමෙත් නැහැ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේක පැහැදිලි නැහැ සැපයුම්කරුවෙක් ලියාපදිංචි කරනවා කිවුවාම මොනවාහරි ක්ෂේත්‍රයක් තියෙනවානේ.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, කාටද ඒකට උත්තර දෙන්න පුලුවන්. අපි දන්නේ නැහැනේ ඊට පස්සේ මොනවා සපයයි ද කියලා. ගොඩනැඟිලි ද්‍රව්‍ය සඳහා සැපයුම්කරුවන්ට ලියාපදිංචි වෙන්න පුලුවන්.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, අංක 06 කරුණ සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා වැන් එක නවත්තලා තියෙනවා අපේ ඉල්ලීමට හරි ඔබතුමා කල්පනා කරලා හරි මේ වෙලාවේ අත්‍යාවශතාවය තියෙන වාහන ගන්න කතා කරලා තියෙනවා ඒක හොඳයි හොඳ තීන්දුවක් ඒ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා. ගල් රෝල ගන්න කෝටියක් වියදම් කරනවා නේද නගරාධිපතිතුමා. එතකොට අපි මේකට වෙන් කරලා තියෙන්නෙත් ලක්ෂ 100යි. එතකොට මේකට වෙන තැනකින් සල්ලි ගන්නවාද කොහොමද කරන්නේ මේකට සල්ලි වෙන්කරලා නැහැනේ. වාහන කල් බදු ක්‍රමයට ගන්න අපි 50%ක් ගෙවන්න ඕන. අපි ලක්ෂ ගාණක් වියදම් කරලා තියෙන්නේ ගල් රෝල ගන්න.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, එක්කෝ මේක මුදල් කමිටුවට ඇවිල්ලා ඒ වෙලාවට සම්බන්ධ වෙන්න ඔබතුමා මුදල් කමිටුවේ ඉන්නවා.

සභා සෝෂා

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, නාගරික ගණකාධිකාරී ඉදිරිපත් කරලා තියෙනවා දිගරොල්ල දිනපොළ US – 09 කඩ කාමරය සඳහා හිඟව පවතින කඩ කුලී කපා හැරීම ඉතින් මේවා ප්‍රශ්ණ නෙවෙයිද? මෙයා කියනවා කරන්ට්, ලයිට් නැහැයි කියලා කියන්නේ අවුරුද්දකට පස්සේ. ගරු නගරාධිපතිතුමා දොර අරින්න බැහැයි කියන්නේ අවුරුද්දකට පස්සේ. මේ මනුස්සයා කලුයිද සුදුයිද කියන්න මම

දන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමා මේ කරන්නේ විපක්ෂයේ කෙනෙක් හැටියට හරි දේ. ඔබතුමා හරි දේ කරලා තියෙනවානම් ඔබතුමාට ප්‍රශ්ණයක් නැහැ. මම අහන්නේ මේ මනුස්සයා දැන් මේ අවුරුද්දකට පස්සේ ඉල්ලන්නේ කඩේ දොර කැඩිලා කියන්න. මේ මනුස්සයා අවුරුද්දක් මොනවාද කළේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඒ මනුස්සයාව සාකච්ඡාවකට ගෙන්නුවා එහිදී දිගීන් දිගටම මේ සම්බන්ධව කිවුවා මෙහෙම කඩේ දීලා තියෙනවා වතුරත් නැහැ ලයිටුත් නැහැ කියලා. ඔය කඩ එක එක නම් වලින් දීලා තිබුණේ. ඔය කඩ දීපු විදිය කියන්න ගියොත් එහෙම විශාල කාලයක් යනවා. ඔබතුමා ඔෆිස් එකකුත් දාගෙන හිටියා ඔය එක කඩයක් උඩ. දැන් එයාට ලයිට් වතුර අරගෙන දුන්නා. දැන් එහෙම අරගෙන දුන්නාට වැඩක් නැහැ දොර අරින්න වහන්න බැහැ.

සභා සෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මෙතන කතා කරන්නේ මාසේ අන්තිමට ලැබෙන මේ ලියවිල්ල පදනම් කරගෙන. ඔබතුමා හිතේ තියාගෙන ඉන්න දේ අපි දන්නේ නැහැ. ඔබතුමාගෙන් අහන්නේ ඔබතුමානේ මුලසුනේ ඉන්නේ. මේකේ අපි නොදන්න දෙයක් මිනිස්සු අපෙන් ප්‍රශ්ණ කරන දෙයක් අපි අහන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ වගකීම ඒක. ගරු නගරාධිපතිතුමනි, අංක 21 කරුණ සාහිත්‍යාංජලී මේකේ ඉදිරිපත් කරලා තියෙනවා ඇස්තමේන්තුවක් 2,754,400 ක ඇස්තමේන්තුව ඉදිරිපත් කළේ කවුද? මේකේ කෝ අත්සනක් මේ ඇස්තමේන්තුව ඉදිරිපත් කරපු කෙනාගේ. මේක නිකන්ම නිකන් කොලයක්. මේක නිත්‍යානුකූල ලියවිල්ලක් නෙවෙයි. මේ ඇස්තමේන්තුව පිළිගන්න බැහැ. මේක හදපු කෙනෙක් අත්සන් කරන්න එපැයි. අනෙක් එක තමයි 2,754,400 යි මේකෙම තියෙනවා සභාවෙන් දෙන්නේ ලක්ෂ 10යි. ඉතුරු ටික සුභ පතන්නන්ගෙන් සහ අනුග්‍රාහකයන්ගෙන් හොයාගන්නේ කියලා. දැන් අපි ඔබතුමාගෙන් අහන්නේ ඔබතුමන්ලා දූෂණ විරෝධී පනත ගැන හොඳටම දන්නවා. ඒ පනතට අනුව කාගෙන්හරි අනුග්‍රාහකයෙක්ගෙන් හරි සල්ලි අරගෙන මෙහෙම කරන්න පුලුවන්ද? අපි අහන්නේ ඒකයි. එහෙම කරන්න බැහැ. ඒවා කරපු ගමන්ම ඒක දූෂණයක් හැටියට නීතිය ඉදිරියට යනවා. ඒ නිසා මේ ඉන්න නිලධාරීන්ව මේ ඉන්න මන්ත්‍රීවරුන්ව අමාරුවේ දාන්නේ නැතුව කරන්න පුලුවන් දෙයක් ලක්ෂ 10න්ද, ලක්ෂ 10න් කරන්නත එහෙම නැත්නම් මේක අත්සන් කරන්න කියලා වගකීම ගන්න කියලා ලක්ෂ 27ම සභාවෙන් දෙන්න. මේ අහිංසකයොන්ව අමාරුවේ දාන්න එපා. ඒ නිසා මේ ඇස්තමේන්තුව නීත්‍යානුකූල ලියවිල්ලක් විදියට සභාවට පිලිගන්න බැහැ. ඔබතුමන්ලා පිලිගන්න සූදානම් නම් පිලිගන්න නමුත් මෙහි නීත්‍යානුකූලභාවයක් නැහැ.

ගරු නගරාධිපතිතුමනි, මාර්ග තලනය මිලදී ගැනීම සම්බන්ධයෙන් ඒකට ලක්ෂ 100ක් යනවා වැට එකත් එක්ක. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විනිවිද භාවයෙන් යුතු වාර්තාවක් මෙහි නැහැ. ඒක නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අනෙක් එක තමයි ගරු නගරාධිපති කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සළකා බැලීම. නගරාධිපති අරමුදල් ව්‍යවස්ථාවේ කරුණු අංක 07 සංශෝධනය කිරීම. මේ නගරාධිපති අරමුදල සම්බන්ධයෙන් අපිට තොරතුරක් දැනගන්න විදියකුත් නැහැ, ඇහුවාම කියන්නෙත් නැහැ ඒ සම්බන්ධයෙන් හැබැයි මේකේ ඕන ඕන විදියට මේ තියෙන ව්‍යවස්ථා වෙනස් කරනවා. ඒ නිසා ඔබතුමා අමතක කරන්න එපා අද අපේ මේ මන්ත්‍රීවරු ටික නැඟිටලා ගියා, ඒ නැගිටලා ගියෙත් ඔබතුමාට අපි මනුස්සකම තිබ්බ නිසා. නැත්නම් ඒ පැත්තේ 25යි මේ පැත්තේ 26යි උදේ හිටියේ. අපිට එහෙම අවශ්‍යතාවයක් නැහැ ඔබතුමාව අපහසුතාවයට පත්කරන්න.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, නගරාධිපති අරමුදලේ ගැටලුවක් ආවා ආගමික කටයුතු වලදි වියදම් දැරීම පිළිබඳව තියෙන වගන්තිය. මොකද ආගමික කටයුතු වලට වියදම් දරන්නේ මේ නගරාධිපති අරමුදලින්, එහෙම වියදම් දරන්න පුලුවන් නමුත් ඒකේ තිබුණ පොඩි ගැටලුව ඒක වෙනස් කරලා ආගමික කටයුතු වලට වියදම් කරන්න පුලුවන් විදියට සකස් කර ගත්තා. ඒක වෙන මොකක්වත් නෙවෙයි ආගමික කටයුතු වලට වියදම් දරන්න තියෙන අවස්ථාවක්. ඔබතුමා ඒ නගරාධිපති අරමුදල පිළිබඳව ප්‍රශ්ණාවලියක් දාන්න නගරාධිපති බැදිලා ඉන්නවා ඒ සම්බන්ධව කියන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, නගරාධිපති අරමුදල ගන්නකොට රු. 2500යි තිබුණේ කිවුවානේ. අපිට තියෙන ගැටලුව ඊළඟට නගරාධිපති අරමුදලට කවුද සල්ලි දුන්නේ? කොහොමද සල්ලි ආවේ? කොහොමද සල්ලි වියදම් කළේ? ඇයි මේක 2500ක් වුණේ? සමන්ලාල් නගරාධිපතිතුමා යනකොට කීයක් තිබුණද මේකේ? ඉතින් ඒ විස්තර ටික අපිට දැනගන්න විදියක් නැහැ.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනගන්න පුලුවන්. නගරාධිපති අරමුදල කියන්නේ හැංගි හොරා පවත්වාගෙන යායුතු එකක් නෙවෙයි. ඒකත් මහජනයාගේ මුදල්. අපි ඒ වියදම් කරන විදිය ගැන දැනගන්න ඕන සභාව.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, මේක අපි ඔබතුමාට හොඳට අවධාරණය කරනවා අපි මේවා හොඳට කියවලා බලලා මේ එන්නේ කවුරුවත් අපහසුතාවයට පත් කරන්න නෙවෙයි. මේවායේ තියෙන තොරතුරු විනිවිදභාවයෙන් යුක්තව අපි දැනගත්තේ නැත්නම් කවදාහරි දවසක මේවාට උත්තර දෙන්නත් අපි බැදිලා ඉන්න වෙනවා. දැන් අර ජේනවානේ ඔබතුමාලා නොදැනුවත්ව ඔබතුමන්ලා ගත්ත මුදලක් ගෙවුවා කියලත් ඔබතුමාලා කියනවා හැබැයි ස්වචාර්ජ් එක තවම තියෙනවා. ඉතින් ඒ වගේ මේ හැම මන්ත්‍රීවරයාටම තියෙන මේ හැමදේම නිවැරදි කරගෙන යන්න ඉස්සරහාට. ඒකෙදි ඔබතුමාට යම් කැපකිරීමක් කරන්න වෙනවා අපිට ඒ උත්තර දෙන්න එතැනට නිහතමානී වෙන්න.

මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා

ගරු නගරාධිපතිතුමනි, සුජීත් මන්ත්‍රීතුමා සාහිත්‍යාංජලී සම්බන්ධයෙන් කතා කළා. එතුමාගෙ අදහසට මම ගරු කරනවා. නමුත් මේ යෝජනාව මගේ යෝජනාවක්. මේ වැඩසටහන හැදීමේදීත් සැලකිය යුතු දායකත්වයක් මම දැක්වුවා. එතුමා මතු කරන කාරණාව එතුමාට මත් කරන්න පුලුවන්. මේකට අපි සභාවේ මුදල් කොටසකුයි ඊට අමතරව ඊට පරිබාහිර මුදල සොයා ගැනීම සඳහා එදා එතැන යෝජනා වුණේ අනුග්‍රාකත්වයෙන් ගන්න. එතකොට ඒක වැරදිනම් ගරු නගරාධිපතිතුමනි, කතා කරන මමත් ඕගොල්ලොත් එක්ක කොහේහරි යන්න තියෙනවානම් ඒ අභියෝගය මමත් භාර ගන්නවා මම ඒවාට බයත් නැහැ. මොකද හේතුව මේවගේ වැඩ නෙවෙයි මම දේශපාලනය කරන්නේ පුද්ගලික සතුරුකම් මත නෙවෙයි. මට සතුරු අවස්ථා ගොඩක් නිර්මාණය වුණා. හැබැයි අතිශය පෞද්ගලික කාරණා සම්බන්ධයෙනුත් එහෙම වුණා. හැබැයි එහෙම කියලා ඒක මම පෞද්ගලික වෛරයක්, පලිගැනීමක් ලෙස භාරගන්නේ නැහැ. ඒක ඒ මගේ

තියෙන වැරැද්දක් හරි අඩුපාඩුවක් හරි හොඳ දෙයක් හරි වෙන්න පුලුවන්. තමුන්නාන්සේලා යම් කිසි හොඳ දෙයක් කරනවානම් ඒ හොඳ දෙයට හොඳයි කියන්නත් වැරදි දෙයට වැරදි කියන්නත් මගේ කිසිදු පැකිලීමක් නැහැ. මේ යෝජනාව මම ඉදිරිපත් කළේ මම සාමාන්‍යයෙන් කලාව, සාහිත්‍ය සම්බන්ධයෙන් යම් රුචිකත්වයක් ඒ සම්බන්ධයෙන් යම් හැදෑරීමක් අවබෝධයක් මට තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, ඒක කලින් අපේ සභාවේ ලක්ෂ 10ක් වෙන් කරගෙන සම්ප්‍රදායිකව මේ කාරණාව සාහිත්‍යාංජලී කරගෙන ගියා. හැබැයි සභාවේ එක් මුදල් කොටසක් අපේ පාසල් වල දරුවන්ගේ සාහිත්‍ය තරඟ වලට යොමු කරලා ඒගොල්ලන්ට තෑගි ප්‍රධානය කිරීම සඳහා වියදම් කළා. තව කොටසක් අපේ සභාවේ ඇතුලේ ඉන්න හැකියාවන් තියෙන නිර්මාණශීලි සේවක සේවිකාවන්ගේ නිර්මාණ එළඳක්වන්න කටයුතු කළා. හැබැයි මම දැක්කා මේක සිද්ධ වුණේ එක රාමුවක් යටතේ. ඒ නිසයි මම යෝජනා කළේ දවස් 03ක් වගේ කාලයක් අරගෙන මොරටුවේ ජනතාවටත් දරුවන්ටත් සහභාගී වෙන්න පුලුවන් යම් කිසි අධ්‍යාපනික සහ නිර්මාණාත්මක හැකියාවන් එළිදක්වන්න පුලුවන් විදියේ යෝජනාවක් තමයි මම කලේ. ගරු නගරාධිපතිතුමනි, මිනිසෙකු සම්පූර්ණ වෙන්න ලිප් ගල් 03ක් ඕන කියලා මම අහලා තියෙනවා. ඒ තමයි අධ්‍යාපනය, ක්‍රීඩාව, සෞන්දර්යය කියලා. මේ කටයුත්ත සඳහා මම ඉදිරිපත් කළේ මේ කාරණාවට අන්න ඒ සත්භාවයෙන් එතකොට මෙවැනි කාරණා සම්බන්ධයෙන් මහා නගර සභාව මේ විදියට කටයුතු කරන්න පුලුවන්ද බැරිද කියන එක ගැන අපි මේකේ ඉතිහාසයක් පහුකළා. මමත් අවුරුදු 22ක් මේකේ මන්ත්‍රීවරයෙක් විදියට හිටියා. මීට කලින් මේකේ බොහෝ දේවල් කළා කානිවල් පවා කළා මේ විදියට අරමුදල් අරගෙන. වෙසක් කලාප පොසොන් කලාප ගොඩක් කළා. මම ඒ කරපු කිසි දෙයකට විරුද්ධ නැහැ. ඒ සියල්ල අපිත් සම්බන්ධ වෙලා අපිත් පක්ෂව කළේ. එතකොට ඒ අර්ථයෙන් තමයි මොරටුවේ දරුවන් වෙනුවෙන් ජනතාව වෙනුවෙන් මොරටුව මහා නගර සභාව ඒක ජාතික ජනබලවේගයට හෝ ඔබතුමාට හෝ ඔබතුමාගේ කණ්ඩායමට එළිය වෙනවාද කියන එක මට අදාළ නැහැ. මට සභාවක් විදියට මොරටුව මහා නගර සභාව මේ මොරටුව ඇතුලේ විතරක් නෙවෙයි රට තුළ කතා බහට ලක්වෙන්න පුලුවන් විදියේ ප්‍රතිරූපයක් හැදෙනවානම් ඒ සම්බන්ධයෙන් නිරාමිසව සතුටු වෙනවා මට ඔය පුටුවේ ඉන්නේ සමන්ලාල් ද, නිශාන්ති ප්‍රදිනාන්දු ද, සුජිත් පුෂ්පකුමාර ද වෙන කවුද කියලා අදාළ නැහැ. මගේ යම් කිසි යෝජනාවක් පිළිගත්තානම් මම ඒ වෙනුවෙන් පෙනි සිටිනවා මම ඒ වෙනුවෙන් ඉන්නේ සත්භාවයෙන්. ගරු නගරාධිපතිතුමනි, මේ කරුණ සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කරන්න සූදානම් නම් මම කියලා තියෙන්නේ මට පුලුවන් සම්පූර්ණ සහාය මම දෙනවා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා

12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	තුසිත් ද සිල්වා මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් 2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(03), 02(04), 02(11), 02(15), 02(16), 02(18), 19(03), 19(05), 20, 22, 24, 30, 32 හා 34 යන කමිටු නිර්දේශයන්ට පක්ෂවත්වත්, අංක 02(01), 03(01), 04, 05, 09, 19(01), 19(02), 19(04), 19(06), 19(07), 21, 23, 25 හා 26 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටී අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් සඳහා විපක්ෂවත් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සජිත් දුමින්ද පීරිස් මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසිනා බක්කර් මහත්මිය
5.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
6.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරයා 2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(03), 02(04), 02(11), 02(15), 02(16), 02(18), 19(03), 19(05), 20, 21, 22, 24, 30, 32 හා 34 යන කමිටු නිර්දේශයන්ට පක්ෂවත්වත්, අංක 02(01), 03(01), 04, 05, 09, 19(01), 19(02), 19(04), 19(06), 19(07), 21, 23, 25 හා 26 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටී අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් සඳහා විපක්ෂවත් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.08.13 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිලිණි නෙත්සරණි මෙනෙවිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u>

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 2026.08.13 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 14 යටතේ 2026 අගෝස්තු මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 18 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

08. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත

09. <u>වෙනත් කරුණු</u> - නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2026.09.01 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.